## 2018. 06. 05 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති

## මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය (-

☞ ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා — ගරු සභාපති
☞ කමල් වැල්ලගේ මහතා — ගරු උප සභාපති
☞ ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා — ගරු නගර සභා මන්ත්‍රී
☞ ග්‍රේෂන් කෙරමිණියගේ මහතා — ගරු නගර සභා මන්ත්‍රී
☞ ඒ. ඩබ්. ජගත් කුමාර මහතා — ගරු නගර සභා මන්ත්‍රී
☞ ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය — ගරු නගර සභා මන්ත්‍රී
☞ දිනයාදූර ධර්මදාස මහතා — ගරු නගර සභා මන්ත්‍රී
☞ නන්දන රාජපක්ෂ මහතා — ගරු නගර සභා මන්ත්‍රී
☞ ලලිත් ධම්මික කොඩිකාර මහතා — ගරු නගර සභා මන්ත්‍රී
☞ ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මහතා — ගරු නගර සභා මන්ත්‍රී
☞ ඩෙනට් පනියන්දුවගේ මහතා — ගරු නගර සභා මන්ත්‍රී
☞ මගගේ අතුල ප්‍රියන්ත මහතා — ගරු නගර සභා මන්ත්‍රී
☞ ඩබ්. ඒ. සෝභිත රංජිත් මහතා — ගරු නගර සභා මන්ත්‍රී
☞ ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය — ගරු නගර සභා මන්ත්‍රී
☞ ජී. ජී. ආර්. පේෂලා කුමාරි මහත්මිය — ගරු නගර සභා මන්ත්‍රී
☞ එච්. ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය — ගරු නගර සභා මන්ත්‍රී
☞ එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා — ගරු නගර සභා මන්ත්‍රී
☞ ඩබ්. එම්. නිලානි මෙනවිය — ගරු නගර සභා මන්ත්‍රී
☞ ධනසේන මාදුවගේ මහතා — ගරු නගර සභා මන්ත්‍රී
☞ කේ. ජී. පී. දයානන්ද මහතා — ගරු නගර සභා මන්ත්‍රී
☞ එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා — ගරු නගර සභා මන්ත්‍රී

☸ පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. **09.30** ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී ☸

**(01)**

**01:01** **2018 – 05 – 01 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

2018 – 05 – 01 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2018- 05- 01 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>සංශෝධන 01</u>**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන</u>**

19 පිටුවෙහි මාගේ කතාවෙහි පර්චස් එක රු. 50000/- යන්න රු. 5000000/- ලෙස සංශෝධනය විය යුතුයි.

45 පිටුවෙහි මාගේ කතාවෙහි පසුගිය දවසක ක්‍රීඩා අමාත්‍යතුමා ලෙස සටහන් වීම ක්‍රීඩා අධ්‍යක්ෂතුමා ලෙස නිවැරදි විය යුතුයි.

**(02)** සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන නැත

**(03)** ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03:01** “ 1988 අංක 74 දරණ පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම ” මැයෙන් දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් 2018-05-08 දාතමින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

1988 අංක 74 දරණ පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අනුව සියළු පළාත් පාලන ආයතනවල සභිකවරුන් තම වත්කම් හා බැරකම් ප්‍රකාශ සෑම වර්ෂයකම මාර්තු 31 දිනට අදාළව ජූනි 30 දිනට පෙර ඉදිරිපත් කල යුතු බවත් ඒ අනුව විධිමත්ව සම්පූර්ණ කරන ලද වත්කම් හා බැරකම් ප්‍රකාශ කවරයක බහා මුද්‍රා තබා ගරු නගරාධිපති / ගරු සභාපති විසින් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙතටත්, ගරු නියෝජ්‍ය නගරාධිපති/ ගරු උප සභාපති ඇතුළු අනෙකුත් ගරු මන්ත්‍රීවරුන් පළාත් පාලන කොමසාරිස් වෙතටත් ඉදිරිපත් කල යුතු බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ මෙම ලිපිය ගරු මන්ත්‍රීවරුන්ගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

**3:2** “ අවබෝධයකින් යුතුව විදුලිය පරිහරණයට අවතීර්ණ වීම පිළිබඳ පුහුණු පාඨමාලාව 2018- ජුනි මස 16 දින ” මැයෙන් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ අංශ ප්‍රධානිතුමා (විදුලි/විද්‍යුත් ඉංජිනේරු අංශය) විසින් 20118-05-10 දාතමින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

විදුලිය පරිහරණයේදී දැනගත යුතු මූලික කරුණු හා මූලධර්මයන් පිළිබඳ පාඨමාලාවක් අප ආයතනය මගින් පවත්වන බවත් ඒ සඳහා එක් අයෙකුගෙන් රු. 6000/- ක මුදලක් අය කරනු ලබන බවත් සහභාගී කරවීමට අපේක්ෂා කරන පුද්ගලයන්ගේ අයදුම්පත් ඉක්මනින් ආයතනය වෙත යොමු කරන ලෙසත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ විදුලි කාර්මික එරික් ප්‍රසන්න මහතා මෙම පාඨමාලාව සඳහා යොමු කිරීමටත් ඊට අදාල ගාස්තුව වන රු.6000/- මුදල ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය වෙත ගෙවීම සිදු කිරීමටත් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .

**3:3** “ සංචාරක සත්කාරක සේවා සංවර්ධනය සඳහා ත්‍රෛමාසික හෝටල් පුහුණු පාඨමාලා පැවැත්වීම ” මැයෙන් රුහුණු සංචාරක කාර්යාංශයේ සභාපතිතුමා විසින් එවන ලද 2018-05-04 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙම පාඨමාලා පැවැත්වීම සඳහා මේ වන විට ප්‍රමාණවත් අයදුම්පත් ලැබී නොමැති බවත් පාඨමාලා සඳහා ප්‍රමාණවත් අයදුම්පත් ප්‍රමාණයක් ඔබ පළාත් පාලන බල ප්‍රෙද්ශයෙන් ලබා දෙන්නේ නම් මෙම පාඨමාලා අදාල බල ප්‍රෙද්ශය තුල පැවැත්විය හැකි බවත් මෙමගින් රැකියා විරහිත ග්‍රාමීය තරුණ තරුණියන්ට සංචාරක ක්ෂේත්‍රෙය් රැකියා සඳහා යොමු කිරීමට හැකි බවත් මේ පිලිබඳව ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කර මේ සඳහා හැකි තරම් තරුණ තරුණියන් යොමු කිරීමට කටයුතු කරන ලෙසත් දන්වා තිබුණි.

<u>**තීරණය**</u>

☞ මෙම ලිපිය ගරු සභාවේ දැනගැනීම සඳහාත්, අයදුම්පත් අවශ්‍ය ගරු මන්ත්‍රීවරුන් විසින් අයදුම්පත් ලබා ගැනීම සඳහා කටයුතු කරන ලෙසටත් තීරණය කරන ලදී.

**03:04** විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ‘ පොදු වෙළඳ පොල - උඩු මහල අංක 06 කඩ කාමරය’ ලිපි ගොනුව සභාගත කරන ලදී.

වැල්ලබඩ - මාදම්පාගම, අංක 102/2 හි පදිංචි ආර්.එම්.ඒ.එස්. වික්‍රමසිංහ මහත්මිය විසින් පොදු වෙළඳ පොල උඩු මහලේ අංක 06 කඩ කාමරය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

ඒ අනුව ආදායම් පරීක්ෂක මහතා විසින් පොදු වෙළඳ පොල උඩු මහලේ අංක 06 කඩ කාමරය මීට පෙර අවස්ථා දෙකකදී ටෙන්ඩර් කැඳවන ලද බවත් ඒ අවස්ථා දෙකේදීම කඩ කාමරය බදු දීමට නොහැකි වූ අතර පෙර අවස්ථාවේ අවම මාසික කුළිය රු.3440/- ක් වූ බවත් ඒ අනුව ප්‍රසම්පාදන දැන්වීම් පල කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි අද අම්බලන්ගොඩ නගරයේ කඩ කාමරයක මුදල දවසකට 1000 කට එහා පැත්තෙ වෙනවා. ඒ නිසා මේ මුදලට වඩා වැඩියෙන් දෙන්න පුළුවන් මීට වඩා දැන්වීම් ප්‍රසිද්ධ කරොත්. එනිසා ප්‍රසිද්ධ ස්ථාන වල දැන්වීම් පල කරල කටයුතු කරන්න.

**තීරණය**

☞ පොදු වෙළඳ පොල උඩු මහලේ අංක 06 කඩ කාමරය සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව මහජනතාව වැඩි වශයෙන් ගැවසෙන ස්ථාන වල ප්‍රසම්පාදන දැන්වීම් පල කිරීම මගින් මහජනතාව දැනුවත් කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**3:5** ' ආධාර කැටයක් ඇල්ලීමට අවසර ලබා ගැනීම සඳහා ' මැයෙන් අම්බලන්ගොඩ මෝදර දේවාල කමිටුවේ ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

74 වන වරටත් මෝදර දේවාලයේ මහා පෙරහැර පැවැත්වෙන බවත් ඒ සඳහා විශාල මුදලක් වැයවන බැවින් ප්‍රධාන බස් නැවතුම්පොලේ ආධාර කැටයක් ඇල්ලීම මගින් ආධාර එකතු කිරීම සඳහා අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ මෝදර දේවාලයේ මහා පෙරහැර සඳහා විශාල මුදලක් වැයවන බැවින් ප්‍රධාන බස් නැවතුම්පොලේ ආධාර කැටයක් ඇල්ලීම මගින් ආධාර එකතු කිරීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධයක් නොමැති වූ බැවින් ඒ සඳහා **සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**03:06** ' ප්‍රදර්ශන පුවරුවක් එල්ලීමට අවසර ලබා ගැනීම ' මැයෙන් අම්බලන්ගොඩ මෝදර දේවාල කමිටුවේ ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත **කරන ලදී.**

74 වන වරටත් මෝදර දේවාලයේ මහා පෙරහැර පැවැත්වෙන බවත් ඊට අදාල ප්‍රදර්ශන පුවරුවක් ප්‍රධාන බස් නැවතුම්පොළ ඉදිරිපිට මුදල් අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

සභාපතිතුමනි මෝදර දේවාලයේ ප්‍රදර්ශන පුවරුවක් ඔබතුමා කඩා ඉවත් කරා කියල අපිට ලියුමක් ඇවිත් තිබුණා. මේකට අවසර දීලනම් ඇයි කඩා ඉවත් කරේ.

**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ ලිපියෙන් ඉල්ලල තිබෙන්නෙ ප්‍රදර්ශන පුවරුවක් බස් නැවතුම්පොල ඉදිරිපිට ප්‍රදර්ශනය කිරීම සඳහා අවසරය. ඒ අපි දැන්වීම් පල කරන්න වෙන් කරපු ස්ථානය. එතුමා ඉල්ලපු තැන අපි ලබා දෙන්න කැමතියි.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

සභාපතිතුමනි මෝදර දේවාලයේ පෙරහැර අපි දන්න කාලෙ අවු 40 ක් විතර පවත්වගෙන යන එකක්. මමත් අවු. 13 ක් විතර මේ නගර සභාවේ හිටියා. එතකොටත් ඔය නාම පුවරුව ඔය කඩාපු ස්ථානයේ තිබුණා. මේ පෙරහැර මීට පෙරත් අපිත් සහයෝගය දීල කරපු දෙයක්. ඒ නිසා මේ බෝඩ් එක නැවත සවි කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඔබතුමා මේ ගැන ඇහුම්කන් දීල වැඩ කරන්න කියල ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමා මෙතනදි වැරදි මතයක් ප්‍රකාශ කරා. ඒක ඉල්ලා අස්කරගන්න. ඔබතුමත් මෙතන උප සභාපතිවරයා වශයෙන් හිටියා. එවිට අපි මෙම ස්ථානයේ දැන්වීම් පල කරන්න දුන්නෙ නැහැ. සභාව විසින් බස් නැවතුම්පොලේ ඕනෑම දැන්වීම් පුවරු පල කිරීම සුදුසුයි කියල යෝජනා කරනව නම් මම දෙන්න සූදානම්. හැබැයි හැමෝටම එක තීරණයක් වෙන්න ඕනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේක තිබුණෙ ඇතුලත නෙමෙයි. බස් නැවතුම්පොලේ දෙන්න ඕන්නෑ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි තරුණ බෞද්ධ සංගමයේ දැන්වීම් පුවරු දෙක තිබුණෙත් ඔය ඔබතුමා කියන බස් නැවතුම්පොළ තුල නෙමෙයි. සේමගේ ගොඩනැගිල්ල තියන තැන ලයිට් කණුවෙ තමයි මේක තිබුණෙ. අපි ඔබතුමාගෙ ප්‍රකාශයට විරුද්ධයි. මෝදර දේවාලෙ කටවුට් එක තිබුණෙත් ඔතන. ඔබතුමාට නගර සභාවෙ සභාපති විදියට තනියෙන් මෙවැනි තීන්දු ගන්න ඉඩ තියන්න බැහැ.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම තනියෙන් ගත්ත තීන්දු නෙමෙයි. සභාව විසින් ගත්ත තීන්දුව තමයි මම ක්‍රියාත්මක කරන්නෙ. ඒකයි කිව්වෙ සභාව විසින් බස් නැවතුම්පොලේ සවි කරන්න අවසර දෙනවනම් මම දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

අපි බස් ස්ටෑන්ඩ් එක තුල කිසිදු දැන්වීමක් ගහන්න ඉඩ දෙන්නෙ නැහැ. හැබැයි බස් ස්ටෑන්ඩ් එක තුල නෙමෙයි. ඔබතුමා වරද්ද ගන්න එපා. මේක තිබුනෙත් ඇතුලත නෙමෙයි. එළියෙ. එහෙමනම් ගෙන්නන්න කපපු කට්ටිය.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙතන කපපු කට්ටිය ඉන්නවා. ආදායම් පරීක්ෂක මහත්තය කොතනද මේක තිබුනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ඉතිං කොහොමද මේක ඇතුලෙ තිබුනයි කියන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

ආදායම් පරීක්ෂක මහත්තය ඔබතුමා හිතන්න එපා අපිත් මේ නගර සභාවෙ හිටපු අය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මේ කණුව බස් ස්ටෑන්ඩ් එක ඇතුලෙ තියෙන්නෙ. මෙතන වාද කරල වැඩක් නැහැ. මේක දිය යුතු බව වෙනම කතාවක්. එහෙම නම් සභාව තීරනය කරන්න ඕන ඒ කොටස බැහැර කරල කටයුතු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා එහෙම කියන්න එපා. එහෙම නම් බස් නැවතුම්පොලට යන තැන්වල කඩ ගහපුව කොහොමද තියෙන ආකාරය. ඒව නීතියෙන් අනුමත කරලද තියෙන්නෙ. මේක පොදු කටයුත්තක්. අවු 40 ක් විතර ඔතන ඔය බෝඩ් එක ගහනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

නගර සභාවට අයිති වෙන්න පුළුවන් ලයිට් කණුව තියෙන තැන. ඒත් මේ බෝඩ් එකෙන් කිසි කෙනෙකුට කරදරයක් නැහැ. මේකෙන් පැහැදිලි වෙනවා අම්බලන්ගොඩ නගර සභාව අම්බලන්ගොඩ සංස්කෘතිය, වටිනාකම්, පෙරහැරවල්, තොරණ් කරනු ලබන සංගම් වලට විරුද්ධයි කියන බව මේකෙන් පැහැදිලි වෙනවා. ඒ තැන් බස් එකකටවත් අවහිර නොවෙන තැන්. ඒ තැන්වල මුදලක් අය කරල ප්‍රදර්ශනය කරන්න ඉඩ දෙන්න. අම්බලන්ගොඩ දේවල් වෙන තැනක ගිහිල්ල ප්‍රදර්ශනය කරන්නද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි මේ තීරණය ගත්තෙ හැමෝම සාකච්ඡා කරල. මේව ගලවන්න ඕනෙ කියල මුලින්ම කිව්වෙ ඩෙනට් මන්ත්‍රීතුමා. දැන් අපි මෙතන වාද විවාද කර ගන්න වැඩක් නැහැ. මමත් එගක වුනා අවලස්සන කරන්න බැහැයි කියලා. විශේෂ අවස්ථාවක එතන දෙන්න කියල කියනවනම් අපි සාකච්ඡා කරල දෙමු.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීවරුන්ට මම දන්වා සිටිනවා එක කරුණක් සම්බන්ධයෙන් එක් අවස්ථාවක් පමණයි කතා කරන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මෙතන බස් නැවතුම්පොලේ දැන්වීම් දැමීම අවලස්සන දෙයක්. මගේ අදහස ඔතන එක් අයෙකුට දුන්නොත් හැමෝටම දෙන්න වෙනවා. එනිසා ඔතන නොදෙන එක තමයි වඩා හොඳ කියන එකයි මගේ නම් අදහස.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය කතා කරමින්**</u>

සභාපතිතුමනි ඔබතුමා මේ දේවාල භූමිය ඔය තත්වයට පත් කරල දෙන්න අපි කලින් ඉන්න කාලය තුල යම් ක්‍රියාමාර්ගයක් ගත්තා. ඔබතුමා එතරම් උතුම් කාර්යක් කරල මේ කරන ක්‍රියාව තුලින් නරක නාමයක් එනවා. අපේ නගරයේ තියෙන බෞද්ධ කටයුත්තක් වෙනුවෙන් නගරයට පැමිණෙන ජනතාවගෙන් ආර්ථික වාසියක් අපිට වෙනවා. ඒවගේම අම්බලන්ගොඩ නගරයේ කලාකාමී කටයුත්තක් කෙරෙන එවැනි අවස්ථාවක එවැනි බැනර් එකක් ප්‍රදර්ශනය කිරීමට ඉඩ දෙන්නෙ නැත්නම් ඒක අපේ ලොකු අඩුවක්. අනිත් ඒව ගොඩක් දුරට වෙළඳ දැන්වීම්. ඒ නිසා ඔබතුමා මේ ගැන අවධානය යොමු කරන්න. අපි මේ සඳහා අනුග්‍රහය ලබා දෙන්නෙ නැත්නම් අපි අම්බලන්ගොඩ නගරයේ මන්ත්‍රීවරු වශයෙන් කරන ලොකු අඩුපාඩුවක්. මම දැකල තියෙනවා ආයතනවල බැනර් ගහල තියෙනවා.

<u>**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

වාදයක් අවශ්‍ය නැහැ. බස් නැවතුම්පොලේ දැන්වීම් ප්‍රදර්ශනයට මන්ත්‍රීවරුන්ගෙ කැමැත්ත අකමැත්ත ප්‍රකාශ කරන්න. ඔබතුමාල කියනව නම් බස් නැවතුම්පොලේ දැන්වීම් පුවරු පල කරන්න දෙන්න කියල මම දෙන්නම්. මම මේ ක්‍රියාත්මක කරල තියෙන්නෙ මගේ පෞද්ගලික තීන්දුවක් නෙමෙයි. මේ සභාවෙන් ගත්ත තීන්දුව මා විසින් ක්‍රියාත්මක කරනවා. තමුන්නාන්සේලා එහෙම දීල මම ක්‍රියාත්මක කරන කොට කියනව මෙතන බෞද්ධකම නෑ අරක මේක කියල. ඒ නිසා මට කියන්න තියෙන්නෙ එකදෙයයි. ඔබතුමාල කියපු දේ තමයි මම කරල තියෙන්නෙ. ඒ නිසා ඒ කියපු දේවල් ජනප්‍රියතාවෙ තියාගන්න වෙනස් නොකර මෙතනදි කෙලින්ම කියන්න ක්‍රියාත්මක කරන්න ඕනදේ.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි අපි ඉතාමත් කණගාටු වෙනවා අවු 13 ක් මේ සභාව නියෝජනය කරපු රාහුල මන්ත්‍රීතුමාගෙ කතාව සම්බන්ධව. එතුමාත් මීට පෙර ඔය ස්ථානය දැන්වීම් පල කිරීමට නුසුදුසු යි කියන මතයෙ හිටියෙ. දැන් එතුමා කුමන න්‍යායපත්‍රයකට කටයුතු කරනවද කියල මට හිතාගන්න බැහැ. ඒවගේම ඩෙනට් මන්ත්‍රීතුමා ප්‍රකාශ කරා අපි බෞද්ධ සංගම් වලට ,පෙරහැර කටයුතු වලට සහ පන්සල් වලට තිබෙන ඒ ගෞරවය නැති කරනව කියලා. එනිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා එතුමාගෙන් ඒක ඉල්ලා අස්කර ගන්න කියලා. ඒවගේ ප්‍රකාශයක් කිරීම අම්බලන්ගොඩ වගේ නගරයකට කරන අගෞරවයක්. අපි මේ නගරයේ සියළුම බෞද්ධ කටයුතු වෙනුවෙන් මම හිතන්නෙ

ගියවර සභාවෙත් විශාල කොටසක් නිදහස්කරා මේ බෞද්ධ කටයුතු වෙනුවෙන්. මෝදර දේවාල භූමිය පවා ඔය තත්වයට පත් කරේ සභාපතිතුමා ප්‍රමුඛව අම්බලන්ගොඩ නගර සභාව විසින්. එනිසා හරි කණගාටුයි එතුමා කල ප්‍රකාශය ගැන. මම එය ඉල්ලා අස්කර ගන්න කියල ඉල්ලා සිටිනවා. මමත් අවු. 15 ක් විතර මේ සභාවෙ ඉන්නවා. අපි මෙතෙක් කල් නගරයේ තියෙන හැම කටයුත්තකටම සහයෝගය දීල තියෙනවා. හැබැයි බස් ස්ටෑන්ඩ් එකේ අපි කිසිම බැනර් එකක් දාන්න දුන්නෙ නැහැ. ඔය ස්ථානයෙත් දාන්න දුන්නෙ නැහැ. කවුරුහරි කියනවනම් ඔතන බස් ස්ටෑන්ඩ් එකට අයිති නැහැ කියල. ඔතන අයිති කොටසක්. ඔතන තමයි අපේ ත්‍රීවීල් පාර්ක් එකත් තිබුනෙ. ඒක අයින් කරල තමයි ඔය ලොතරැයි කූඩු තියල තියෙන්නෙ. ඒනිසා එතන අයිති නෑ කියන එක කාටවත් කියන්න බැහැ. ඒක කට්ටියත් එක්ක කතා කරල දෙන එක වෙනම දෙයක්. හැබැයි මෙතන තර්ක විතර්ක කරල අම්බලන්ගොඩ නගර සභාව හැල්ලුවට ලක් කරන්න එපා ගරු මන්ත්‍රීවරුනි. අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමයෙ ගියවර සභාවෙ වෙසක් පිංකම වෙනුවෙන් ඉල්ලපු සියල්ල නිදහස් කරා. ඒවගේම එතන ඒ ගොඩනැගිල්ල හදන්න භූමිය දුන්නෙ නගර සභාව. බෞද්ධ නගරෙ. එහෙම කරල තියෙද්දි මේවගේ කතා කරන එක වැරදියි සභාපතිතුමනි. අම්බලන්ගොඩ නගරයට කරන අගෞරවයක්. පසුගිය වෙසක් තොරණ වෙලාවෙ තරුණ බෞද්ධ සංගමයෙන් බේරුවල මුස්ලිම් අය ගෙන්නල කඩ ගැහුව. අම්බලන්ගොඩ නගර සභාවට කියල රු.40000/- ඒව ගන්න කොට ඒව හොද වැඩද? ගරු මන්ත්‍රීවරු ඔක්කොම අත්සන් කරා. මම අත්සන් කරේ නැහැ. මට දුරකථනයෙන් කතා කරල මේ ගැන කිව්වහම මම කිව්ව සභාපතිතුමා අත්සන් කරොත් මම අත්සන් කරනව කියලා. මම කණගාටු වෙනවා මේ දේවල් සම්බන්ධයෙන්. අන්තිමට රු. 40000/- ගත්තෙ නගර සභාවෙන් කියලයි ගියේ. ලසන්ත මන්ත්‍රීතුමා ගිහිල්ල ඇහුවහම කිව්වලු නගර සභාවට සල්ලි දීලයි කියල කඩ ගැහුවෙ. මේවගෙන් අපියි හැල්ලුවට ලක් වෙන්නෙ. එනිසා මම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින්නෙ මේ වගේ ලියුමක් ලියාගෙන ආවහම මගේ හිතට එකගව මම අත්සන් කරේ නැහැ. අපි මේ සභාවෙ තීන්දුවක් ගත්තනම් මට එහෙම කාටවත් වාසිවෙන දේකට එකග වෙන්න බැහැ. මේ නගරෙ මිනිස්සු අපිව පත් කරල එවල තියෙන්නෙ. එක එක සමිති වලට ඕන විදියට මේ සභාව පාලනය කරන්න බැහැ. මම ඉල්ලා සිටින්නෙ මේ වගේ තත්ව වලට යන්න එපා. ඇත්තටම මම කණගාටු වෙනවා හිටපු උප සභාපති රාහුල මහත්මය මේ විදියට කතා කිරීම සම්බන්ධව. බස් නැවතුම්පොලේ රයිනෝ ආයතනයේ දැන්වීම් පල කර තියෙන්නෙ ඒඅය අපේ බස් නැවතුම්පොල වසර දෙකකට වරක් පින්තාරු කරනවා. ගිවිසුම් ගතවෙලා තියෙන්නෙ. ඉතින් ඔබතුමා සියළු දේ දැනගෙන මේ විදියට කතා කිරීම නගරයට සහ නගර සභාවට කරන අගෞරවයක් ඇත්තටම. ඒවගේම ඩෙනට් මන්ත්‍රීතුමා පැවසුව අවු 60 ක් තියෙන සංස්කෘතිය නැති කරනවයි කියල කරපු ප්‍රකාශය ඉල්ලා අස්කර ගන්නයි කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමා මේවට අපට පිළිතුරු දෙන්න ඕනෙ.

<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඔබතුමාට එක අවස්ථාවක් දුන්නා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

සභාපතිතුමා මම කියන්න කැමතියි අපේ උප සභාපතිතුමා කියූ අදහසට උත්තරයක් වශයෙන් අපි මේ නගර සභාවෙ මන්ත්‍රීවරුන් වශයෙන් අම්බලන්ගොඩ නගර සභාව කිසිම වෙලාවක හැල්ලුවට ලක් කරන්න කිසිම වෙලාවක සූදානමක් නැහැ. හැබැයි මම ඉල්ලීමක් කරනව අපේ ඩෙනට් පනියන්දුවගේ මහත්මය කතා කරේ මෝදර දේවාලය, තරුණ බෞද්ධ සමිතිය අපි ඔක්කොම බෞද්ධාගම් කාරයො. බේරුවල අය ඇවිල්ල මෙහේ බිස්නස් කරනවයි කිව්වට අපිට මේ කුලවාදෙ ජාතිවාදෙ ආගම්වාදෙ නැහැ. නමුත් මම ඉල්ලීමක් කරනව අපි මන්ත්‍රීවරු වශයෙන් මේ මෝදර දේවාලෙ පෙරහැරට අපි හැමෝම උදව් කරන්න ඕනෙ. ඒවගේම තරුණ බෞද්ධ සංගමයෙන් තොරණක් ගැහුවහම ඒකට උදව් කරන්න ඕනෙ. ඒවගේම සියළු බෞද්ධ කටයුතු වලට අපි උදව් කරන්න ඕනෙ. වෙනත් ප්‍රචාරණ කටයුතු වලට දෙන්නෙ නැතුව ප්‍රධාන බෞද්ධ කටයුතු වලට විතරක් මෝදර දේවාලෙ පෙරහැරට, තරුණ බෞද්ධ සංගමයෙ වැඩ කටයුතු වලට, මහා විහාරයේ පෙරහැරට ඒවගේ විශේෂ බෞද්ධ කටයුතු වලට විතරක් කට්ටිය එක්ක කතා කරල අවසරය ලබා දෙමු. ඒ කණුවෙ ප්‍රදර්ශනය කිරීමේදී නගරයට පැමිණෙන කොට එතන තමයි ගොඩක් දුරට පේන්නෙ. එනිසා එම ස්ථානය බෞද්ධ කටයුතු වලට ලබා දෙමු කියල මම ඉල්ලීමක් කරනවා. විපක්ෂ නායකතුමා සැහැල්ලුවකට ලක්කරා කියල හිතන්න එපා. එතුමා කරන්නෙත් අපි හැමෝම කරන්නෙත් අම්බලන්ගොඩ නගරය බෞද්ධ නගරයක් වශයෙන් ගොඩනගා ගන්න ඔබ අපි සියළු දෙනාම මන්ත්‍රීවරු වශයෙන් මේවට උදව් දීල අපේ නගරය දියුණු කර ගමු. ස්තුතියි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මෝදර දේවාලයේ මේ එක බැනර් එකක් සඳහා තමයි අපි මෙච්චර කාලය නාස්ති කර ගත්තෙ. ඔතන විතරක් නෙමෙයිනෙ සභාපතිතුමා දැන්වීම් පුවරු දාල තියෙන්නෙ. බුදු පිළිමය ළගත් ලොකු දැන්වීමක් දාල තියෙනවා. අනිත් එක ඕනම මගියෙක් බස් එකකට නගින්න ඉන්නෙ ඔරලෝසු කණුව ඉදිරිපිට. අපි වෙළඳ දැන්වීම් ගහන්න දීපු ස්ථානය එතෙන්ට හොඳට පේනව. මේ රණ්ඩු කරන්නෙ මීටර් 50 ක විතර දුරකට. ඒකත් ඇත්තම බස් ස්ටෑන්ඩ්එක ඇතුලෙ. රාහුල මන්ත්‍රීතුමාටත් මතක ඇති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉන්න කාලෙ ඒ කටවුට් එකත් අපි ගැහුවෙ නැහැ. එක්සත් ජාතික පක්ෂෙ ගැහුවෙත් නැහැ. අපේ මැතිවරණ කාලෙදි පෝස්ටරයක්වත් ගහල නැහැ. මමනම් කියන්නෙ සභාපතිතුමා ඔය කියන තැන අවසර දෙන්න එපා. අපි භූමියක් වෙන් කරල තියෙනවා. අපි මුදලක් ගන්නෙ නැහැනෙ. ඕනතරම් ලොකු දැන්වීමක් එතන ගහන්න අවසර දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධයෙන් මම මතක් කරන්න ඕනෙ අපි අම්බලන්ගොඩ නගර සභාව විසින් ලබා දීල තියෙනවා ඉතාම වටිනා ස්ථානයක් වන බස් නැවතුම්පොල ඉදිරිපට තියෙන භූමිය. මේ මෝදර

දේවාලෙ කම්ටුවේ ලේකම්තුමත් ලිඛිතව ඉල්ලා තියෙන්නෙ එතුමා දන්නව අම්බලන්ගොඩ නගරයේ නීතිය මොකක්ද කියලා. එනිසා එතුමා ඉල්ලල තියෙන්නෙ ලිපියකින් ප්‍රධාන බස් නැවතුම්පොල ඉදිරිපිට මුදල් අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය සඳහා අවසර ලබා දෙන්න කියලා. මෝදර දේවාල කොමිටියත් දන්නවා අපි කරන ක්‍රමය. නමුත් මේ කවුරුහරි එක්කෙනෙක් කරපු ක්‍රියාව සාධාරණීකරණය කරන්න එපා. ඊලග දවසේ අපි හිතමු ජනාධිපතිතුමාගෙ එකක් ගහන්න කිව්වයි කියලා. අපි එකක් ගහන්න අවසර දීල තිබුණොත් ඒකටත් අවසර දෙන්න වෙනවා. පොදුනම් හැමෝටම පොදුයි. නැත්තම් සභාව විසින් කියනව නම් මේ නීතිය කඩන්න කියල එහෙම කරන්න පුළුවන්. මම කියන්න ඕනෙ හැම වෙලාවෙම මම ක්‍රියාත්මක කරන්නෙ මගේ පෞද්ගලික නීතියක් නෙමෙයි. සභාව විසින් අරගත්ත නීතියක්. හැබැයි වැරදුනු වෙලාවට හැම වෙලාවෙම කියන්නෙ මේක සභාපතිතුමාගෙ නියෝගයක්, මේක උප සභාපතිතුමාගෙ නියෝගයක් කියල. මේ දැන්වීමත් කපපු වෙලාවෙ කියල තියෙන්නෙ මේක උප සභාපතිතුමා කිව්ව නිසා කැපුවයි කියලා. අපි ඔය මෝදර දේවාලෙ අද තියෙන තත්වෙට පත් කරන්න ගෙවල් 14 ක් තිබුනා. ඒ 14 ම අපි ඉවත් කරලා හල්වතුරෙන් ඉඩම් දීල දේවාල භූමිය ශුද්ධ භූමියක් බවට පත් කරල තියෙනවා. අම්බලන්ගොඩ නගර සභාවෙ මෙහෙයවීමෙන්. අද තරුණ බෞද්ධ සමිතිය ගත්තත් නගර සභාව සතුව තිබුන ළිදක් දීල අද තුන්මහල් ගොඩනැගිල්ලක් ඉදිකරල පවත්වගෙන යනවා. තමුන්නාන්සේලාට සඳහන් කරන්න ඕනෙ ඔය මරණයට කැපවුන හරක් නිදහස් කරන්න කියල ආධාර එකතු කරන්න කලින් අපි අවසර ලබා දුන්නා. අන්තිමට තිබුන සභාවෙ මට මතකයි මම ඒකට ඡන්දෙ දුන්නෙ විරුද්ධව. 11 දෙනෙක් පක්ෂව දුන්නා. ඒනිසා අපි බස් නැවතුම්පොල දුන්නා. මම විරුද්ධ වීමට හේතුව තමයි සාමාන්‍යයෙන් දවසකට රු. 40000/- ක් විතර මුදල් එකතු වෙනවා බස් නැවතුම්පොලේ මුදල් එකතු කරනකොට හරක් නිදහස් කිරීම කියලා. තමුන්නාන්සේලා මේපාර යන්න ඇති හරක් කී දෙනෙක් නිදහස් කරාද? මමත් බෞද්ධ සමිතියට පළවෙනි පාර හරක් නිදහස් කරද්දි තනි වියදමින් හරකෙක් අරන් දුන්න කෙනෙක්. ඇත්තටම මෙතන බෞද්ධ සමිතිය විසින් ජාවාරමක් කෙරෙනවා. ඒ දේට මම පෞද්ගලිකව විරුද්ධ හින්දා මම පහුගිය සභාවෙ විරුද්ධව ඡන්දෙ දුන්නා. ඇත්තටම මෙතන බැනර් එල්ලගෙන ස්පීකර් දාගෙන විශාල කරදරයක් තියෙනවා. ඇත්තටම එක දිගට මාසයක් ශබ්ද විකාශන යන්ත්‍ර දාගෙන ඉන්නකොට අවට ගෙවල් වලටත් හරිම කරදරයි. අපේ ගෙදරත් ළමයි විභාග කරන කාලෙට ගෙදර එන්න කැමති නැහැ. රෑ අට විතර වෙනකම් මේක සද්දෙයි. පහුගිය කාලෙ බෞද්ධ සමිතිය හරක් බේරනවයි කියල කරේ ගොඩනැගිල්ල සෑදීම. ඉතිං මම පෞද්ගලිකව මේකට විරුද්ධ නිසා පහුගිය සභාවෙ මම විරුද්ධ වුනා. අනික් 11 දෙනා කැමති වෙච්ච නිසා බස් ස්ටෑන්ඩ් එක දීල තියෙනවා. දැන් මේ අවස්ථාවෙදිත් තොරණ සම්බන්ධව කඩ ගැසීමේදීත් ඒ අය ආවෙ සභාව ඉවර වුනහම. මම කිව්ව මම මේකට අකමැති වුනත් ඉතිරි 20 දෙනා අත්සන් කරනවනම් මම දෙන්නම් කියලා. ඇත්තටම තමුන්නාන්සේලාගෙන් අත්සන් ගන්න ඉස්සෙල්ලාම මේ අය කඩ ගහල ඉවරයි. කඩ ටික සම්පූර්ණයෙන්ම බෞද්ධ සමිතිය වික්කෙ බේරුවල මුස්ලිම් එක්කෙනෙකුට රු. 40000/- කට. ඒ අයට කියල තිබ්බෙ අම්බලන්ගොඩ නගර සභාවට ඒ සල්ලි බදිනව කියලා. ඉතින් තමුන්නාන්සේලා කියන විදියට මම ඕන වෙලාවක වැඩ කරන්නම්. ඒවගේම කියන්න ඕනෙ අපි අවු.15 ක් විතර නගරය පාලනය කරල තියෙනවා. එහිදී අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ දහම් පාසල් අතර පැවැත්වෙන තරග සඳහා අපි සම්පූර්ණ ත්‍යාග ලබා දීල තියෙනවා. නායක හාමුදුරුවො මගෙන් එක තෑග්ගක් ඉල්ලගෙන ආපු

වෙලාවෙ මම තෑගි සියල්ලම දෙන්න භාර ගත්තා. අපි ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සියළු වියදම් භාරගෙන එම වියදම් අය වැය ලේඛනයට ඇතුලත් කරා. අපි ඇත්තටම බෞද්ධ කටයුතු වෙනුවෙන් වියදම් කිරීමට මැලි වෙලා නැහැ. මට මතකයි එක පාරක් බෞදධ සමිතියෙන් ගාළු පාරෙ කොඩි දාන එකට රුපියල් අටදහස් ගානක් වියදම් කරල තිබුණා. අපි ඊට පස්සෙ සභාව විසින් තමයි කොඩි දැමීම කරල දුන්නෙ. සල්ලි අරගෙන නෙමෙයි. බෞද්ධ නගරයක් වශයෙන් අපෙන් කෙරෙන්න ඕන යුතුකම අපි කරල තියෙනවා. අපි නගරය පාලනය කරනකොට තමුන්නාන්සේලා තමයි ඒ බලය ලබා දෙන්නෙ. මම ඕන වෙලාවක සභාව විසින් මට නියමයක් පනවනව නම් ඒක මම ක්‍රියාත්මක කරනවා. මම මගේ තීරණ නෙමෙයි ක්‍රියාත්මක කරන්නෙ. මම පොදු මනුස්සයෙක්. හැබැයි බැනුම් එන්නෙ සභාපතිට. රාහුල මන්ත්‍රීතුමත් ඒක තමයි දැන් කලේ. මේ ලිපිය සම්බන්ධව පැයක් විතර කතා කරාට ලිපියෙන් ඉල්ලල තියෙන්නෙත් බස් ස්ටෑන්ඩ් එක ඉදිරිපිට.

<u>තීරණය</u>

☞ මෝදර දේවාලයේ පෙරහැර සම්බන්ධ දැන්වීම් පුවරුව අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ ඉදිරිපිට භූමියේ ප්‍රදර්ශනය කිරීම සඳහා **සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**03:07** ' සංග්‍රහ වියදම් ලබා ගැනීම ' මැයෙන් සංවර්ධන නිළධාරී කේ.ටී. රසිනි නිලූෂිකා මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2018 අප්‍රේල් මස මාසික සභාව මගින් පත් කරන ලද කමිටු 9 සහ සංවර්ධන කමිටු රැස්වීම් සඳහා එක් කමිටුවක් සඳහා රු. 1000/- බැගින් මාසිකව රු. 10000/- ක මුදලක් සංග්‍රහ වියදම් වශයෙන් ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ නගර සභාවේ පවත්වනු ලබන කමිටු 9 සහ සංවර්ධන කමිටු රැස්වීම් සඳහා එක් කමිටුවක් සඳහා රු. 1000/- බැගින් මාසිකව රු. 10000/- ක මුදලක් සංග්‍රහ වියදම් වශයෙන් ලබා දීමට ගරු **සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:8** ' 2018 මැයි මස 27 වන දින පැවැත්වෙන ලේ දන්දීමේ කඳවුර හා සම්බන්ධවයි ' මැයෙන් කළුවඩුමුල්ල, ධීරක්කන්ධ මාවතේ පසන් හේවගේ මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2018 මැයි මස 27 දින පොල්වත්ත ආලෝක උත්සව ශාලාවේදී, මියගිය අනුර පෙම්මාවඩු සහ ශමින්ද තුෂාන් යන අය අනුස්මරණය කිරීම සඳහා ලේ දන්දීමේ පිංකමක් පැවැත්වෙන බවත් එහි ප්‍රචාරණ

කටයුතු සඳහා බස් නැවතුම්පොළ ඉදිරිපිට සහ පොල්වත්ත ක්‍රීඩාංගණය අසල බැනර් 2 ක් නොමිලයේ ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

2018 මැයි මස 27 දින පොල්වත්ත ආලෝක උත්සව ශාලාවේදී පැවැත්වෙන ලේ දන්දීමේ පිංකම සඳහා බස් නැවතුම්පොළ ඉදිරිපිට සහ පොල්වත්ත ක්‍රීඩාංගණය අසල බැනර් 2 ක් නොමිලයේ ප්‍රදර්ශනය කිරීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

3:9 ‘ බැකෝ යන්ත්‍රයේ සේවය කිරීම වෙනුවෙන් දීමනාවක් ලබා ගැනීම ’ මැයෙන් නගර සභාවේ සේවයේ නියුතු එස්. ප්‍රදීප් ක්‍රිෂාන්ත කුමාර මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

තමා නගර සභාවේ ස්ථිර වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරේ සේවය කරන බවත් දැනට වසරක පමණ කාලයක සිට නගර සභාවේ බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු වශයෙන් එහි සේවයේ යෙදී සිටින බවත් ඒ වෙනුවෙන් තමාහට දිරි දීමනාවක් ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලීම් කර තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි එයා ඉන්නෙ කම්කරු තනතුරේද? විශේෂ ක්‍රියාවක් නිසා ගෙවීම් කරනවනම් අදාල නිලධාරීන්ගේ නිර්දේශ අරගෙන කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව්. කාන්ත මහතා නිර්දේශ කරල තියෙනවා. ලේකම්තුමිය අනුමත කරල තියෙනවා.

<u>තීරණය</u>

**නගර සභාවේ බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු වශයෙන් එහි සේවයේ යෙදී සිටින එස්. ප්‍රදීප් ක්‍රිෂාන්ත කුමාර මහතා හට ඒ වෙනුවෙන් දිරි දීමනාවක් ලෙස වැඩ කරන දිනයක් සඳහා රු. 250/- ක මුදලක් ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

3:10 ‘ නගර සභා ක්‍රීඩාපිටිය උඩ කොටස ලබා ගැනීම සඳහා ’ මැයෙන් ලංකා බැංකුව අසල ත්‍රීරෝද රථ සමිතිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ත්‍රීරෝද රථ සංගමය විසින් 2 වන වරට සංවිධානය කරනු ලබන බත් දන්සැල 2018-05-29 දිවා කාලයේ පැවැත්වෙන බවත් ඒ සඳහා නගර සභා ක්‍රීඩාංගණයේ උඩ කොටස නොමිලේ ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි එය ලබා දෙන්න. නමුත් මෙතන ත්‍රීරෝද රථ ගාලක් තියෙනව කියන එක මම පිළිගන්නෙ නැහැ. මොකද මෙතන ත්‍රීරෝද රථ ගාලක් නැහැ. එනිසා ඉල්ලීම ලබා දෙන්න. ත්‍රීරෝද රථ ගාලක් පැවතීම යන්න ඉවත් කරන්න.

*තීරණය*

2018-05-29 දිවා කාලයේ පැවැත්වෙන බත් දන්සැල සඳහා නගර සභා ක්‍රීඩාංගණයේ උඩ කොටස නොමිලේ ලබා දීමට **ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

3:11 ‘ මහා බත් දන්සැල - 2018-05-30 රාත්‍රී ’ මැයෙන් ඕකන්ද යන්ග් ප්ලේයර්ස් ක්‍රීඩා සමාජයේ සභාපතිතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඕකන්ද යන්ග් ප්ලේයර්ස් ක්‍රීඩා සමාජය විසින් සංවිධානය කරනු ලබන බත් දන්සැල සඳහා පුටු 300 ක් , වර්ණ කොඩි, වතුර බවුසරය හා ට්‍රැක්ටර් ටේලරයක් මුදල් අයකිරීමකින් තොරව ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

*තීරණය*

ඕකන්ද යන්ග් ප්ලේයර්ස් ක්‍රීඩා සමාජය විසින් සංවිධානය කරනු ලබන බත් දන්සැල සඳහා පුටු 300 ක් , වර්ණ කොඩි, වතුර බවුසරය හා ට්‍රැක්ටර් ටේලරයක් මුදල් අයකිරීමකින් තොරව ලබා දීමට සභා අනුමැතියට යටත්ව ලබා දීම වෙනුවෙන් **ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(04)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න නැත

**04.01** **ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්ණ**

01. පැවති තානායම් ගොඩනැගිල්ල ඉවත් කර නව තානායමක් ඉදිකිරීම සඳහා සැලසුමක් සකස් කලේද? එසේ නම් එය සහාගත කරන්න.

ඔව්.

සහාගත කරමි.

02. නව තානායමක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම

I. ටෙන්ඩර් කැඳවීම සඳහා ජාතික පුවත්පත් වල මිළ ගණන් කැඳවූ මිළ කැඳවීමේ විස්තර ඇතුලත් ජාතික පුවත්පත් වාර්තා හා එහි පිටපත් තිබේද? තිබේනම් සියල්ල ඉදිරිපත් කරන්න.

ඔව්.

සහාගත කරමි.

II මිළ ගණන් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලත් (පුවත් පත් දැන්වීම් අනුව) සියළුම ටෙන්ඩර් කරුවන්ගේ සමාගම් ලියාපදිංචි සහතික සහාගත කරවීම

සහාගත කරමි.

III මිළ ගණන් ඉදිරිපත් කල විවිධ ටෙන්ඩර් කරුවන් ඉදිරිපත් කල මිළ කැඳවුම් ලේඛන සහාගත කිරීම.

II පිළිතුරට අනුව

IV මිළ කැඳවුම් ඉදිරිපත් කල ටෙන්ඩර් කරුවන්ගේ මූල්‍ය වත්කම් ප්‍රකාශ / බැංකු ගිණුම් පිළිබඳ විස්තර/ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද යනාදි විස්තර සහාගත කිරීම.

II පිළිතුරට අනුව

V සුදුසුම ටෙන්ඩර්කරු තෝරාගත් ක්‍රමවේදය හා තෝරාගත් ටෙන්ඩර්කරු නිර්දේශ කල කමිටුවේ නිර්දේශයක් තිබේද? එසේ නම් එය සහාගත කරන්න.

II පිළිතුරට අනුව

VI තෝරාගත් ටෙන්ඩර්කරු සඳහා B.O.I. සහතිකය තිබේනම් එය සහාගත කිරීම.

නැත.

03. ටෙන්ඩර්කරු තෝරාගත් පසුව ඔහු සමග අත්සන් කල ගිවිසුම සියළුම ගිවිසුම් පිටපත් වල නිල මුද්‍රාව තබා අත්සන් කර තිබේද? තිබේ නම් එය සනාථ කරන්න.

ඔව්.

04. අත්සන් කරන ලද නීත්‍යානුකූල ගිවිසුම ප්‍රකාරව තානායම ඉදිකිරීම සඳහා කටයුතු කර තිබේද? නොඑසේ නම් එයට හේතු සහාගත කිරීම.

නැත

05. ගිවිසුම් ප්‍රකාරව නියමිත බදු මුදල් මාසිකව නියමිත පරිදි නගර සභාවට ගෙවා තිබේද? එසේ නම් මාසිකව ගෙවන ලද මුදල් සහ එයට අදාලව නිකුත් කල රිසිට් පත් සභාගත කිරීම.

ඔව්

06. ගිවිසුම ප්‍රකාරව බදු ගැනුම්කාර පක්ෂය කිසිදු සංවර්ධන ව්‍යාපෘතියකට අනුගත නොවී පළමු වර්ෂය තුල බදු මුදල් නිදහස් වර්ෂයක් ලෙස දක්වා ඇත්තේ ඇයි? බදු ගැනුම්කරු ගිවිසුම කඩකිරීම නිසා ගත් ක්‍රියාමාර්ග කවරේද යන්න සභාගත කිරීම.

අදාල නැත.

07. පැරණි තානායම කඩා ඉවත් කිරීම නිසා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත්තේද? ලබා ගත්තේනම් එය සභාගත කිරීම.

අදාල නැත.

08. බදු ගැනුම්කරු සමග අත්සන් කල ප්‍රථම ගිවිසුම අනුව බදු ගැනුම්කරු ඉවත් වූයේ නම් ඒ බව ලිඛිතව දැනුම් දී තිබේද?

අදාල නැත

09. ප්‍රථම බදු ගැනුම්කරු සමග අත්සන් කල ගිවිසුමේ වෙනත් පාර්ශවයක් ගැන සඳහන් වන්නේද? එසේ නම් එයට හේතු සභාගත කිරීම.

අදාල නැත.

10. ප්‍රථම බදු ගැනුම්කරු ගිවිසුම ප්‍රකාරව (ගිවිසුම විධිමත් හා නීත්‍යානුකූල ගිවිසුමක් නම්) ගිවිසුමේ කොන්දේසි කඩකර තිබියදී එයට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද?

අදාල නැත.

11. නගර සභා පාලනය ලේකම්වරයෙකු යටතේ පැවති කාලය තුළ ඔහු හෝ ඇය ගිවිසුම කඩකිරීම නිසා ගෙන ඇති ක්‍රියාමාර්ග සභාගත කිරීම.

අදාල නැත.

12. ගිවිසුම කඩකිරීම නිසා බදු ගැනුම්කරු ඉවත් කලහොත් ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග විධිමත්ව හා නීත්‍යානුකූලව ගිවිසුම මගින් බදු ගැනුම්කරු දැනුවත් කර තිබේද? නොඑසේ නම් බදු ගැනුම්කරු ගෙවන ලද මාසික මුදල් පිළිබද ඔහු ඉවත් කල පසු කටයුතු කල යුතු ආකාරය පිලිබද පැහැදිලිව ගිවිසුමේ සඳහන් කර තිබේද?එසේ නම් ඒ පිලිබද විස්තර සභාගත කිරීම.

ඔව්.

අදාල නැත.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි ඔබතුමා මන්ත්‍රීවරුන්ගෙ වරප්‍රසාද අහිමි කරන්න එපා. මන්ත්‍රීවරයෙකුගෙ නම කියල කතා කරහම ඒ මන්ත්‍රීවරයට අයිතියක් තියෙනවා ඒකට උත්තර ලබා දෙන්න. ඒක පාර්ලිමේන්තුවෙත් තියෙනවා පළාත් සභාවෙත් තියෙනව. ඔබතුමා හොයල බලන්න. ඒ අයිතිය නැති කරන්න එපා.

**04.02** <u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ. සෝභිත රංජිත් මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්ණ</u>

01. නගර සභාවේ මීට පෙර මහා සභා රැස්වීම් පැවැත්වූ ඉහල මාලයේ කාමරයේ ඉතාම වටිනා මේසයක් තිබුනේද?

ඔව්.

02. එසේ තිබුනේ නම් මේ වන විට එම මේසය නගර සභාවේ තවමත් තිබේද?

ඔව්.

03. නොඑසේනම් එම මේසයට සිදු වූයේ කුමක්ද?

අදාල නොවේ.

04. මේසය නගර සභාවේ වත්කම් ලේඛනයේ ඇතුලත්ව තිබේද?

ඔව්.

05. එසේ ඇතුලත් වූයේ නම් නගර සභාවෙන් එය අතුරුදහන්ව හෝ ඉවත් කර තිබේනම් එය වත්කම් ලේඛනයෙන් බැහැර වූ ද්‍රව්‍යයක් වශයෙන් සඳහන් කර තිබේද? තිබේනම් එය සභාගත කරන්න.

අදාල නොවේ.

06. ලේඛනයේ සඳහන් නොවී මේසය නගර සභාවෙන් පිට ගියේනම් ඒ පිලිබඳ විස්තර සභාගත කරන්න.

අදාල නොවේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මේසෙ කොතනද තියෙන්නෙ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඔබතුමාගෙ ප්‍රශ්නය හරියට පැහැදිලි නැහැ. උඩ තිබුන මේසෙ තමයි දැන් මෙතන සභාවට ගෙනල්ල තියෙන්නෙ. මීට පෙර උඩ තිබුණ මේසය මහ අම්බලන්ගොඩ පුස්තකාලයේ තියෙනවා. හැබැයි එක දෙයක් හෙරකම් කරල තියෙනවා. නගර සභාව විසින් අපේ ගාල්ල දිස්ත්‍රික් පළාත් පාලන ආයතන සංසදයේ තිබුණ මේසය මෙතෙන්ට ගෙනිල්ල තියෙනව හොරකම් කරල. අපේ අවසරයකින් තොරව. තමුන්නාන්සේලා වාඩි වෙලා ඉන්නෙ ගාල්ල දිස්ත්‍රික් පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගෙ සංගමයේ මේසයක බව මතක තියා ගන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි අපි මහජන මන්ත්‍රීවරුනෙ. අපෙන් කවුරුහරි ඇහුවහම අපි කියන්න ඕනෙ. ඒකයි ප්‍රශ්නෙ ඇහුවෙ.

**04.03** <u>ගරු නගර සභා මන්ත්‍රී එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්ණ</u>

01. (අ) අම්බලන්ගොඩ මහා විහාර පාරේ ධීවර සංකීර්ණ ගොඩනැගිල්ල නගර සභාවේ කාර්යයන් සඳහා පරිහරණය පිණිස යෙදවීමට යම් බාධාවක් පවතී ද?

ඔව්.

(ආ) එසේ නම් ඒ කුමක් ද?

මෙම ගොඩනැගිල්ල ධීවර සංස්ථාවට භාර දී ඇත. (2017/05/03)

**(05)** යථා පරිදි කල් දී ඇති යෝජනා

**05:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා (නිළධාරීන් විසින් සකස්කරන ලද පරිපාලන යෝජනා) :-**

**05.01.01 සංවර්ධන සහකාර (පරිසර) පී.එච්.එල්.සී. පුෂ්පරාණි මිය විසින් සකස් කරන ලද පරිපාලන යෝජනාව**

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ ජනනය වන කසල අතරින් දිරන කසල යොදා ගෙන කොම්පෝස්ට් පොහොර නිපදවීමට කැමැත්තක් දක්වන පුද්ගලයන් සඳහා කොම්පෝස්ට් බඳුන් ලබා දීමට 2018-05-26 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුවේදී යෝජනා විය. මේ වන විට සියළු ග්‍රාම නිලධාරී වසම් වලින් ඉල්ලීම් විශාල වශයෙන් ලැබෙන අතර මෙම කොම්පෝස්ට් බඳුන් අවශ්‍යතාව සපුරාලීම සඳහා කොන්ක්‍රීට් කොම්පෝස්ට් බඳුන් මිලදී ගැනීම සුදුසු බව මෙම සභාවට යෝජනා කරමි.

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

කොම්පෝස්ට් බඳුන් ලබාදීමේ මීට කරන ලද ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කරන්නටයි මේ සූදානම. අපි මේ දේ අර්ථාන්විත බව පරිසර කමිටුවේදි යෝජනා කරා. මේ සක්‍රිය විදියට කොම්පෝස්ට් නිපදවෙන මේ ක්‍රමයට සියළුම දෙනාට සහන මිල යටතේ ලබා ගැනීමට අවකාශ ලබා දෙන්න කියල ඉල්ලිම් කරනවා. නොමිලේ ලබා දෙන්න පුළුවන්නම් වඩා හොදයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි පහුගිය කාලෙ සමහර කොට්ඨාශ වලට බඳුන් බෙදුවා. නොබෙදපු කොට්ඨාශ වලට ප්‍රමුඛත්වය දෙන්න කියල මම ඉල්ලීමක් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි කලින් දීපු කොට්ඨාශ වල ඒ බඳුන් සාර්ථක විදියට පරිහරණය වෙනවද කියල සොයා බැලීමක් කරන්න කියල මම ඉල්ලා සිටිනවා. පරිසර කමිටුවට ඒ ගැන පොඩි වාර්තාවක් ඉදිරිපත් කරනව නම් හොඳයි. ඒ ගැන කටයුතු කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේ නගර වැසියන් වෙනුවෙන් කොම්පෝස්ට් බඳුන් ලබාදීමේ ව්‍යාපෘතියෙදි මා ප්‍රථමයෙන්ම ඉල්ලා සිටිනවා කරුණාවෙන් මේ බඳුන් කොන්ක්‍රීට් වලින් ලබා දෙන්න කියලා. ප්ලාස්ටික් බඳුන් ලබා දුන්නොත් වෙනත් කටයුතු සඳහා භාවිතා කරනවා. එවිට අපි බලාපොරොත්තු වන මාතෘකාවෙන් පිට යනවා. ගෙවල් වල ඉවතලන අපද්‍රව්‍ය මේ බඳුන් වලට දැමීම නිසා අපේ සෞඛ්‍ය අංශයේ කුණු ඉවත් කරන අයට මේක විශාල පහසුවක් වෙනවා. නිවැසියන්ගෙ පැත්තෙනුත් මේක විශාල පහසුවක් වෙනවා. ඒ නිසා මේ බඳුන් ලබා දීම, එයට අනුගත වන අය තෝරල කලින් ලබා නොදුන් අය හඳුනගෙන ඒ අයට ලබා දීමේ ක්‍රියාවලියක් කරනව නම් හොඳයි කියල මම විශ්වාස කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

සභාපතිතුමනි මෙම යෝජනාව ඉතාමත්ම හොඳයි. අපි ඔබතුමාගෙ සභාපතිත්වය යටතේ කළුවඩුමුල්ලෙ පන්සලේ විහාරාධිපතිහිමියන්ගේ අනුශාසනා යටතේ මේ දේ කරේ. එහිදී අපේ ප්‍රධාන අමාත්‍යතුමා දුන්නා කොම්පෝස්ට් බැරල් 500 ක්. මම නිලධාරීන්ගෙන් අහන්න කැමතියි ඒ බඳුන් ලබා දුන් ආකාරය නිසි ලෙස සටහන් වෙලා තියෙන්න ඕනෙ. මහජන මුදල් වැය කරන කොට නිසි ප්‍රතිඵලයක් තියෙන්න ඕනෙ. මේ ගැන නිසි ලෙස සොයා බැලුවෙ නැති නිසා මේවගෙ රෙදි දමන තත්වයටත් පත්වුනා. මම හිතන්නෙ සිමෙන්ති වලින් දෙනවනම් හොඳයි. මේකෙන් හැබැයි ප්‍රයෝජනයක් ගන්න ඕනෙ. එනිසා අපි මේ යෝජනාවට විරුද්ධ වෙන්නෙ නැහැ. නමුත් වැඩ සටහනක් විදියට හදල පසු විපරමක් කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

**තීරණය**

**ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින්** අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ සියළු ග්‍රාම නිලධාරී වසම් වල කොම්පෝස්ට් බඳුන් අවශ්‍යතාව සපුරාලීම සඳහා කොන්ක්‍රීට් කොම්පෝස්ට් බඳුන් මිලදී ගැනීමේ **යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

**05.01.02 ප්‍රජා සංවර්ධන නිලධාරී ඩී. වාසනා තරංගි මිය විසින් සකස් කරන ලද පරිපාලන යෝජනාව**

ජාතික කියවීමේ මාසය අරමුණු කරගනිමින් මහජන පුස්තකාලය මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන පාසල් තරගාවලිය සහ ත්‍යාග ප්‍රදානෝත්සවය මෙම වසරේදී පැවැත්වීමට අපේක්ෂා කරනු ලබන අතර ඊට අදාල ඇස්තමේන්තුව අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

| අනු අංකය | විස්තරය | අපේක්ෂිත වියදම (රු) |
|---|---|---|
| 01 | සහතික පත් 200 මුද්‍රණය | 15000.00 |
| 02 | ලිපිගොනු කවර, ආරාධනා පත්‍ර, ලිපි ද්‍රව්‍ය | 25500.00 |
| 03 | ත්‍යාග සඳහා<br>ප්‍රථම ස්ථාන 17 (17 * 2000.00) - 34000.00<br>දෙවන ස්ථාන 17 (17 * 1500.00) – 25500.00<br>තෙවන ස්ථාන 17 (17 * 1000.00) – 17000.00<br><br>විවාද<br>ශූරතාවය 5000.00<br>අනුශූරතාවය 3000.00 | 84500.00 |
| 04 | විනිශ්චය සහ තරග සංවිධාන වියදම (විනිශ්චය ගාස්තු, සංග්‍රහ ඇතුළුව) | 20000.00 |
| 05 | ආරාධිත දේශක ගාස්තු | 40000.00 |
| 06 | ශාලා පහසුකම් සඳහා | 30000.00 |
| 07 | උත්සව දින වියදම (වේදිකා නිර්මාණය, සංග්‍රහ ඇතුළුව) | 35000.00 |
| | | 250000.00 |

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේවට වෙනත් ආයතන වලින් අනුග්‍රහය ලබා ගන්නවද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බොහෝදුරට ගන්නවා. පුස්තකාල වගේ කටයුතු වලදි 100% ක්ම අනුග්‍රහය ගන්න අමාරුයි. එතකොට අපි සභාව විසින් දරනවා. සමහර ඒවා ඒ අය ලබා දෙනවා. අපි සියළු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා අනුග්‍රහය ලබා ගන්න පුළුවන් තැන් වලින් ලබා ගන්න කියලා.

**<u>තීරණය</u>**

**ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින්** ජාතික කියවීමේ මාසය වෙනුවෙන් මහජන පුස්තකාලය මගින් සංවිධානය කරන පාසල් තරගාවලිය සහ ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත්වීම සඳහා ද ඊට අදාල ඇස්තමේන්තුව වන රු. 250000/- ක් වූ මුදල පිළිගැනීමේ **යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

**05.01.03 ප්‍රජා සංවර්ධන නිලධාරී ඩී. වාසනා තරංගි මිය විසින් සකස් කරන ලද පරිපාලන යෝජනාව**

ලෝක ළමා දිනය සැමරීම අරමුණු කරගනිමින් මෙම වසරේදී පෙර පාසල් දරු දැරියන් වෙනුවෙන් ළමා පෙරහැර, ළමා සැනකෙළිය, ළමුන් සඳහා විනෝද ක්‍රීඩා, රැගුම් අවස්ථා ලබා දීම ආදි වශයෙන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන අතර , එම වැඩසටහනට අදාල ඇස්තමේන්තුව අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

| අනු අංකය | විස්තරය | අපේක්ෂිත වියදම (රු) |
|---|---|---|
| 01 | මැරිගෝ රවුම, පුංචි කෝච්චිය, ජෙට් යානය, ජල තටාකය (බෝට්ටු පැදීමට), බවුන්සර් | 600000.00 |
| 02 | අඩි 20 * 20 වේදිකාව (දරුවන්ගේ රැගුම් සඳහා) | 30000.00 |
| 03 | ශබ්ද විකාශන පහසුකම් | 30000.00 |
| 04 | දරුවන්ගේ සහතිකපත්, ගුරු සහතිකපත්, ආරාධනා පත්‍ර, පෝස්ටර්, ලිපිද්‍රව්‍ය | 100000.00 |
| 05 | උපුල් මාමා ඇතුළු කණ්ඩායම සඳහා | 100000.00 |
| 06 | පෙරහැර සංවිධානය, සංග්‍රහ ඇතුළු අනෙකුත් වියදම් | 40000.00 |
| | | **900000.00** |

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මේක ලෝක ළමා දිනය වෙනුවෙන් ලක්ෂ 9 ක් වියදම් කරන්න ඔබතුමා අවසර ඉල්ලන්නෙ. මේ තරම් මුදලක් වියදම් කිරීම සම්බන්ධව මම විරුද්ධයි. නගර සභාවෙ ලොකු ආදායමක් තියෙනවනම් එකග වෙන්න පුළුවන්. මේක සැමරිය යුතුයි. ඒක සමරන්න ඕන ආකාරයට සමරමු. අපිට ආර්ථික අවහිරතා මැද තියෙද්දී මෙතරම් මුදලක් වියදම් කිරීම සම්බන්ධව මම සම්පූර්ණ විරුද්ධයි.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි අපි මේ ලෝක ළමා දින තුන් හතර වතාවක් සැමරුව. මේ නගර සභාවෙ එක සතයක්වත් නැතුව. මම හිතන්නෙ ළමා දිනයක් වෙනුවෙන් මේවගේ සංවිධානයක් කරේ

අම්බලන්ගොඩ නගර සභාව. මේකට අපි සයළුම දෙනා සහයෝගය ලබාගෙන තමයි කරන්නෙ. ඒ නිසා මේක අපි කාගෙත් සහයෝගයෙන් කරානම් හොදයි කියන එකයි මට කියන්න තියෙන්නෙ. අපි වියදම් කරනදේට අනුමැතියක් ගන්න ඕනෙ. ඒකයි මේක්සභාවට ඉදිරිපත් කරේ. නමුත් මෙතෙක් කරපු ලෝක ළමා දින සදහා නගර සභාවෙ මුදල් වියදම් කරේ නැතෙයි කියන එක මම ප්‍රකාශ කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

එහෙමනම් මේ ලක්ෂ 9 ක මුදලක් ඉල්ලන්නෙ ඇයි. එහෙමනම් මේකෙ පැහැදිලිව කියන්න ඕනෙ මෙපමණ මුදලක් යනවා. අපි විවිධ ආයතන හා සහයෝගය ලබා දෙන අය මගින් ඉටු කර ගැනීමට කටයුතු කරනවා කියලා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධයෙන් මම කියන්න ඕනෙ අවුරුදූ ගානකට උඩදි අපේ පාලන කාලය තුලදි අපි කරා. අපිට මුල්ම එකට ගියා ලක්ෂ 6 ක් හරි හතක් හරි. අපි එක සතයක්වත් නගර සභා මුදල් ගත්තෙ නැහැ. මේ උත්සවය සදහා පෙර පාසල් ළමයි 25000 ක් සහභාගි වෙනවා. එදාට අම්බලන්ගොඩ ක්‍රීඩාංගණය සම්පූර්ණ සැණකෙළියක්. එයට සහභාගිවන ළමුන් සදහා කිසිදු ගාස්තුවක් අය කරන්නෙ නැහැ. මට ඇත්තටම මතකයි එක දෙමව්පියෙක් ඇස්දෙකේ කදුළු පුරවගෙන ඇවිත් මට කිව්ව ඊට ඉස්සෙල්ල සතියෙ කුලරත්න විද්‍යහලේ සැණකෙළිය තිබ්බ. අපි සල්ලි දීල ඇතුලට ආවෙ. මගේ පුතා මෙරිගෝරවුන්ඩ් එකේ යන්න ඕනෙ කියල ඇඩුවා. මගේ අතේ සල්ලි තිබුනෙ නැහැ. මම මෙරිගෝරවුන්ඩ් එක වටේ පුතා එක්ක ගිහිල්ල ගෙදර ගියා. අදනම් මගේ පුතා ඇතිවෙන්න විනෝද වුනා කියල. ඉතින් අපි දරුවන්ට පොඩි කාලෙදි ලබාදිය යුතු ආස්වාදය නොමිලේ ලබා දීම තමයි මේ කරල තියෙන්නෙ. මේ වැඩ සටහනට විශාල පිරිසක් ඉන්නව අත්වැල් බැදගෙන. දැනටම එක මහත්මයෙක් ලක්ෂ 3 ක් දෙන්න පොරොන්දු වෙලා තියෙනවා. ඒ විදියට එක් එක අය මේව බාර ගන්නවා. මට මතකයි අන්තිමට අපි කරපු එකේදි අපිට 163000/- ක් මදි වෙලා තිබුනා. ඒ වෙලාවෙදි ආපු මහත්මයෙක් මේක ළමයි වෙනුවෙන් කරන හොද වැඩක් කියල මටත් ළමයි නැහැ කියල එවෙලාවෙම 163000/- ක චෙක් එකක් ලියල මට දුන්නා. එක පාරක් සම්පූර්ණම සිංහ සමාජය විසින් භාර ගත්තා. ඒ නිසා මේ වෙලාවෙදි සියළු මන්ත්‍රීවරුන් මේ දරුවන් වෙනුවෙන් කරන දේ වෙනුවෙන් අනුග්‍රාහක භවතුන් සොයා දෙන්න කටයුතු කරන්න. උදව් කරන්න. අපි නගර සභාවෙන් සල්ලි ගන්නෙ නැහැ. ක්‍රීඩාපිටිය විතරයි අපි ගන්නෙ. එනිසා මේ කටයුත්ත සාර්ථක කර ගන්න සහයෝගය ලබා දෙන්න කියල ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. අයිරාංගනී ද සිල්වා මහත්මිය කතා කරමින්</u>**

සභාපතිතුමනි සභාවෙ මුදල් නොමැතිනම් කිසිම ගැටළුවක් නැහැ. අපිත් කැමතියි ලෝක ළමා දිනය ඉහලින්ම සමරන්න. අපි එකතුවෙලා මේ වැඩේ කරමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මෙතුමාට දොසක් කිව නොහැකියි. මේ යෝජනාව ඉදිරිපත් කරපු ආකාරයෙන් තේරුම් ගැනීමට අපහසුතාවක් තියෙනවා. මම ඔබතුමාගෙන් අහනවා අපේ ප්‍රධාන ක්‍රීඩා පිටිය මේ අභියෝගයට දැන් සූදානම් ද කියලා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි කොහොමහරි කරනවා. බය වෙන්න එපා. අභියෝගය තියෙන්නෙ ලක්ෂ 9 සොයන එකනෙ. ඊලගට අපේ ක්‍රීඩා පිටිය සම්බන්ධව අලුත් ගැටළුවක් නිර්මාණය වුනා. දැනට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසුරවලා අළුත් පරිපාලනයක් ඇවිත් තියෙනවා. අපි සාකච්ඡා කරල මේ ගැටළු නිරාකරණය කර ගනිමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි ඩෙනට් පනියන්දූවගේ මන්ත්‍රීතුමාට පොඩි අනවබෝධයක් වගේ තියෙනව කියල මට හිතෙනවා. පසුගිය කාල වලදි ඇත්තටම හොදට කරා. සභාවෙ සල්ලි ගත්තෙ නැහැ. ළමයින්ගෙ මානසික සතුට සදහා තමයි අපි මේක කරේ. සාහිත්‍ය උත්සවයටත් මම මන්ත්‍රීකම නැතත් හැමදාම දායකත්වය දුන්නා. මේක න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීමේ යම් දුර්වල කමක් තියෙන බව ජේනවා. එහෙම වුනානම් පනියන්දූවගේ මන්ත්‍රීතුමා මේකට අකමැතිවෙන එකක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මට උදව්වක් කරන්න පුළුවන්. මේ මෙරිගෝරවුන්ඩ්, පුංචි කෝච්චිය, ජෙට් යානා මගේ හිතවත් කෙනෙක් ලග තියෙනවා. ලක්ෂ 6 ට අඩුවෙන් ඒ උදව්ව මම කරල දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ලක්ෂ 9 ක් වගේ මුදලක් වියදම් කරල මෙවැනි කටයුත්තක් කිරීම නගර සභාවට හොදනමක් එන දෙයක්. ඒත් අපට සහතික වෙන්න පුළුවන්ද මෙවැනි මුදලක් සදහා උදව් කරන්නෙ සත් භාවයෙන්ද එහෙම නැත්නම් යම් කොන්දේසි සහිතවද කියන එක සම්බන්ධව. ඒ සම්බන්ධව ඔබතුමාට සහතිකයක් දෙන්න පුළුවන්නම් හොදයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මෙහිදී සම්බන්ධීකරණයක් කරන්නෙ. එතනදි ප්‍රශ්නයක් වෙන්නෙ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි මේ ලෝක ළමා දිනය මීට පෙරත් කරා. අපේ ඩෙනට් මන්ත්‍රීතුමා මේ ගැන දන්නෙ නැති නිසයි ඒ විදියට කතා කරෙ. නැත්තම් මේක හොද වැඩක්. සභාවෙ මුදල් පාවිච්චි කරනු්න පුළුවන් නගර සීමාවෙ අයට පමණයි. දිස්ත්‍රික්කෙම සහභාගි වෙනකොට ගැටළු ඇති වෙන්න පුළුවන්. ඒනිසා වෙන්න ඇති ඩෙනට් මන්ත්‍රීතුමා මේක කියන්න ඇත්තෙ. ඇත්තටම මුදල් සොයාගෙන කරනවනම් හොදයි. මමත් හිටියා අර දෙමව්පිය අඩන වෙලාවෙ. නගර සභාවෙ මුදල් වැය නොකර පෞද්ගලිකව මුදල් සොයාගෙන මෙය කරන්න කියන එක අපි කියනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේ සම්බන්ධයෙන් කතා කරද්දි මුදල් කෙසේ වෙතත් මෙහි ඇති වටිනාකම සම්බන්ධයෙන් අපිට වගකීමක් තියෙනවා. මේක බාලාංශ දරුවන් සඳහා යොමු වෙන්නෙ. දිස්ත්‍රික්කය පුරාම ඉන්න දරුවන් මේකට ආරාධනා ලබනවා. මේක සැණකෙළියක ස්වභාවයෙන් අපි කීප වතාවක් පැවැත්තුවා. මේකට කුඩා දරුවන් නෙමෙයි වැඩිහිටියනුත් කැමතියි. ඒ අපිට ඒ කාලෙ මේව තිබුනෙ නැහැ. අනිත් එක මේව ලැබෙන්නෙ යමක් කමක් තියෙන දෙමව්පියන්ගෙ දරුවන්ට විතරයි. එතකොට ඈත පිටිසර ගම්මානවල දුප්පත් දරුවන්ට අවුරුද්දකට සැරයක්වත් මෙවගේ දෙයක් ලැබීම ලොකු දෙයක්. මුදල් සම්බන්ධව අපිට ගැටළු තියෙනවා. මීටත් වඩා කරන්න දේවල් තියෙන්නත් පුළුවන්. නමුත් අපි මන්ත්‍රීවරු විදියට පුද්ගලික ආයතන වලින් සම්බන්ධීකරණය කරල කෙසේ හෝ මේ කටයුත්ත කර ගැනීම තමයි වැදගත් වෙන්නෙ. මම මේක අවස්ථාවක් කර ගන්නව සභාපතිතුමාට මෙම කටයුත්ත කර ගැනීමට එතුමාගේ ශක්තියත් යොදවල අපි සියළු දෙනාගෙ ශක්තියත් සමග සාර්ථකව ඉටු කර ගැනීම සම්බන්ධව එතුමාට ස්තුතිය පිරිනමන අතරම මෙම කටයුත්ත සාර්ථක කර ගනිමු කියන යෝජනාව ඉදිරිපත් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්**

සභාපතිතුමනි මෙම කටයුත්ත නගර සභාව මගින් ඉටු කිරීම ඉතාම හොද දෙයක්.

තීරණය

ලෝක ළමා දිනය සැමරීම වෙනුවෙන් ළමා පෙරහැර, ළමා සැනකෙළිය, ළමුන් සඳහා විනෝද ක්‍රීඩා, රැගුම් අවස්ථා ලබා දීම යන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා වන රු. 900000/- ක් වූ ඇස්තමේන්තුව පිළිගැනීමේ යෝජනාව **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.01.04 නගර සභාවේ වැඩ බලන ලේකම් බී.ඒ. ධම්මිකා මහත්මිය විසින් සකස් කරන ලද පරිපාලන යෝජනාව**

නගර සභාවේ දෛනික කටයුතු කාර්යක්ෂම ලෙසින් පවත්වාගෙන යාම සඳහා හදිසි සහ අත්‍යාවශ්‍ය කටයුතු වෙනුවෙන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව වටිනාකම රු. 20000/- ක උපරිමය නොඉක්මවන කිසියම් සැපයුම් හා සේවා, අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා බලය දීම, අවශ්‍ය පරිදි මිල ගණන් කැඳවීම හා ඇගයීම සිදු කිරීම සඳහා නගර සභා ආඥා පනතේ 224 වගන්තිය ප්‍රකාරව සභාපතිවරයාගේ අනුදැනුම මත සභාවේ වැඩ බලන ලේකම් බී.ඒ. ධම්මිකා මහත්මිය වෙත බලය පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේකෙ ගැටළුවක් තියෙනවා. දෛනික කටයුතු සඳහා රු. 20000/- කියල තියෙන්නෙ. දෛනිකනම් සම්පූර්ණ විරුද්ධයි. ඉස්සෙල්ල එකෙත් පැහැදීමක් තිබුනෙ නැහැ.

පසුව තමයි කියන්නෙ. මෙහෙම කරුණු ඉදිරිපත් කරන්න එපා. අපි කියන්නෙ සභාවට අවශ්‍ය හොඳ දේ ගන්න. නමුත් මේ වාර්තා ඉදිරිපත් කරන කොට මන්ත්‍රීවරුන්ට පැහැදිලිව තේරෙන පරිදි ඉදිරිපත් කරන්න. මොකද මෙ නගරයේ මිනිස්සු බදු ගෙවන මුදල්. මේවට අපි වග කියන්න ඕනෙ. පැහැදිලිව තියෙනවනම් අපිට එකගතාවය දෙන්න පුළුවන්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මේක අපි අනුමත කරල නැවත ඒක අපිට සභාවට එනවද අපි දැනුවත් වෙන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මම මේක පැහැදිලි කරන්නම්. හදිසියකදි ට්‍රැක්ටරයක පැච් එකක් ගියොත් ඒක ඉක්මනින් කෙරිය යුතු වැඩක්. සභාපතිතුමා, මන්ත්‍රීවරුන් එනකන් ඒක හදන්න ඉන්න බැහැ. එවැනි අවස්ථාවක එය සකස් කර ගැනීමට අපි නිලධාරීන්ට බලය ලබා දෙන්න ඕනෙ. සාමාන්‍යයෙන් මෙහිදී කෙරෙන්නෙ මේ රු. 20000/- අපි සුළු මුදල් වශයෙන් නිකුත් කරනවා. සියළු නීත්‍යානුකුල කටයුතු නිලධාරීන් විසින් අනුගමනය කරල කරපු දේවල් පිලිබඳ වාර්තාවක් අපිට දෙනවා. ඒ වාර්තාව අපි සභාවට ඉදිරිපත් කරන්නම්.

<u>ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි එහෙමනම් ඕකෙ අග්‍රිමය කියන වචනය ඇතුලත් වෙන්න ඕනෙ. එහෙම නැත්නම් සභාවෙ අනුමැතිය ලබා ගන්නා තෙක් ආවරණ අනුමැතියක් ලෙස මේක වෙනස් වෙන්න ඕනෙ.

<u>*තීරණය*</u>

**නගර සභාවේ හදිසි සහ අත්‍යාවශ්‍ය කටයුතු වෙනුවෙන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව වටිනාකම රු. 20000/- ක උපරිමය නොඉක්මවන කිසියම් සැපයුම් හා සේවා, අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා බලය දීම, අවශ්‍ය පරිදි මිල ගණන් කැඳවීම හා ඇගයීම සිදු කිරීම සඳහා සභාපතිවරයාගේ අනුදැනුම මත සභාවේ වැඩ බලන ලේකම් බී.ඒ. ධම්මිකා මහත්මිය වෙත බලය පැවරීමේ යෝජනාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.01.05 නගර සභාවේ වැඩ බලන ලේකම් බී.ඒ. ධම්මිකා මහත්මිය විසින් සකස් කරන ලද පරිපාලන යෝජනාව**

නගර සභාවේ දෛනික කටයුතු කාර්යක්ෂම ලෙසින් පවත්වාගෙන යාම සඳහා වටිනාකම රු. 1000/- උපරිමය නොඉක්මවන ගෙවීම් අනුමත කිරීම සඳහා නගර සභා ආඥා පනතේ 223 වගන්තිය ප්‍රකාරව සභාවේ වැඩ බලන ලේකම් බී.ඒ. ධම්මිකා මහත්මිය වෙත බලය පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ යෝජනාව කරේ අපි හිතමු සේවකයෙක් පැය දෙක තුනක් අතිකාල කරල තියෙනව කියලා. මුදල රු. 500 ක් නම් ඒක අනුමත කරන්නත් මට එවනව. එහෙම එවන්නෙ නැතිව ඒ දේ කරන්න ලේකම් තුමියට බලය දෙන්න කියලයි සභාවෙන් ඉල්ලන්නෙ.

<u>තීරණය</u>

නගර සභාවේ දෛනික කටයුතු කාර්යක්ෂම ලෙසින් පවත්වාගෙන යාම සඳහා වටිනාකම රු. 1000/- උපරිමය නොඉක්මවන ගෙවීම් අනුමත කිරීම සඳහා සභාවේ වැඩ බලන ලේකම් බී.ඒ. ධම්මිකා මහත්මිය වෙත බලය පැවරීමේ යෝජනාව **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.01.06 නගර සභාවේ වැඩ බලන ලේකම් බී.ඒ. ධම්මිකා මහත්මිය විසින් සකස් කරන ලද පරිපාලන යෝජනාව**

2018- 04- 23 දිනැති නගර සභා ක්‍රීඩා කමිටුවේ ඉල්ලීම පරිදි 2018-05- 23 ක්‍රීඩා කමිටුවට ධීවර සංකීර්ණයෙහි භුක්තිය ලංකා ධීවර සංස්ථාවට භාරදීම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. එහිදී නැවත ධීවර සංකීර්ණය අම්බලන්ගොඩ නගර සභාව වෙත පවරා ගැනීම සඳහා ධීවර අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කිරීම සුදුසු බවට තීරණය කරන ලද බැවින් එසේ ඉල්ලුම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>තීරණය</u>

ධීවර සංකීර්ණය නැවත අම්බලන්ගොඩ නගර සභාව වෙත පවරා ගැනීම සඳහා ධීවර අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කිරීම සුදුසු බවට තීරණය කරන ලද බැවින් එසේ ඉල්ලුම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනමේ යෝජනාව **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**5:2 ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා:**

**05.02.01** **<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>**

" කරිත්තකන්ද වසමේ ජනතාවට පොදුවේ සේවා සපයන ග්‍රාමසේවක, ආර්ථික සේවා නිලධාරී, නාගරික මන්ත්‍රී යන නිලධරයන් සඳහා ද ගම් වැසියන්ට අත්‍යාවශ්‍ය ප්‍රජාශාලා ගොඩනැගිල්ල අප සභාව සතු කාය වර්ධන මධ්‍යස්ථානයේ පළමු මහලේ ගොඩනැංවීමට මෙම සභාවට යෝජනා කර සිටිමි. "

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් යෝජනා කළ අතර ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මන්ත්‍රීවරුනි මම මේ යෝජනාව කරන්න ඉදිරිපත් වුනේ හැම ග්‍රාමසේවා වසමකම රාජ්‍ය නිලධාරීන් කීප පොලක් ඉන්නවා. අපි විශ්වාස කරනවා ජනතාවට හොදම සේවයක් සපයන්න ඒ සියළු නිලධාරීන් එකම ස්ථානයක ස්ථාපනය කිරීම. ඒ සදහා අපට භූමිබාගයක් තිබියදි එය නොකර සිටීම ජනතාවට කරන අඩුවක්. ඒවගේම කරිත්තකන්ද කොට්ඨාශය තුල මරණාධාර සමිතියක්, සුභ සාධක සමිතියක්, යහසාධක සමිතියක් තියෙනවා. ඒවා වෙනත් ස්ථාන වල පවත්වන්නෙ. ඒ අයට විශාල පහසුවක් වෙනව මේ දේවල් එක තැනකදි සිදු කරන්න පුළුවන්නම්.මම ප්‍රදේශවාසීන් සමග සාකච්ඡා කරලයි මේ යෝජනාව කරේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ඒ යෝජනාව ගැන මගෙත් අදහසක් තියෙනවා. අපේ කළුවඩුමුල්ල ග්‍රාමයටත් ඒවගේ ස්ථානයක් ලබා ගන්න අදහසක් තිබුණා. සරත් මන්ත්‍රීතුමාගෙ යෝජනාවට කැමති වෙනවා. ඒවගේම කළුවඩුමුල්ලටත් එවැනි ස්ථානයක් සභාවෙන් ලබා දෙනවනම් ඉතා වටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. අයිරාංගනී ද සිල්වා මහත්මිය කතා කරමින්</u>**

සභාපතිතුමනි මෙම ගොඩනැගිලි සෑදීම සම්බන්ධව ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු වජිර අබේගුණවර්ධන මැතිතුමා ඕනැම වෙලාවක සූදානමින් ඉන්නවා රජයේ නිලධාරීන්ට ලොඩනැගිල්ලක් හදල දෙන්න. ඇමතිතුමා හැම වෙලාවෙම කියනවා අදාල කොට්ඨාශෙට එකක් දෙනව කියලා. අපි එහෙම ඉල්ලීම් කරමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි පහුගිය අවුරුද්දෙ අන්තිම මාස 4 දි හයක් හදල ඉවර කරා. තව 5 කට සල්ලි ලැබිල තියෙනවා ගෝනපිනුවල ප්‍රාදේශීය ලේකම් වසම තුල. අම්බලන්ගොඩ අපට ඉඩම් සොයා ගන්න බැරිවුනා. එකකට මිලියන 2 බැගින් වජිර අබේගුණවර්ධන මැතිතුමා ලබල දුන්නා. ඉඩම රජයේ එකක් විය යුතුයි. එහෙම වුනොත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි මහ අම්බලන්ගොඩ තියෙනවා ප්‍රදේශවාසීන් පරිහරණය නොකරන ළිං. සියළුදෙනාටම ජල පහසුකම් තිබෙන නිසා මේව ප්‍රයෝජනය ගන්නෙ නැහැ. ග්‍රාම නිලදාරී, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී, සමෘද්ධි නිලධාරීතුමිය ඒ සියළු දෙනා වෙනත් ගෙවල්වල ඉන්න කොට එතැනට ගිහින් කතා කරන්න තියෙන අවස්ථාව බොහෝවිට අඩුයි. එනිසා අපේ ලක්ෂ්මි හේමන්තා මන්ත්‍රීතුමියගෙ සහයෝගය අරගෙන මහ අම්බලන්ගොඩ පියස සෑදීමේ කටයුතු මම ඉෂ්ට කරනවයි කියල ප්‍රකාශ කරමින් ඉඩම ලබාගැනීම සම්බන්ධව ඔබතුමාගෙ සහාය බලාපොරොත්තු වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>

සභාපතිතුමනි නිලානි මන්ත්‍රීතුමියගේ ප්‍රකාශය සම්බන්ධව මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. එතුමියයි මමයි දෙන්නම ඉන්නෙ එකම වසමෙ. සභාපතිතුමනි මම ඔය ළිද සම්බන්ධව මීට පෙරත් ඔබතුමාට කිව්ව. මේ ළිද ආසන්නයේම ඉන්න අය ඒ ළිද අල්ලල. මේ අය අපේ පාක්ෂිකයො. මට ඡන්දෙ නැතිවෙයි. මම කිසි දවසක එහෙම ආරක්ෂා කරන්න නෙමෙයි මෙතෙන්ට ඇවිත් තියෙන්නෙ. ඒගොල්ලො ළිදත් එක්ක පාරටම වැට ගහල. අඩි නමයක විතර අනවසර ඉදිකිරීමක් හදල මට ගෙදරට ඇවිල්ල කියනව අරයගෙ එක කඩන්න. මෙයාගෙ එක කඩන්න කියලා. එනිසා මම හිතනවා එතන සුදුසුම තැන කියලා. එතන පර්චස් 2.5 ඒ අයට තියෙන්නෙ. මම හිතනවා ඒ කොටස වෙන් කරල වැට ගැහුවම අපිට එතන මේ පියස හදන්න පුළුවන් කියලා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීතුමිය යෝජනාවට අදාලව කතා කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>

සභාපතිතුමනි මේක යට ගහන්න එපා. අපේ පාක්ෂිකයොයි කියල එහෙම කරන්න බැහැ. අපි ඊලග සභාවට ඒ සම්බන්ධව යෝජනාවක් ගේනව.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නිලානි මන්ත්‍රීතුමියට මේක විසදල දෙන්න පුළුවන්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

සභාපතිතුමනි ඔබතුමා කියනවා මන්ත්‍රීවරුන්ට වැඩ කරන්න බලය දෙන්න කියලා. මොකක්හරි ප්‍රශ්නයක් වෙලාවෙදි අපේ පැත්තට බෝලෙ පාස් කරනවා. ගරු මන්ත්‍රීතුමිය කිව්ව වගේ මේ පිළිබඳව වාර්තාවක් ගත්තනම් ඒ පිළිබඳව කටයුතු කරන්න කියල. අපිට ඒ භූමිය ලබා දුන්නොත් මම ප්‍රධාන අමාත්‍යතුමාගෙන් හරි ජනාධිපතිතුමාගෙන් හරි ප්‍රතිපාදන අරගෙන මේ කටයුත්ත ක්‍රියාවට නංවනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සරත් ශ්‍රීලාල් මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව කාලෝචිතයි. කොට්ඨාශ 13 ම ඔය ප්‍රශ්නෙ තිබෙනවා සභාපතිතුමනි. රාහුල මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නෙ නගර සභාව හරහා විසඳගත්තා. ඒ ගැන අපි සතුටු වෙනවා. නගර සභාව සතු ඉඩම් කොටස් තිබෙනවා නම් ඒ අවසරය අපි ලබල දෙමු. ලබල දීල ඒ කාර්ය ඉටු කර ගන්න බලමු.

__ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්__

සභාපතිතුමනි පොල්වත්තෙ ප්‍රජා ශාලාවට ප්‍රධාන අමාත්‍යතුමා මුදල් දෙනවයි කිව්ව. ඒ මුදල් ආව 2016 විතර. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගෙ ක්‍රියාකලාපය නිසා තමයි ඒ මුදල් නැවත වරක් නැති වුනේ. ප්‍රධාන ඇමතිතුමා ලක්ෂ 50 ක් එව්වා. කව්රුවත් ඒක දන්නෙ නෑ. ඇමතිතුමා සල්ලි දෙනවා පොල්වත්ත ප්‍රදේශයට මේ වැඩේ කරන්න.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

ඔය ඉඩම දකුණු පළාත් අමාත්‍ය මණ්ඩල තීන්දුවකින් අපට පවරල තියෙන්නෙ. ඒනිසා ප්‍රාදේශීය ලේකම් එකට නෙමෙයි නගර සභාවට එවන්න කියන්න සල්ලි. එතකොට අපි ක්‍රියාත්මක කරමු. මේ බිම තියෙන්නෙ කළුවඩුමුල්ල පැත්තට. නමුත් පොල්වත්තට සේ සලකා වැඩේ කරමු.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

සරත් ශ්‍රීලාල් මන්ත්‍රීතුමාගෙ යෝජනාව සම්බන්ධව අපි ඉල්ලා සිටිනවා රාජ්‍ය පරිපාලන අමාත්‍යතුමාගෙන් ප්‍රතිපාදන ලබා ගන්න පුළුවන්නම් ඒ විදියට කරන්න කියලා.

__ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි මා විසින් ගෙනෙන ලද යෝජනාව සම්බන්ධයෙන් සියළුම මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා විසින් අදහස් ඉදිරිපත් කිරීම සම්බන්ධව මා ඉතාම ස්තුතිවන්ත වෙනවා. ඒවගේම ගරු විපක්ෂනායක තුමා ඇතුළු එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමෙනුත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු සියළු දේශපාලන පක්ෂ නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලාගෙන් මා ඉල්ලා සිටිනවා එතුමන්ලාට හැකියාව තිබෙනවා නම් මන්ත්‍රීතුමන්ලා හෝ ඇමතිතුමන්ලා හරහා නගර සභාවට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න කියලා. ඔබ සියළු දෙනාට මම ස්තුතිවන්ත වෙමින් නවතිනවා.

__තීරණය__

කරිත්තකන්ද වසමේ ජනතාවට පොදු සේවා සපයන ග්‍රාමසේවක, ආර්ථික සේවා නිලධාරී, නාගරික මන්ත්‍රී යන නිලධරයන් සඳහා ද ගම් වැසියන්ට අත්‍යාවශ්‍ය ප්‍රජාශාලා ගොඩනැගිල්ල

සභාව සතු කාය වර්ධන මධ්‍යස්ථානයේ පළමු මහලේ ගොඩනැංවීමේ යෝජනාව ගරු **මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

- **පෙ.ව. 11.30 පමණ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.**
- ප.ව. 12.20 ට පමණ කාරක සභාව අවසන් කරන ලදී.

**05.02.02** <u>ගරු නගර සභා මන්ත්‍රීවරුන් වන ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා, ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මහතා, නන්දන රාජපක්ෂ මහතා, ඩී. ධර්මදාස මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>

" ගැසට් නිවේදනයක් මගින් පළාත් පාලන ආයතන සභිකයන් සඳහා ලබා දෙනු ලබන මාසික රුපියල් තුන්දහසේ ඉන්දන දීමනාව ආර්ථික පරිපීඩාවන්ගෙන් පෙළෙන ඉල්ලුම්කරනු ලබන ගරු මන්ත්‍රීවරුන්හට ලබා දීම සුදුසු යයි ගරු සභාවට යෝජනා කර සිටිමු. "

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මෙය අනවශ්‍ය අය නොගෙන ඉදීවි. අවශ්‍ය කෙනාට අවස්ථාව ලබා දෙන්න කියල ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මමත් මේකට එකග වෙනවා. මෙතන ආර්ථික පරිපීඩාවෙන් පෙළෙන කියන වචනයට මම එතරම් කැමති නැහැ. ඒක මන්ත්‍රීවරුන්ට එතරම් ගැලපෙන්නෙ නැහැ. මටත් මේක අවශ්‍යයි. එනිසා මෙය ලබා දෙන්න කියල ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

සභාපතිතුමනි මමත් කියනවා අවශ්‍යයි කියලා. මටත් කොළඹ ඉදන් එන්න වියදම් යනවා.

<u>තීරණය</u>

ගැසට් නිවේදනයක් මගින් පළාත් පාලන ආයතන සභිකයන් සඳහා ලබා දෙනු ලබන මාසික රුපියල් තුන්දහසේ ඉන්දන දීමනාව ඉල්ලුම්කරනු ලබන ගරු මන්ත්‍රීවරුන්හට ලබා දීමේ යෝජනාව ගරු **මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.02.03** <u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. කේ. ජී. පී. දයානන්ද මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව**</u>

" අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ කසල එකතු කරන සෞඛ්‍ය අංශයේ සේවක මහත්වරුන් කසළ එකතු කිරීමේදී කුණු - කුණු යනුවෙන් කෑ ගසමින් කරන සංඥාව වෙනුවට එම වාහනවල බැටරියෙන් බලය සපයන නගර වැසියන්ට හිරිහැරයක් නොවන ශබ්දයක් සහිත සංඥා නලාවක් සවිකර දී ඔවුන්ට පහසුවක් සළසන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි. "

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි අද අපි රැස්වෙලා ඉන්නෙ වැදගත් දිනයක. එනම් ලෝක පරිසර දිනය අද. ඒ වෙනුවෙන් කුඩා හෝ පියවරක් තබන්න මෙම යෝජනාව ක්‍රියාවට නැගීමෙන් නගර සභාවට හැකි වෙනවා. මෙය ක්‍රියාවට නගන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින අතර එම ක්‍රියාව දිගටම නඩත්තු කරන ලෙසද ඉල්ලා සිටිනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි මේක කාලෝචිත යෝජනාවක්. අපි මේ ක්‍රියාව කලිනුත් සිදු කරා. කුමක් හෝ හේතුවක් උඩ ගලවා ඉවත් කරා. මම හිතන්නෙ ගබඩාවෙ ඇති.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේව අපි ගාව තියෙනවා ගබඩාවෙ. ඒ ශබ්දයත් පාන් විකුණන වාහනවල ශබ්දයත් එක වගේ. ඒ නිසා ජනතාවගත් පැමිණිලි ආව ගලවන්න කියලා. ඒකයි ගැලෙව්වෙ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි අපේ ප්‍රදේශයේ නම් වාහනයේ නලාව ශබ්ද කරමින් යනවා. දැන් මිනිස්සුන්ට ඒක හුරුවෙලා තියෙන්නෙ.

<u>**තීරණය**</u>

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ කසල එකතු කිරීමේදී කුණු - කුණු යනුවෙන් කෑ ගසමින් කරන සංඥාව වෙනුවට එම වාහනවල බැටරියෙන් බලය සපයන නගර වැසියන්ට හිරිහැරයක් නොවන ශබ්දයක් සහිත සංඥා නලාවක් සවිකිරීමේ යෝජනාව ගරු **මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**(6)** **කාරක සභා වාර්තා සලකා බැලීම**

**6: 1** **2018- 05- 21 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව.**

**2018 මැයි මස 21 වන දින පුස්තකාල කමිටු වාර්තාව**

| | |
|---|---|
| ▪ ගරු සභාපති | ඇම්.ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා |
| ▪ ගරු උප සභාපති | ඩබ්ලිව්. කමල් ද සිල්වා මහතා |
| ▪ ගරු නගර සභා මන්ත්‍රී | ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා |
| ▪ ගරු නගර සභා මන්ත්‍රී | නන්දන රාජපක්ෂ මහතා |
| ▪ ගරු නගර සභා මන්ත්‍රී | ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා |
| ▪ ගරු නගර සභා මන්ත්‍රීනි | එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මිය |
| ▪ ගරු නගර සභා මන්ත්‍රී | ධනසේන මාදුවගේ මහතා |
| ▪ ගරු නගර සභා මන්ත්‍රී | කේ.ජී.ජී.දයානන්ද ද සිල්වා මහතා |
| ▪ ලේකම් | බී.ඒ.ධම්මිකා මිය |
| ▪ කමිටු සාමාජික | ජේමසිරි රතුවඩු මහතා |
| ▪ කමිටු සාමාජික | ටී.ඩබ්ලිව්.හරිස්චන්ද්‍ර මහතා |
| ▪ කමිටු සාමාජික | ජී.ඩබ්ලිව්.ගුණසිරි මහතා |
| ▪ කමිටු සාමාජික | ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා |
| ▪ කමිටු සාමාජික | සිරිපාල මාදුවගේ මහතා |
| ▪ කමිටු සාමාජික | එම්. ඒ. ජයවීර මහතා |
| ▪ කමිටු සාමාජික | සුගත් හෙට්ටිආරච්චි මහතා |
| ▪ කමිටු සාමාජික | එන්.එච්.ඩන්කන් මහතා |
| ▪ කමිටු සාමාජික | හර්බට් වීරක්කොඩි මහතා |
| ▪ ප්‍රජා සංවර්ධන නිලධාරී | ඩී.වී.තරංගි මිය |
| ▪ පුස්තකාලයාධිපතිනිය(ගා/ධර්මාශෝක විදුහල) | පී.වයි.චම්පිකා ඉන්දුමතී මෙනවිය |
| ▪ පුස්තකාලයාධිපතිනිය | කේ.ඩබ්ලිව්.රංජනි මානෙල් මෙනවිය |
| ▪ පුස්තකාල සහායිකා | කේ.ඒ.විසුද්ධි රේණුකා මිය |
| ▪ පුස්තකාල සහායිකා | එස්.සුසිලා දීපානි මිය |

- පුස්තකාල සහායිකා ඒ.ජී.ලක්ෂ්මී පෙරේරා මෙනවිය
- පුස්තකාල සහායිකා මාලති සමන්තා ආරියසිංහ මිය
- පුස්තකාල සහායිකා ඒ.ජී.රසිකා මිය
- පුස්තකාල සහායිකා එස්.එම්.මනෝරී චන්ද්‍රවංශ මිය
- පුස්තකාල සහායක ඒ.ඩබ්ලිව්. ඉන්ද්‍රදාස මහතා

**අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා මූලාසනය දැරූ 2018/05/21 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව**

ගරු උප සභාපතිතුමා කමිටුවට පැමිණීමෙන් පසුව ප.ව.3.00 ට පුස්තකාල කමිටුවේ වැඩකටයුතු ආරම්භ කරන ලදී.

- එතුමා විසින් කමිටුවට පැමිණි නගර සභා මන්ත්‍රීන් කමිටු සාමාජික මහතුන් සහ ලේකම්තුමිය ඇතුළු සියලුම මහත්ම මහත්මීන් පිළිගන්නා ලදී
- ටුක්කාවඩු පියසිරි මහතා කමිටුවට සහභාගී වීමට නොහැකි බව දන්වා ලිපියක් එවා තිබූ අතර උපසභාපතිතුමා විසින් එය කමිටුවට ඉදිරිපත් කරන ලදී.
- පුස්තකාල ප්‍රගති වාර්තා කමිටුවට පැමිණි සියලුම මහත්ම මහත්මියන්ට ලබා දීම පළමුව සිදු කරන ලදී.
- හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලය සඳහා කමිටු සාමාජික මහතකු නම් කර නොමැති බැවින් ඒ සඳහා හෙප්පුමුල්ල නගර සභා කොට්ඨාශය භාර ගරු නගර සභා මන්ත්‍රීතුමාට සුදුසු පුද්ගලයකු නම් කර එවන ලෙස ගරු උපසභාපතිතුමා කමිටුවට දන්වන ලදී.
- හිරේවත්ත ශාඛා පුස්තකාලයේ ප්‍රගතිය අඩු බව පෙනී යන බැවින් එම පුස්තකාලයෙන් පාඨකයන් ප්‍රයෝජනයක් ලබා ගෙන නොමැති බවත් යන කරුණු මත ගතයුතු පියවර පිළිබඳ සාකච්ඡා කරන ලදී. එහිදී තීරණය වූයේ එම පුස්තකාලය පාඨකයන්ගේ පරිහරණය සඳහා ඉදිරියටත් පවත්වා ගැනීම සුදුසු බවය.
- දකුණු පළාත් සංවර්ධන අධිකාරිය මගින් සංවිධානය කරන ලද පොත් ප්‍රදර්ශනය සම්බන්ධ ලිපිය පුස්තකාල කමිටුවට ඉදිරිපත් කිරීම සිදු වූ අතර එහිදී උපසභාපතිතුමා යෝජනා කළේ රුපියල් ලක්ෂයක පමණ මුදලක් වැය කර පොත් මිලදී ගැනීම සුදුසු බවය.
- ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා යෝජනා කළේ විලේගොඩ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා පුස්තකාලයක් ලබා දීම සුදුසු බවය. ඒ සඳහා ස්ථානයක් නොමැති බැවින් අ.ම.කරුණාරත්න දෙටු පුරවැසි පියස සුදුසු වුවත් එය ලබා ගැනීම නුසුදුසු බව පෙනී යන බැවින් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි බවය.
- චන්ද්‍රා මාලනී ද සිල්වා මහත්මියගේ ලිපිය සභාවට ඉදිරිපත් කර අතර එහිදී එම මහත්මිය එම ලිපියෙන් ඉල්ලා සිටියේ පුස්තකාල කමිටුවට සම්බන්ධ වීමට කැමති බවය. එහිදී තීරණය වූයේ දැනට පුස්තකාල කමිටු සාමාජික සංඛ්‍යාව ප්‍රමාණවත් බැවින් එය ඉටු කිරීමට නොහැකි බව පුස්තකාල කමිටුවේදී

තීරණය විය. ඒ බව දන්වා එම මහත්මියට ලිපියක් යවන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරීතුමියට උපදෙස් දෙන ලදී.

- ගරු සභාපතිතුමා පුස්තකාල කමිටුවට සහභාගී වීමෙන් පසුව කමිටුවේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යන ලදී.

- ජාතික කියවීමේ මාසයේ ඇස්තමේන්තුව පුස්තකාල කමිටුවට ඉදිරිපත් කිරීමෙන් පසුව ඒ සඳහා වැයවන මුදල ත්‍යාග සහ සහතික පත්‍ර සඳහාද, ප්‍රධාන ආරාධිත දේශනය, සංග්‍රහ කටයුතු ආදියට වැයවන මුදල් ප්‍රමාණය පිළිබඳ සාකච්ඡා කරන ලදී.

- ජාතික කියැවීමේ මාසයේ ප්‍රධාන ආරාධිත දේශනය සඳහා කමිටු සාමාජික මහත්ම මහත්මීන්ගෙන් අදහස් හා යෝජනා ඉදිරිපත් කරන ලෙස සභාපතිතුමා කමිටුවට දන්වන ලදී. එහිදී යෝජනා රැසක් ඉදිරිපත් වූ අතර අවසාන වශයෙන් ජේ.බී.දිසානායක මහතා ප්‍රධාන දේශනයට සහභාගී වීම සුදුසු බව තීරණය විය. එහිදී එම දේශනය සඳහා දිනයක් වෙන් කිරීම සහ එතුමාගේ පැමිණීම පිළිබද සාකච්ඡා කිරීමට ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතාට පවරන ලදී.

- ජාතික කියැවීම් මාසයේ පැවැත්වෙන තරග සඳහා ස්ථානයක් වෙන් කිරීම පිළිබඳ සාකච්ඡා වූ අතර ඒ සඳහා කරිත්තකන්ද විහාරස්ථාන ශාලාව යොදා ගැනීම සුදුසු බව යෝජනා විය.

- ජාතික කියැවීමේ මාසයේ පැවැත්වෙන සාහිත්‍ය උත්සවය පැවැත්වීමට කුලරත්න විද්‍යාලීය ශාලාව සුදුසු බවත් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට ප්‍රජා සංවර්ධන නිලධාරීතුමියට සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

- පසුගිය පුස්තකාල කමිටුවේදී තීරණය වූ පරිදි ප්‍රධාන හා ශාඛා පුස්තකාල සඳහා අවශ්‍ය පොත් රාක්ක ප්‍රමාණය පිළිබඳ කමිටුවට ඉදිරිපත් කරන ලෙස ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා පුස්තකාලයාධිපතිනිය ඇතුළුව පුස්තකාල සහායිකාවන්ට දන්වන ලදී. එහිදී සභාපතිතුමා දන්වා සිටියේ අවශ්‍ය ප්‍රමාණ පිළිබඳ සොයා බලා ඒවා ලබා දීමට සුදුසු පියවරක් ගන්නා ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරීතුමියට උපදෙස් දෙන ලදී.

- සිරිපාල මාදුවගේ මහතා විසින් පුස්තකාල කමිටුවට යෝජනා කළේ අපේ රටේ ජ්‍යොෂ්ඨ නායකයන්ගේ හා විවිධ සොයා ගැනීම් සිදු කල පුද්ගලයන්ගේ පින්තූර සහ විස්තර අනුව සකස් කරන ලද පුවරු ප්‍රදර්ශනය කිරීම මඟින් මතු පරපුරේ දැනුම වර්ධනය කල හැකි බවය. ශාඛා පුස්තකාලවල පවත්වාගෙන යනු ලබන බිත්ති පුවත්පත මේ සඳහා යොදා ගැනීම සුදුසු බවත් එම සහායිකාවන්ට එම මහතාගේ උපදෙස් ලබා ගෙන සෑම මසකටම වරක් එය ක්‍රියාත්මක කරන ලෙසත් සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

- පුස්තකාලය සඳහා අලුතින් පොත් මිළදී ගැනීම සෑම පාඨක අදහස් පොතකම ලියවී ඇති බැවින් රුපියල් දෙලක්ෂ පනස්දහසක පොත් ලබා ගැනීම සුදුසු බව සභාපතිතුමා කමිටුවට දන්වන ලදී. කමිටු සාමාජික මහතකු සමග ගොස් 30% වට්ටම් සහිතව පොත් ලබා ගැනීම සිදුකරන ලෙස දන්වන ලදී.

  මේ සඳහා සහභාගී වීමට කමිටු සාමාජික හර්බට් වීරක්කොඩි මහතාගේ නම යෝජනා විය. මැයි මස 30 වන දින මේ සඳහා යොදා ගැනීම සුදුසු බව ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය කමිටුවට දන්වන ලදී.

- ධර්මාශෝක විද්‍යාලයෙන් පැමිණි පුස්තකාලයාධිපතිනිය පාසල් ළමුන්ට අවශ්‍යය පොත් ලැයිස්තුවක් කමිටුවට ඉදිරිපත් කරන ලදී. ඉහත සඳහන් පොත් මිළදී ගැනීමට එම පොත් ලැයිස්තුව යොදා ගැනීම සුදුසු බව සභාපතිතුමා කමිටුවට දන්වන ලදී.

- ශාඛා භාර පුස්තකාල සහායිකාවන් විසින් ශාඛා පුස්තකාලවල ඇති අඩු පාඩු කමිටුවට ඉදිරිපත් කරන ලදී. එම අඩු පාඩු නිරීක්ෂණය කොට ඉදිරිපත් කරන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරීනියට උපදෙස් දෙන ලදී.

- සිරිපාල මාදුවගේ මහතා විසින් පුස්තකාල කමිටුවට සභාවාර තුනකට වඩා නොපැමිණියේ නම් එම කමිටු සාමාජිකයාගේ සාමාජිකත්වය අහෝසි කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

- ගබඩාවට භාර දී ඇති පුස්තකාල වලින් ඉවත් කරන ලද පොත් ගබඩාව ඉදිරිපස ගොඩ ගසා තිබෙන්නේ කුමක් නිසාද යන්න ගරු සභාපතිතුමා කමිටුවේදී පුස්තකාලාධිපතිනියගෙන් විමසන ලදී. එතුමිය පැවසුවේ විනාශ කිරීම සඳහා ඇති පොත් බවත් හිටපු ලේකම්තුමිය එම පොත් වෙන්දේසි කිරීම සඳහා උපදෙස් දී තිබූ අතර, නමුත් වෙන්දේසි කමිටුව විසින් පොත් වල පුස්තකාල මුද්‍රව(සීල්) ගසා තිබෙන බැවින් වෙන්දේසි කිරීම නුසුදුසු බව තීරණය කරන ලද බව පැවසීය. ඒ සඳහා ගතයුතු ක්‍රියා මාර්ගය පිළිබද ගරු සභාපතිතුමා විසින් කමිටුවට ඉදිරිපත් කර අතර එහිදී යෝජනා වූයේ විනාශ කිරීමට සුදුසු නොවන බවය. මේ පිළිබඳ තීරනයක් ගැනීම සඳහා සභාවට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු උපසභාපතිතුමා විසින් ස්වෙච්ඡාවෙන් කමිටුවට පැමිණි සියලුම මහත්ම මහත්මියන්ට ස්තුතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

............................................
කමිටු ලේකම්
නගර සභාව අම්බලන්ගොඩ

| | |
|---|---|
| ............................................... | .......................................... |
| ලේකම් | අත්සන් කළේ සභාපති |
| නගර සභාව අම්බලන්ගොඩ | නගර සභාව අම්බලන්ගොඩ |

**2018- 05- 21 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණිය මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි පුස්තකාලයේ ඉවත් කරන පොත් විනාශ නොකර අපේ දහම් පාසල් වලට, පාසල් වලට යන දරුවන්ට දෙන්න පුළුවන්නම් වටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙව කාටහරි ප්‍රයෝජනයක් ගන්න කෙනෙකුට දෙන්න පුළුවන්. මෙතන ප්‍රශ්නෙ තියෙන්නෙ පුස්තකාලෙ සීල් ගහල තියෙන්නෙ. ඒක නිසයි මේ අය ගිනි තියන්න හදන්නෙ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංලනී මහත්මිය කතා කරමින්</u>

සභාපතිතුමනි කවුරුහරි ප්‍රයෝජනයක් ගනීවිනෙ.ඒක දෙන්න.

ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්

සභාපතිතුමනි ඕකන්ද පුස්තකාලයේත් අඩුපාඩු වගයක් තියෙනවා. ඒ ටික ඉටු කරන්න කියා ඉල්ලා සිටිනවා.

**ඒ අනුව 2018 -05- 21 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය'**

**6: 2 2018- 05- 18 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව**

පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව
**2018.05.18. ප.ව.2.30**

සහභාගීත්වය

| | | |
|---|---|---|
| **1.** | ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප්. | ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව. |
| **2.** | ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව. |
| **3.** | ජී.ජී රුවිනි පේෂලා | ගරු නගර සභා මන්ත්‍රිනී, අම්බලන්ගොඩ නගර සභාව. |
| **4.** | ර්.ඇම් ඉන්ද්‍රා අයිරාංගනී | ගරු නගර සභා මන්ත්‍රිනී, අම්බලන්ගොඩ නගර සභාව. |
| **5.** | බී.ජ් ධම්මිකා. | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව. |
| **6.** | එම්.පී.බී ඩබ්.යූ කුමාරි | ආයුර්වේද වෛද්‍ය නිලධාරී, අම්බලන්ගොඩ නගර සභාව. |
| **7.** | ඩී.එන්.ඉසඩ් අබේසිරිවර්ධන | මහජන සෞඛ්‍ය පරික්ෂක, අම්බලන්ගොඩ දකුණ. |
| **8.** | බී.එම්.යූ.කේ ප්‍රනාන්දු (මහේෂ්) | මහජන සෞඛ්‍ය පරීක්ෂක ,අම්බලන්ගොඩ උතුර. |
| **9.** | ඩී.එස්.ර් ගමගේ. | පවුල් සෞඛ්‍ය සේවිකා, සෞ.වෛ.නි කාර්යාලය. |
| **10.** | වීමා ආර් ගාල්ලගේ. | ග්‍රාම නිලධාරී, 83, කරිත්තකන්ද. |
| **11.** | ටී.ඒ.සී.එන් කුමාරි | ග්‍රාම නිලධාරී, 83ඒ, හෙප්පුමුල්ල. |
| **12.** | පී.එච් කුමාර ද සිල්වා | ග්‍රාම නිලධාරී, 86 ඒ, කළුවඩුමුල්ල/පොල්වත්ත. |
| **13.** | එච්.එම්.ටී.එච්.ද.සිල්වා | ග්‍රාම නිලධාරී,86 බී, ඕකන්ද. |
| **14.** | එච්.එල් ද සිල්වා නීලමුණි | තාක්ෂණ සේවා නිලධාරී. |
| **15.** | පී.එම් විජේසිංහ | තාක්ෂණ සේවා නිලධාරී. |
| **16.** | පී.එච්.එල්.සී පුෂ්පරාණි | සංවර්ධන සහකාර. |
| **17.** | ඒ.අයි සාරංග | සෞඛ්‍ය පරිපාලක. |

පිළිගැනීම

ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා.සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන් ඇතුළු සියළු නිලධාරී මහත්ම මහත්මීන් හා නගර සභා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි.

| මාතෘකාව | ප්‍රකාශය කවුරුන් විසින් ද යන වග. | සාකච්ඡා වූ කරුණු. | තීරණය. |
|---|---|---|---|
| **2018.04.26 දින පැවති රැස්වීමේ සාකච්ඡා වූ කරුණු සමාලෝචනය.** | | | |
| පටබැඳිමුල්ල ග්‍රාම නිලධාරී කාර්යාලයට හා වැසිකිළියට ජල පහසුකම් ලබා දීම.<br><br>ඕකන්ද ප්‍රජා ශාලාව සඳහා ජල සම්බන්ධතාව ලබා දීම. | පුෂ්පරාණි මහත්මිය . | අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව. | කඩිනමින් එම ස්ථානවලට ජලය ලබා දීම. |
| පටබැඳිමුල්ල ප්‍රජාශාලාව සඳහා පුටු 50ක් ලබා ගැනීම. | පුෂ්පරාණි මහත්මිය. | මිල ගණන් කැඳවා ඇති බව. | 2018 ජුනි සභාවට මිල ගණන් ඉදිරිබත් කළ යුතු බව. |
| වෙරළ උද්‍යානයට වාහන ඇතුල් කිරීම වලක්වාලීම සඳහා බාධක සැකසීම. | | මෙතෙක් සිදු කර නොමැත | එම ඇස්තමේන්තුව කඩිනමින් සකස් කරන ලෙස තාක්ෂණ සේවා නිලධාරී නීලමුණි මහතාට උපදෙස් ලබා දෙන ලදි. |

| | | | | |
|---|---|---|---|---|
| කළුවඩුමුල්ල ග්‍රාමිණී විද්‍යාල ක්‍රීඩා පිටියේ දැල් ආවරණ කැඩී ඇති බැවින් එය අළුත්වැඩියා කිරීම. ළමා උදයානය අළුත්වැඩියා කළ යුතු බව. | | | ජුනි මස සභාවට ඇස්තමේන්තු ඉදිරිපත් කළ යුතු බවට තාක්ෂණ සේවා නිලධාරී වෙත කරන ලෙස උපෙදස් ලබා දෙන ලදි. | |
| කසල වෙන් කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම. | ගරු සභාපති, ඇම්.ඩබ්.අ රුණ ප්‍රදීප් මහතා. | කසල වෙන් කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා පළාත් නිශ්චිත යටතේ ලක්ෂ 20ක මුදල අනුමත වී ඇති බව. | ඇස්තමේන්තු සකස් කර ජුනි මස සභාවට ඉදිරිපත් කිරීම. | |
| ඕකන්ද කාණුවල ජලය නිසිලෙස බැස නොයන බව . | | ඉටු වී නොමැති බව | පරික්ෂා කර වාර්තා කරන ලෙස ම.සෞ.ප මහේෂ් මහතා වෙත උපදෙස් ලබා දෙන ලදි. | |
| පාරට අපදියර බැහැර කරන අයට එරෙහිව නඩු පැවරීමට කටයුතු කිරීම. | | | ම.සෞ.ප මහේෂ් මහතාට ඒ පිළිබඳ පරික්ෂා කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | |
| කොන්ක්‍රීට් කොම්පෝස්ට් බඳුන් මිලදී ගැනීම සඳහා පරිපාලන යෝජනාවක් සභාවට ඉදිරිපත් කිරීම. | | පරිපාලන යෝජනාවක් සකස් කර ඇත | . | |
| සුනඛ වන්ද්‍යාකරණ කටයුතු. | ගරු සභාපති, ඇම්.ඩබ්.අ රුණ ප්‍රදීප් මහතා | හබරාදූව ප්‍රදේශයේ පිහිටි සුනඛයින් ඇති කිරීමේ මධ්‍යස්ථානය වෙත අල්ලා ගෙනගොස් දැමීමේ හැකියාව පවතී ද | සෞඛ්‍ය කමිටුවට පශු වෛද්‍ය කැඳවීම. | |

| | | | |
|---|---|---|---|
| | | යන්න සොයා බැලීම. | |
| දැන්වීම් පුවරු සකස් කිරීම. | | නීති විරෝධී ලෙස කසල බැහැර කරන හඳුනාගත් ස්ථානවල දැන්වීම් පුවරු සවි කිරීම. | එම ස්ථානවල කඩිනමින් නාම පුවරු සවි කිරීම. |
| පටබැඳිමුල්ල සායන මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම. | ගරු සභාපති, ඇම්.ඩබ්ලිව් .අරුණ ප්‍රදීප් මහතා. | එහි ඇති බඩු බාහිරාදිය ආයුර්වේද ගොඩනැගිල්ල ට දැමීම, එම කාමරය ඉඩි යතුරු දමා වැසිය හැකි පරිදි සකස් කර ආරක්ෂාව සැපයීම. | අලුත්වැඩියා කිරීමේදී නගර සහා තාක්ෂණ සේවා නිලධාරීන්ගේ අධීක්ෂණය ලබා ගැනීම. |
| | සෞඛ්‍ය පරිපාලක ඒ.අයි.සා රංග මහතා | ටැක්ටර් සේදීම සඳහා ස්ථානයක් හා ජල පහසුකම් ලබා දෙන ලෙස. | හල්වතුර ඉඩමට ජල සම්බන්ධතා ලබා දීම හා එතෙක් තාවකාලික වතුර බවුසරයකින් ජලය සපයන ලෙස ලේකම් තුමියට උපදෙස් දෙන ලදි. |
| කසල අවසන් බැහැරලන භූමියට ප්‍රවේශ මාර්ගය සකස් කිරීම. | සෞඛ්‍ය පරිපාලක ඒ.අයි.සා රංග මහතා. | කසල බැහැර කිරීම සඳහා ඉඩමට යාමට අපහසු බැවින් එම මාර්ගය සකස් කර දෙන ලෙස. | |
| | ගරු සභාපති, ඇම්.ඩබ්ලි ව්.අරුණ ප්‍රදීප් මහතා. | **D 4 E** යන්ත්‍රය හා පස් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලෙස. | **D 4 E** යන්ත්‍රය කඩිනමින් යොදවන ලෙසත්, පස් සඳහා මිළ ගණන් හා ඇස්තමේන්තු සභාවට ඉදිරිපත් කරන ලෙස. |
| ආයුර්වේද මධ්‍යස්ථානයේ අඩුපාඩු | ආයුර්වේද වෛද්‍ය නිලධාරිනී එම්.පී.බී ඩබ්.යූ.කුමා | පිටුපස දොර ඉතා කඩිනමින් අලුත්වැඩියා තළ යුතු බව. | කඩිනමින් එය අලුත්වැඩියා කරන ලෙස තාක්ෂණ සේවා නිලධාරී වෙත උපදෙස් ලබා දෙන ලදි. |

| | | | | |
|---|---|---|---|---|
| | රි | | | |
| කසල වෙන් කිරීම. | ගරු සභාපති, ඇම්.ඩබ්ලිව් .අරුණ ප්‍රදීප් මහතා | ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වැඩසටහනක් සකස් කරන ලෙස. . | ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වැඩසටහනක් සකස් කිරීම. | |
| | ගරු නගර සභා මන්ත්‍රිනී, ඊ.ඇම් ඉන්ද්‍ර අයිරාංගනී මහත්මිය. | මහරගම ප්‍රාදේශීය සභාවේ දිරන කසල පමණක් දිනපතා එකතු කරන අතර නොදිරන කසල වෙනත් දිනක ලබා ගන්නා බව. | | |
| | ගරු නගර සභා මන්ත්‍රී, ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. | කසල වෙන් කර ලබා දෙන ලෙස නැවත ප්‍රචාරයක් ලබා දී අත් ටැක්ටරයක් මගින් සවස් වරුවේ නොදිරන කසල එකතු කිරීම සුදුසු බව. | කසල වෙන් කර ලබා දෙන ලෙස නගර වැසියන් දැනුවත් කිරිම හා එසේ නොකරන අයට එරෙහිව නඩු පැවරීම | |
| සේවකයන් ප්‍රමාණවත් නොවීම | ඒ.අයි.සා රංග. | රියදුරු 08ක් හා ටැක්ටර් රථ 10ක් තිබෙන අතර සෞඛ්‍ය අංශයේ සේවකයන් ප්‍රමාණවත් නොවීම. විශේෂ ව්‍යාපෘති සේවකයන්ට දැනට ගෙවන වැටුප ප්‍රමාණවත් නොවීම. | විශේෂ ව්‍යාපෘතිය සඳහා රියදුරකු බඳවා ගැනීම, විශේෂ ව්‍යාපෘතියේ සේවකයකුගේ දෛනික වැටුප කොපමණ ද යන්න සභාවට වාර්තාවක් ලබා දීම. | |
| | ගරු නගර සභා | බස් නැවතුම්පල වැනි ප්‍රධාන | | |

| | | | |
|---|---|---|---|
| | මන්ත්‍රීනී, ජී.ජී රුවිනි පේෂලා | ස්ථානවල කසල වෙන් කිරීමේ බඳුන් තැබීම තුළින් මෙම වැඩසටහන සාර්ථක කර ගත හැක. | |
| ටැක්ටරයක බැටරිය පුපුරා ඇති බව. | සෞඛ්‍ය පරිපාලක ඒ.අයි.සා රංග මහතා. | බැටරිය පුපුරා ඇති බැවින් විදුලි කාර්මිකයකු ලවා පරික්ෂා කර ගත යුතු බව | ගමනා ගමන මණ්ඩලයේ ඉංජිනේරු මහතකු ලවා පරික්ෂා කරවා ගැනීම. |
| පටබැඳිමුල්ල වෙරළ උද්‍යානයේ අසෝබන සිදුවීම් සිදුවන බව. | ගරු සභාපති, ඇම්.ඩබ්ලිව් . අරුණ ප්‍රදීප් මහතා. | වෙරළ උද්‍යානය සකස් කිරීමේ මූලික අරමුණ වූයේ රේල් පාරේ කතා කරන පෙම්වතුන්ට නිදහසේ කතා කිරීමට ස්ථානයක් සකස් කිරීම වුව ද අද එය නොයෙක් අපචාර සිදු වන ස්ථානයක් බවට පත් වී ඇති බවත් ඒ අම්බන්ධයෙන් ජනතාව අපට දොස් කියන බව. | පටබැඳිමුල්ල වෙරළ උද්‍යානයේ වැටකෙයියා පඳුරු පහළින් මුහුද පෙනෙන ආකාරයට ශුද්ධ නිරීම. |
| මුහුදු වෙරළ පවිත්‍ර කිරීම. | ගරු සභාපති, ඇම්.ඩබ්ලිව් . අරුණ ප්‍රදීප් මහතා. | විශේෂ ව්‍යාපෘතිය සඳහා සේවකයන් බඳවා ගනු ලැබුවේ මුහුදු වෙරළ පවිත්‍ර කිරීමත් ඇතුළුවයි. ඒ සඳහා දිනපතා සේවකයෙන් යොදවන්න. | මුහුදු වෙරළ පවිත්‍ර කිරීම සඳහා දිනපතා සේවකයෙන් යෙදවීම. |
| තානායම් භූමිය සම්බන්ධ ගැටළු | ම.සෞ.ප. නලීන් මහතා. | තානායම් භූමියට දිනකට විශාල වාහන | තානායම් භූමිය පවිත්‍ර කිරීම සඳහා දිනපතා ගැහැණු කෙනකු යෙදවීම. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රමාණයක් පැමිණෙන අතර එය අපවිත්‍ර වී ඇති බව. | |
| ස්වාභාවික නාන තොටුපල වැලිවලින් පිරී පැවතීම. | | එය යථා තත්ත්වයට පත් කර දෙන ලෙස වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීම. | |
| කලුවඩුමුල්ල නාන ළිඳ අසල ජලය එක් රැස් වී තිබීම. | ගරු සභාපති, ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා. | මෙය සෑහෙන කාලයක සිට පවතින ගැටළුවක්. | එය යථා තත්ත්වයට පත් කරන ලෙස ජල සම්පාදන මණ්ඩලය දැනුවත් කිරීම. |
| දේවානන්ද විද්‍යාලය අසල කාණුවේ අනතුරුදායක තත්ත්වය. | ම.සෞ.ප. නලීන් මහතා. | දේවානන්ද විද්‍යාලයේ ආරක්ෂක කුටිය අසල කාණුවේ ජලය රැඳී තිබීම නිසා කාණුවේ ස්ලැබ් කැලි කැඩීමට සිදු වූ බවත්, මේ තත්ත්වය දරුවන්ට අනතුරුදායක බව. | එහි ස්ලැබ් කැලි දමා කඩිනමින් සකස් කිරීම. |
| හෙප්පුමුල්ල සේවා පියස සම්බන්ධ ගැටළු. | හෙප්පුමුල්ල ග්‍රාම නිලධාරී. | හෙප්පුමුල්ල සේවා පියස පිටුපස දැල් ආවරණ කැඩී ඇති බැවින් ගම්වාසීන් ජලය ලබා ගැනීම හා ඉඩම වල් බිහි වී ඇති බව. | දැල් ආවරණ සැකසීම, කැලෑව ශුද්ධ පවිත්‍ර කිරීම. |
| නිවෙස්වල කසල ගැනීම සඳහා දැල් පෙට්ටියක් සකස් කිරීම | ගරු නගර සභා මන්ත්‍රී, ජී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. | නිවෙස්වල කසල ටැක්ටරය එන තෙක් තබා තිබියදී බල්ලන් ඇදීම නිසා මාර්ග අපිරිසිදු වන බැවින් ඒ | එක් නිවසකට ප්‍රමාණවත් දැල් පෙට්ටියක් සඳහා ඇස්තමේන්තු සකස් කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | සඳහා දැල් පෙට්ටියක් සකස් කර ලබා දීම සුදුසු බවත්, මෙය මුලින් එක් මාර්ගයක සිදු කර එහි සාර්ථකත්වය මත අනෙක් අයටත් ලබා දිය හැකි බව. | |
| නිවාඩු දිනවල ටැක්ටරයක සුළු නඩත්තුවක් සිදු කිරීමට නොහැකි වීම | සෞඛ්‍ය පරිපාලක ඒ.අයි.සාරංග මහතා. | නිවාඩු දිනවල කර්මාන්ත අංශයේ සේවකයන් නිවාඩු නිසා ටැක්ටරයක සුළු නඩත්තුවක් සිදු කිරීමට නොහැකි වීම. | අවශ්‍ය උපකරණ පිළිබඳ ලැයිස්තුවක් සභාවට යොමු කිරීම. |
| ස්තුති කතාව | ගරු නගර සභා මන්ත්‍රී, ජී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. | කමිටුවේදී ගන්නා වූ තීරණ ක්‍රියාත්මක කරන බවට අප වග බලා ගන්නවා. අද ගත් තීරණ ක්‍රියාත්මක කිරීම තුළින් ජනතාව බලාපොරොත්තු වන සේවය ඉටු කිරීමට ගතහැකි ක්‍රියා මාර්ග ගැනීමට උත්සුක වන ලෙස නිලධාරීන් වෙතින් ඉල්ලීමක් කරනවා. අද දින කමිටුවට සහභාගී වූ මන්ත්‍රී දෙපලට සහ සියළුම නිලධාරී මහත්ම මහත්මීන්ට ස්තුතිය පුද කරමි. | |
| නිමාව | | ප.ව 4.15 | |

සකස් කළේ,
සංවර්ධන සහකාර(පරිසර)

නිර්දේශ කරමි, | අනුමත කරමි.

ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2018- 05- 18 දින පවත්වන ලද පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේකෙ තියෙනවා ඕකන්ද ප්‍රජා ශාලාව සඳහා ජල සම්බන්ධතාවය ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත කියලා. එහෙම දෙයක් වෙලා නැහැනෙ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒක බලන්නම් මොකක්ද කියලා.

**ඒ අනුව 2018 -05- 18 දින පවත්වන ලද පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3 2018- 05- 09 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ත්‍රීරෝද රථ හා රථ වාහන කමිටු වාර්තාව.**

<u>ත්‍රිරෝද රථ හා වාහන කමිටුව</u>
<u>2018.05.09 දින ප.ව. 2.30</u>

<u>සහභාගීත්වය</u>

| | |
|---|---|
| ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා - | ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව |
| නන්දන රාජපක්ෂ මහතා - | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| දිනයාදුර ධර්මදාස මහතා - | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මහතා - | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| එච්.මහින්දසේන මහතා - | කමිටු සාමාජික |

| | |
|---|---|
| එම්. ගිවාන් සාරත විමලතුංග මහත - | කමිටු සාමාජික |
| බී.ඒ. ධම්මිකා මිය - | ලේකම්, අම්බලන්ගාඩ නගර සභාව |
| ටී.එම්.එම්. ගුණසේකර මයා - | උප පොලිස් පරීක්ෂක, අම්බලන්ගොඩ පොලිසිය |
| ඩී.එච්.එස්.ඩී ගුණවර්ධන මයා - | තාක්ෂණ සේවා නිලධාරි |
| කේ.පියරත්න මයා - | ආදායම් පරීක්ෂක |
| ටී. චන්න මයා - | ආදායම් පරීක්ෂක |
| එන්. ලකීෂා යසස්මි මිය - | ආදායම් පරීක්ෂක |
| අචිරා රංජනි ලොකුගේ මිය | කළමනාකරණ සහකාර |

<u>ගරු සභාපති තුමා</u>

ත්‍රිරෝද රථ හා වාහන කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීතුමන්, කමිටු සාමාජිකයින් නගර සභා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරයෙන් පිළිගනු ලබන බවත් පවස ලදී. නගරයේ වාහන තදබදය අවම කිරීම වෙනුවෙන් පවතින ගැටළු පිළිබඳ සාකච්ජා කර එම ගැටළු විසදා ගැනීම මෙම සාකච්ජාව
තුළින් සිදු කෙරෙන බවත් වැඩි දුරටත් ප්‍රකාශ කිරිම

2018.05.09 දින පැවති රැස්වීමේ සාකච්ජා වූ කරුණු සමාලෝචනය

| මාතෘකාව | ප්‍රකාශය කවුරුන් විසින් ද යන වග | සාකච්ජා වූ කරුණු | තීරණ |
|---|---|---|---|
| ලේකම් තුමිය වෙත යොමු කරන ලද ලිපියක් සභාවට ඉදිරිපත් කිරීම | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් 2018.05.08 දින එවන ලද ලිපිය ඉදිරිපත් කරමින් කමිටුව පවත්වාගෙන යන්නේ ද යන්න අදහස් විමසීම හා අළුතින් ත්‍රිවිල් නැවතුම් ස්ථාන හා පරණ නැවතුම් හල් මොනවාද යන්න පිළිබඳ සාකච්ජා කිරීම හා අදලට ගැලපෙනසේ වෙනස් කල යුත්තේ කෙසේද යන්න සාකච්ජා කිරීම. | 2018.05.09 දින කමිටුව පැවැත්විය යුතු බවට සාමාජිකයන් ප්‍රකාශ කිරිම |
| | කේ. පියරත්න මයා (ආදායම් පරීක්ෂක) | 2018.04.27 දින කැඳවනු ලැබුයේ නගරයේ වාහන තදබදය අවම කිරීම පිළිබඳ රැස්වීමක් බව පැහැදිලි කිරිම | |
| උප පොලිස් පරීක්ෂක ගුණසේකර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා මාලාව කමිටුවට ඉදිරිපත් කිරී | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ඒ පිළිබඳ තීන්දු ගැනිමට යෝජනා කිරීම | |

| | | | |
|---|---|---|---|
| | ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා | ත්‍රිවීල් කමිටුවේ සාමාජිකයින් හැර වෙනත් අය කමිටුවට කැඳවා ඇති ද යන්න විමසීම | |
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | කැඳවා නැති බව ප්‍රකාශ කිරීම හා කමිටුවට ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරීම. අළුතින් ත්‍රිරෝද රථ නැවතුම් ස්ථාන හඳුනා ගන්නා ලෙස ප්‍රකාශ කිරීම | |
| | සියළු දෙනාම විසින් | ❖ දොලොස් මහ රෙදි කඩේ ඉදිරිපිට රේල් පාර හා මහා මාර්ගය අතර.<br>❖ සෙලාන් බැංකුව අසල<br>❖ පොල්වත්ත හංදිය<br>❖ අම්බලන්ගොඩ පිට්ටනිය අසල( ලංකා බැකුව අසල)<br>❖ හල්වතුර හංදිය<br>❖ පෝරඹ හංදිය | |
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | පොලිස් පරීක්ෂක ගුණසේකර මහතාගේ පැමිණීම පිළිබඳ ස්තුතිය පුද කිරීම | |
| | පොලිස් පරීක්ෂක ගුණසේකර මහතා | පාරේ සිදුවන වාහන අවහිරතා පෙන්වා දෙනමින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දී පැවැත්වූ සංවර්ධන කමිටු රැස්වීමේදී සාකච්ජා වූ ත්‍රිරෝද රථ සම්බන්ධව ගන්නා ලද තීරණ පිළිබඳ විමසන ලදී | |
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | දැනට තිරෝද රථ ලියා පදිංචි කිරීම පිළිබඳ දැන්වීම් පල කිරීම හා බැනර් ප්‍රදර්ශනය කිරීමට යෝජනා කරන ලදී. | |
| | පොලිස් පරීක්ෂක ගුණසේකර මහතා | සාමාජික කර ගත යුත්තේ කවුරුන්ද යන්න විමසන ලදී. | |
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ✓ අම්බලන්ගොඩ බල ප්‍රදේශයේ අයට ප්‍රමුඛතාවය දීම.<br>✓ *දැනටමත් බලපත්‍ර ලබා සිටින අයට*<br>*තවද මෙම බලපත්‍ර ලබාදීම තුලින් ඔවුන්ට ආරක්ෂාවක් ලැබෙන බව පෙන්වා දීම* | |

| | | | |
|---|---|---|---|
| | පොලිස් පරීක්ෂක ගුණසේකර මහතා | රොසෙත් රෝහල ඉදිරිපිට පාරේ ත්‍රිවිල් නතර කිරීමට ඉඩදීමෙන් ලොකු වාහන නවතා තැබීම නතර කල හැකි බවත් පාර අවහිර වීම අවම වන බවත් පෙන්වා දීම. | |
| | ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා | බස් නැවතුම්පොල ඉදිපස ත්‍රිරෝද රථ නතර කරන ස්ථානයේ ත්‍රිරෝද රථ කිහිපයක් එකවර පාරට දැමීම හේතුවෙන් රිය අනතුරු සිදුවන බැවින් එය වැලැක්වීම සඳහා වැටක් ඉදිකිරීමට යෝ ජනා කිරීම හා කොළඹ බස් නැවතුම් පොලෙහි ත්‍රිරෝද රථ පාක් කිරීම පෙන්වා දෙන ලදී. | |
| | පොලිස් පරීක්ෂක ගුණසේකර මහතා | උදේ 5 – 6 අතර පොලිස් නිලධාරින් 04 දෙනෙකු පාරේ අවහිරතා අවම කිරීම සඳහා සේවයේ යොදවා ඇති බව පෙන්වා දීම | |
| | ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා | ආරක්ෂක නිලධාරින්ට ප්‍රමානවත් වැටුපක් ගෙවන්නේද යන්න විමසීම් කිරීම හා එසේ නොමැති වූ විට අක්‍රමිකතා සිදුවන බව පෙන්වා දීම. | |
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | රජයෙන් නියම කරන ලද වැටුප් ගෙවන ලද බව සඳහන් කල අතර බස්නැවතුම්පොලෙහි වැටේ ග්‍රිස් ගා ඇති බව පෙන්වා දීමත් එවැනි කටයුතු කරන්නන් සොයා බලා දඩුවම් කල යුතු බවත් ගුණසේකර මහතාට ප්‍රකාශ කිරීම. | |
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | බස් නැවතුම්පොලෙහි ආරක්ෂාව සඳහා ආරක්ෂක නිලධාරින් බඳවා ගන්නා ලෙස ලේකම්තුමියට උපදෙස් දෙන ලදී. | |
| | ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා | බස් නැවතුම්පොලෙහි කඩ කාමර 62 පමණ ඇති අතර එම ස්ථනයේ ත්‍රිවිල් පාක් කිරීමෙන් එම කඩ වලින් බඩු මිලදී ගැනීමට පැමිණෙන අයගේ වාහන නතර කිරීමට තැනක් නොමැති බව සඳහන් කිරීම. | |
| | | | |

| | | | |
|---|---|---|---|
| | | ත්‍රිවීල් නැවතුම් ස්ථාන ලෙස හදුනා ගෙන ඇති ස්ථාන<br>❖ දොලොස් මහ රෙදි කඩය අසල (අතර් ද සිල්වා මාවත - ත්‍රිරෝද රථ 05ක්)<br>❖ දුම්රිය පොල හන්දියේ සිට දුම්රිය පොල දක්වා (පාර දෙපැත්තේ ඔත්තේ ඉරට්ටේ ක්‍රමයට)<br>❖ බස්නැවතුම්පොල ඉදිරිපිට ත්‍රිරෝද රථගාල ලඟ රිය අනතුරු සිදුවන බැවින් බැම්මක් බැදීමට සාකච්ජා කිරීම)<br>❖ සෙලාන් බැංකුව අසල<br>❖ පොල්වත්ත හංදිය(රෝහලට යන පාර අවහිර නොවන පරිදි)<br>❖ අම්බලන්ගොඩ පිට්ටනිය අසල<br>❖ හල්වතුර හංදිය<br>❖ පෝරඹ හංදිය<br>❖ ලංකා බැංකුව අසල<br>❖ සුවන රෝහල අසල<br>❖ පොල පාර(මෙම ස්ථානයේ ත්‍රිවීල් කීයක් පාක් කල හැකි ද යන්න R.O . මහතාට සොයා බලා ඉදිරිපත් කරන ලෙස දැන්වීම)<br>❖ රණසිංහ කඩේ ලඟ - ත්‍රිවීල් 08<br><br>R.T.S. එකේ පාරේ තබා ඇති තෙල් බැරල් ඉවත් කල යුතු බව හා අනවසර ලොතරැයි කුටි සියල්ල ඉවත් කල යුතු බවත් වෙළදාම් කිරීමේදී පාර අවහිර නොවන පරිදි වෙළදාම් කල යුතු බවට වෙළදුන් දැනුවත් කල යුතු බවත් සඳහන් කරන ලදී. තවද සියළුම කඩ පාරේ ඇති කාණුවෙන් එහා පැත්තේ තිබිය යුතු බවත් ඊට මෙහායින් ඇති කඩ සියල්ල ඉවත් කල යුතු බවත් පාරේ තබා විකුණන මාළු ලැලි කඩා ඉවත් කල යුතු බවත් වැඩි දුරටත් සඳහන් කරන ලදී. | |
| | ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මයා | පුංචි පොල පාරේ වෙළදාම් කරණ වෙළදුම් ඉවත් කල යුතු බව ප්‍රකාශ කරන ලදී. | |
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ඔවුන් ඉවත් කරන ලෙස R.O. මහතාට ප්‍රකාශ කල අතර,කාර්ගිල්ස් වෙළදසැල ඉදිරිපිට වැට කැඩී ඇති ස්ථානය සකස් කරන ලෙසත් දැනුම් දෙන ලදී. | |
| | පොලිස් පරීක්ෂක ගුණසේකර මහතා | ගාලු කොළඹ පාරේ එක් පැත්තකට පමණක් වාහන ගමන් කිරීමට සැලසිම සාකච්ජා කිරීම හා බස් නැවතුම් පොළ හා පාරේ විදුලි ආලෝකය මද බැවින් ඒ සඳහා පියවර ගැනීමට සාකච්ජා කිරීමවම | |

| | | | |
|---|---|---|---|
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | පදික වේදිකාවේ වෙළඳාම් කරන වෙළඳුම් ඉවත් කර කර ඔවුන්ට වෙළඳාම් කිරිමට වෙනත් තැන්වල ඉඩ සලසා දීම | |
| | කේ. පියරත්න මයා (ආදායම් පරීක්ෂක) | P.H.I . මහතාගේ සහයෝගය ඒ සඳහා ලබා දෙන ලෙස ඉල්ලීම | |
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | P.H.I . මහතාට ඒ සඳහා විශාල වගකීමක් ඇති බව පෙන්වා දීම හා ඔහුගේ සහයෝගය එයට ලබා ගන්නා ලෙස දැන්වීම. | |
| | වෙනත් කරුණු | අම්බලන්ගොඩ නගරයේ සිට පොල්වත්ත දෙසට යන විට ඇති පාලම කෙළවර අවධානම් ස්ථානයක් බවත් එය පරීක්ෂා කර අවශ්‍ය කටයුතු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දීමට හා T.O. මහතෙකු යවා පරීක්ෂා කරවීම. තවද එම පාර පුලුල් කිරීමේදී පාරේ රක්ෂිත ඉඩ ප්‍රමාණයක් ඇති බව ද සාකච්ඡා විය. | |
| | ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා | පාරේ සිට නිවෙස් වලට පිවිසෙන තැන්වලදී බෑවුම( ස්ලොප් එක) පාරේ සිටම තබා ඇති බව පෙන්වා දෙමින් කියා සිටියේ වාහන ගමනා ගමනයට එය බාධාවක් බවත් ඒ සඳහා ගන්නා පියවර කුමක්ද යන්න හා පොල්වත්ත දෙසට යන විට ඇති පාලම ලඟ කටුතම්පලා ගසක් ඇති බවත් අනතුරු සිදු වීමට ප්‍රථම එය ඉවත් කල යුතු බවත්ය. | |
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | එය ඉවත් කරන ලෙස දැනුම් දෙන ලදී. | |
| | ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ | පොල්වත්ත හන්දියේ පාර අවහිර වන පරිදි වාහන නතර කිරීම පිළිබඳ ප්‍රකාශ කිරීම | |
| | ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා | පොල්වත්ත හන්දියේ පූර්ණ වෙළඳ සැල අසල වාහන නවතා බඩු මිලදී ගැනීමට යාම නිසා පරේ වාහන ගමනා ගමනයට බාධා ඇති වීම සහ රිය අනතුරු සිදුවිය හැකි බව පෙන්වා දීම | |
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | වාහන නවතා තැබීම තහනම් ලෙස බෝඩ් එකක් සවි කිරීමට. | |
| | පොලිස් පරීක්ෂක ගුණසේකර මහතා | * පාරේ වමෙන් වාහන ධාවනය කිරීමට ඊතල මගින්පෙන්පෙන්වා දීම<br>* පාරේ ඇති වැටවල් වලට ඇතුලෙන් ගමන් කල යුතු බව පෙන්වා දීම හා<br>* පදිකවේදිකාවෙන් ගමන් නොකිරීම දඩුවම් ලැබිය යුතු වරදක් බව පෙන්වා බෝඩ් ප්‍රදර්ශනය කිරීමට.<br>* පොල්වත්තට යන පාරේ වැට රවුමට | |

| | | | |
|---|---|---|---|
| | | සකස් කර පදික මාරුවෙන් ගමන් කිරීමට පදිකයන් හුරු කිරීම. | |
| ස්තුතිය | ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මයා | ගරු සභාපති තුමන් ඇතුළු නාගරික මන්ත්‍රී තුමන්ලාගෙන් හා රථ වාහවන අංශයේ නිලධාරි තුමාගෙන්ද කාර්ය මණ්ඩලයටද මේ අවස්ථාවට සහභාගි වීම පිළිබඳව ස්තුතිය ප්‍රද කරන අතර නගරයේ ඇති ගැටළු ප්‍රශ්න කථා කිරීමට අවස්ථාව ලබාදීම පිලිබඳවත් මේ අවස්ථාවේ ස්තුතිය ප්‍රකාශ කරන බවත් සභාපති තුමන් ගන්නා ලද තීරණ සාර්තක කර ගැනීමට හැකි වේවායි යන්න ප්‍රාර්ථනා කරන බවත් ප්‍රකාශ කරන ලදී. | |
| නිමාව | | ප.ව.4.30 | |

සකස් කලේ
අචිරා රංජනී ලොකුගේ
කළමනාකරණ සහකාර

ලේකම්
බී.ඒ. ධම්මිකා
අම්බලන්ගොඩ නගර සභාව

සභාපති
ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප්
අම්බලන්ගොඩ නගර සභාව

**2018- 05- 09 දින පවත්වන ලද ත්‍රීරෝද රථ හා රථ වාහන කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණිය මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි පොල්වත්ත රෝහල , ආයුර්වේද රෝහල සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය යන ආයතන තුන තිබෙන ස්ථානයේ ත්‍රීරෝද රථ 7 ක් ගාල් කර තිබෙනවා. ඔවුන් සංවිධානයක් ලෙස ඉල්ලා සිටිනවා.....

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීතුමා ත්රීරෝද රථ ගාල් අඳුනගෙන ඒවා ලියාපදිංචිය පිළිබඳව කටයුතු කිරීමට මන්ත්‍රී මණ්ඩලයක් පත් කරන්න අවශ්‍යයි. ඒ මණ්ඩලය මගින් තීරණයක් ගැනීම සුදුසුයි කියල මම හිතනවා.

ඒ සඳහා පාලක පක්ෂයෙන් **කමල් වැල්ලගේ මහතා, කෙරම්ණියගේ ග්රේෂන් මහතා, ඩී. ධර්මදාස මහතා, නන්දන රාජපක්ෂ මහතා, ජගත් කුමාර මහතා, ඩෙනට් පනියන්දුවගේ මහතා, සෝභිත රංජිත් මහතා, එස්.එම්. සරත් මහතා, වඩුමෙස්ත්‍රී නිලානි මෙනවිය, ඊ. අයිරාංගනී ද සිල්වා මහත්මිය, ජී.ජී. රුචිනි පේෂලා මහත්මිය, එච්. ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය යන අයගෙන් සමන්විත කමිටුවට නගර**

**සභාව සතු නැවතුම් ස්ථාන සඳහා ත්‍රීරෝද රථ ලියාපදිංචි කිරීමේ කටයුතු සහ ගාල්වල අනුමත ප්‍රමාණය තීරණය කිරීම සඳහා බලය පවරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මට මේ නගරයේ වාහන තදබදය අවම කිරීම සම්බන්ධ වාර්තාවේ මම සහභාගී වුනා නමුත් මගේ නම නැහැ. මම කතාත් කරා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමාගෙ නම හතර වෙනියට තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මට ලැබුනු එකේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ කතා කරන්නෙ 2018-05-09 තිබුණ කමිටුව ගැන. ඒකෙ 4 වෙනියට ඉන්නෙ ඔබතුමා.

ඒ අනුව **2018- 05- 09 දින පවත්වන ලද ත්‍රීරෝද රථ හා රථ වාහන කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 4 2018- 05- 22 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව**

<u>ක්‍රීඩා කමිටු වාර්තාව</u>

**<u>2018.05.22</u>**

**සහභාගිත්වය-**

| | |
|---|---|
| ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මයා | -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඩබ්ලිව්.කමල් ද සිල්වා මයා | -ගරු උප සභාපති, අම්බලන්ගොඩ නගර සභාව. |
| ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මයා | -ගරු නගර සභා මන්ත්‍රී.අම්බලන්ගෙඩ නගර සභාව. |
| ධම්මික කොඩිකාර මයා | -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඩෙනට් පනියන්දුවයේ මයා | - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව. |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මිය | -ගරු නගර සභා මන්ත්‍රිණී,අම්බලන්ගොඩ නගර සභාව. |
| ටී.සරත් ශාන්ත මයා | -සිංහ ක්‍රීඩා සමාජය, අම්බලන්ගොඩ. |
| එම්.ඩබ්ලිව්.ෂර්ලි චන්ද්‍රසිරි මයා | -පනියන්දුව,අම්බලන්ගොඩ. |

| | |
|---|---|
| එම්.ඩබ්ලිව්.ටී.ප්‍රභාත් මයා | -ගා/පී.ද.එස්.කුලරත්න විද්‍යාලය,අම්බලන්ගොඩ. |
| ඒ.කේ.එස්.ඩී.ශ්‍යාමලී මිය | -ගා/ග්‍රාමණී ම.වි,අම්බලන්ගොඩ. |
| මහේන්ද්‍ර වික්‍රමසිංහ මයා | -පෝරඹ.අම්බලන්ගොඩ. |
| ජී.ජී.ජයවීර මයා | -රියෝ ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ. |
| බී.ඒ.ධම්මිකා මිය | -ලේකම්,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඩී.එච්.එස්.ඩී.ගුණවර්ධන මයා | -තාක්ෂණ සේවා නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව. |
| එච්.එල්.ඩී.සිල්වා නිලමුණි | -තාක්ෂණ සේවා නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව. |
| ජී.අශෝක කුමාර මයා | -ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඩී.වී.තරංගි මිය | -ප්‍රජා සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව. |

**පිළිගැනීම.-ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මයා ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව..**

අද දින ක්‍රීඩා කමිටුව සඳහා පැමිණි, ගරු මන්ත්‍රීවරුන්, පාසල් නියෝජනය කරමින් පැමිණි ගුරු මහත්ම මහත්මීන්,ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පැමිණි සියළු මහත්වරුන් , ක්‍රීඩා කමිටු සාමාජික මහත්වරුන් සහ නගර සභාව වෙනුවෙන් සහභාගිවන ලේකම් තුමිය ඇතුළු සියළුම නිලධාරි මහත්ම මහත්මීන් පිළිගනිමින් ක්‍රීඩා කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදි.

**පසුගිය කමිටුවේ දී සාකච්ඡා කරන ලද කරුණු සමාලෝචනය**

➢ මහජන ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳව.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා- ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතු වලදී ක්‍රිකට් ආයතනය අපෙන් කරුණු 02ක් බලාපොරොත්තු වුණා එකක් තමයි පැත්තේ කාණුව ඉදිකිරීම. ඒ කටයුතු හෙට වෙනකොට අවසන් කරන්න පුළුවන්. අනෙක් කරුණ තමයි, ... ඡක්බ එක හදන එක. කටුනායක ඉංජිනේරු තාක්ෂණික ආයතනය මගින් නොමිලේ හදල තියෙන්නෙ අද හෙට අපට ලැබෙයි. ඊළඟ වසරේ ඊස්ට ඡඑ්ජය එක මේ ක්‍රීඩාංගණයේ සෙල්ලම් කරන්න ක්‍රිකට් ආයතනය අපට ඉතුරු වැඩටික කරල දෙයි කියල අපි බලාපොරොත්තු වෙනවා.

**ජී.ජී.ජයවීර මයා -රියෝ ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ.**

මේ ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් ක්‍රිකට් පාලක මණ්ඩලය මුදල් වෙන්කරලයි තියෙන්නේ, නගර සභාවෙන් කළ යුතු වැඩ ටික කරල තියෙන්නේ කියල ක්‍රිකට් පාලක මණ්ඩලය දැනුවත් කරමු.

➢ **ක්‍රීඩා මණ්ඩපයේ ප්‍රතිසංස්කරණ කටයුතු**

ක්‍රීඩා මණ්ඩපයේ පින්තාරු කිරීම. දොරවල් සවි කිරීම ඇතුළු සියළුම ප්‍රතිසංස්කරණ කටයුතු වලට ආදාළ ඇස්තමේන්තු මේ සභාවට ඉදිරිපත් කිරීමට තාක්ෂණික සේවා නිලධාරිට උපදෙස් ලබා දෙන ලදි.

- **පොල්වත්ත ක්‍රීඩාංගණයේ වොලිබෝල් පිටිය හා මීටර් 100 ධාවන පථය සකස් කිරීමට අදාළ ඇස්තමේන්තු සකස් කිරීම.**

**ඩී.එච්.එස්.ඩී.ගුණවර්ධන මයා -තාක්ෂණ සේවා නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.**

වොලි බෝල් පිටිය සකස් කිරීමට අදාළ ඇස්තමේන්තුව සකස් කර ඇතිබව.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

ඒ ඇස්තමේන්තුව හා මීටර් 100 ධාවන පථය සකස් කිරීමට අදාළ ඇස්තමේන්තුව මේ සභාවට ඉදිරිපත් කරන්න.

- **පොල්වත්ත ක්‍රීඩාංගණයෙන් පන්දු පන්සල යාම වළක්වා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග**

**ඩී.එච්.එස්.ඩී.ගුණවර්ධන මයා -තාක්ෂණ සේවා නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.**

තියෙන කණුවලට තව අඩි 10 පමණ උසට අලුත් දැල් අමුණන්න අමාරුයි. ඒවෙනුවට කණ 03ක් යොදාගෙන දැල් ගහන්න වෙන්නේ.

**ඩබ්ලිව්.කමල් ද සිල්වා මයා -ගරු උප සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

දැල ඔසවන්න ලොකු වියදමක් දැරීම අපරාධයක්,සියළු ගැටළුවලට විසඳුම් ලැබෙනවා මේ පිට්ටනිය හැදුවාම. ඒ සඳහා මාළු දැලක් යොදා ගන්න පුළුවන්.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

15 න් පහළ තරගාවලියක දී වුණත් පන්සල් වත්තට යන්න තරම් පහරවල් වැදෙනවා. අපි නායක හාමුදුරුවන්ටත් ඇහුම්කන් දිය යුතුයි. සරල ක්‍රමයකින් හරි මේ ගැටළුවට විසඳුමක් යොදන්න.

- **කැටැන්තොට පෙර පාසල් සෙල්ලම් මිදුල සඳහා උපකරණ අළුතින් සවිකිරීම.**

උපකරණ මිලදී ගැනීමට අදාළ මිලගනන් ටෙන්ඩර් කමිටුවට ඉදිරිපත් කරන ලදි.

- **ධීවර සංකීර්ණය නැවත නගර සභාව වෙත පවරා ගැනීමට අදාළ වාර්තාව ඉදිරිපත් කිරීම.**

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

අදාළ වාර්තාව මහ සභාව වෙත පරිපාලන යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දෙන ලදි.

- **කාය වර්ධන මධ්‍යස්ථානය නැවත විවෘත කිරීම**

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව**

විවෘත කර ඇත.

**අදහස් හා යෝජනා**

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා -ක්‍රීඩා කමිටු සාමාජික**

ක්‍රීඩාංගණයේ Score Board හැදෙනව ද?

**ආර්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

මේ ප්‍රතිසංස්කරන කටයුතු සමග Score Board එකත් හැදෙනවා.

**ටී.සරත් ශාන්ත මයා -සිංහ ක්‍රීඩා සමාජය, අම්බලන්ගොඩ.**

පොල්වත්ත පිට්ටනිය මැදින් යන කාණුවේ කොටසක් නිරාවරණය වී ඇති බව.

**ආර්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

තාක්ෂණ සේවා නිලධාරි මේ ගැනත් බලන්න.

**ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මයා- ගරු නගර සභා මන්ත්‍රී.අම්බලන්ගෙඩ නගර සභාව.**

හල්වතුර ක්‍රීඩාංගණයේ තණ කොළ ඇල්ලීමට කටයුතු කර දෙන්න.

**ආර්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

තාක්ෂණ සේවා නිලධාරි ඇස්තමේන්තුවක් ලබා දෙන්න.

**ඒ.කේ.එස්.ඩී.ශ්‍යාමලී මිය -ගා/ග්‍රාමණී ම.වි,අම්බලන්ගොඩ.**

කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයේ දුර පනින වළක් හදල දෙන්න.

**ආර්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

එම ඉල්ලීම සාධාරණයි, තාක්ෂණ සේවා නිලධාරි අවශ්‍ය කටයුතු සිදුකර දෙන්න.

**ධම්මික කොඩිකාර මයා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**

කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයේ ආරක්ෂිත වැට හදල දෙන්න.

**ඩී.එච්.එස්.ඩී.ගුණවර්ධන මයා -තාක්ෂණ සේවා නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.**

ඊට අදාළ ඇස්තමේන්තුව ගිය සභාවෙන් අනුමත වුණා.

**ධම්මික කොඩිකාර මයා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**

**සභාවෙන් කරල දෙනවා කිව්වා, බැරිනම් අපිට බඩු ගෙනත් දෙන්න. අපි කරගන්නම්.**

**ආර්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

තාක්ෂණ සේවා නිලධාරි බඩු ගෙනත් දෙන්න.

**ඩබ්ලිව්.කමල් ද සිල්වා මයා -ගරු උප සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

තල්ගස්ගොඩ ක්‍රීඩාංගණය හදන්න අරගෙන දැන් අවු.10 විතර කාලයක් වෙනවා. දැනට 50% වැඩ අවසන්, ඉතුරු ටිකත් කරල දෙන්න. මීටර් 400 ධාවන පථයක් හදන්න පුළුවන් මෙහේ තියෙන එකම ක්‍රීඩාංගණය තල්ගස්ගොඩ ක්‍රීඩාංගණය.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

ගරු උප සභාපතිතුමා ලබන සභාවට මේ පිළිබඳව යෝජනාව ඉදිරිපත් කරන්න.

**ජී.ජී.ජයවීර මයා -රියෝ ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ.**

අක්කර 03 අක්කර 05 කරගන්න පුළුවන්නම්, සම්පූර්ණයෙන්ම හදල දෙන්න යෝජනා කරන්න තිබුණා.

**ඩෙනට් පනියන්දුවයේ මයා - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**

2017 වසරේ දී ගරු ක්‍රීඩා අමාත්‍ය දයාසිරි ජයසේකර මැතිතුමා විසින් කුරුණෑගල සහ අම්බලන්ගොඩ නව ක්‍රීඩාංගණ දෙකක් ඉදිකිරීමට මුදල් වෙන්කරලයි තිබුනේ . ඒ පිළිබඳවත් දන්වල නව ක්‍රීඩා අමාත්‍යවරයාගෙනුත් ඉල්ලීමක් කරමු.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

**පොල්වත්ත ක්‍රීඩාංගණයේ පළුදු තැන් හදල ඉවරද?**

**ජී.අශෝක කුමාර මයා -ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**

තවම නැහැ පස් ගෙනත් දැම්ම දවසෙම වහින්න ගත්තා වැස්ස පැයුවාම හදන්න පටන්ගන්නම්

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

පා පන්දු සංචිතයේ දැන් කී දෙනෙක් පුහුණුව ලබනවද?

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා -ක්‍රීඩා කමිටු සාමාජික**

**දහඅට දෙනෙක් විතර,**

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

අද අම්බලන්ගොඩ පා පන්දු තියෙන්නේ පා පන්දු සංචිතය නිසා,වයස අවු. 15 න් පහළ පා පන්දු තරගාවලියක් කරල ක්‍රීඩකයන් තෝරාගෙන 19න් ඉහළ වෙනකම් නොමිලේ පුහුණුවීම් කරන්න. අවශ්‍ය පහසුකම් අපි සපයල දෙන්නම්.

පා පන්දු සම්මේලනයට පුළුවන්නම් මානාන ක්‍රීඩාංගණය සංවර්ධනය කරල දෙන්න කියන්න.

පා පන්දු පුහුණුවීම් වලට ක්‍රීඩාංගණය නොමිලේ ලබා දෙන්නම්.

**එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මිය -ගරු නගර සභා මන්ත්‍රිණී,අම්බලන්ගොඩ නගර සභාව.**

මානාන ක්‍රීඩාංගණයේ හොඳටම වල් බිහිවෙලා තියෙන්නේ ආරක්ෂිත වැටෙත් වැල් එතිලා.ශුද්ධ කරල දෙන්න.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

තාක්ෂණ සේවා නිලධාරි මානාන ක්‍රීඩාංගණය ශුද්ධ කරන්න අවශ්‍ය කටයුතු සලසලා දෙන්න.මානාන ක්‍රීඩාංගණයට ආසන්නයේ ඇති ධම්මකුසල විද්‍යාලයේ ඉඩම ගන්න අපි මහ ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරමු.

**ඩෙනට් පනියන්දුවයේ මයා - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**

ධම්මකුසල ඉඩම සම්බන්ධයෙන් High Court තීන්දුව වන්නේ පාසල් සංවර්ධන කටයුත්තක් හැර වෙනත් කිසිම සංවර්ධන කටයුත්තකට ඉඩම යොදා නොගත යතු බව. අපි ඒ ඉඩම ධර්මා ශෝක විද්‍යාලයට පවරන්න කියල ඉල්ලීමක් කරා ඒ අනුව ඒ ඉඩම ධර්මාශෝක විද්‍යාලයට ලබා දෙන්න එකඟ වෙලා තියෙනවා.

**ස්තූති කථාව- ඩබ්ලිව්.කමල් ද සිල්වා මයා -ගරු උප සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

තමන්ගේ වටිනා කාලය කැප කරමින් අද දින ක්‍රීඩා කමිටුවට පැමිණි සියළු දෙනාට ස්තූතිය පුදකරමින් ක්‍රීඩාකමිටුවේ කටයුතු අවසන් කරන ලදී.

සකස් කළේ,
.........................................
ප්‍රජා සංවර්ධන නිලධාරි,
නගර සභාව- අම්බලන්ගොඩ.

| | |
|---|---|
| ......................................... | ......................................... |
| ලේකම්, | සභාපති, |
| නගර සභාව- අම්බලන්ගොඩ. | නගර සභාව-අම්බලන්ගොඩ. |

**2018- 05- 22 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඒ අනුව 2018 -05- 22 දින පවත්වන ලද ක්රීඩා කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය'**

**6: 5 2018- 05- 23 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මූල්‍ය කමිටු වාර්තාව**

**2018- 05- 23 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මූල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්. ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**ඒ අනුව 2018 -05- 23 දින පවත්වන ලද මූල්‍ය කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 6 2018- 05 - 22 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ටෙන්ඩර් කමිටු වාර්තාව**

**2018- 05- 22 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා අපි ටෙන්ඩර් කමිටුවෙන් ඉවත් වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමා ඉවත් වෙන්නෙ මොකක් හරි වැරදි දෙයක් වෙලාද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මම දැනටත් සැහෙන කමිටු ප්‍රමාණයක ඉන්නවා. ඒනිසා අපි මන්ත්‍රීවරු දෙන්නම ඉවත් වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ඇත්තටම වැඩිපුර විපක්ෂෙ මන්ත්‍රීවරු දැම්මෙ වරදක් වෙනව නම් පෙන්නල දෙන්නයි. මම සභාපතිවරයා වශයෙන් හැම දවසකම සභාවට එනවා. කමිටු දෙක තුනකට දවසකට සහභාගි වෙනවා. මම ඉල්ලා සිටිනවා හැකි අවස්ථාවට පැමිණෙන්න කියලා.

**ඒ අනුව 2018 -05- 22 දින පවත්වන ලද ටෙන්ඩර් කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

## (07) ටෙන්ඩර් හා මිළ ගණන්

**7:1 ටෙන්ඩර් (-** නැත

**7:2 මිළ ගණන් (-** නැත

## (08) ගෙවීම්

8.1 පරිගණක ජාල පද්ධතිය පහත මාලයේ ස්ථාපිත කිරීම වෙනුවෙන් ඔමැක් ටෙක්නොලොජීස් ආයතනය වෙත රු. 20000/- ක මුදල ගෙවීම සඳහා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 2 අම්බලන්ගොඩ නගර සභාව මගින් පාලනය වන පුස්තකාල සඳහා 2018 අප්‍රේල් මාසය සඳහා සපයන ලද පුවත්පත් වෙනුවෙන් රු. 44390.00 ක මුදලක් එම්. එස්. වීරසිංහ මහතා වෙත ගෙවීම සඳහා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි සමහර පත්තර පුස්තකාල වල කියවන්නෙම නැහැ. ඒව පොඩ්ඩක් බලල දාන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ප්‍රජා සංවර්ධන නිලධාරී මිය ඒව පරීක්ෂා කරල බලන්න.

8. 3 නගර සභාවට අයත් පැරණි ස.තො.ස. ගොඩනැගිල්ලේ කඩ කාමර අංක 13 හි වහලය පිළිසකර කිරීම වෙනුවෙන් ගාස්තුව වන රු. 14210.00 ක මුදල කඩ කුලියට හිලව් කිරීම සඳහා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල හිලව් කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමා ගිවිසුමේ තියෙන්නෙ එහෙමද?

<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේකෙ ඉල්ලීම කරල තියෙනවා. ටී.ඕ. මහත්තය පරීක්ෂා කරල නිර්දේශ කරල තියෙනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මේකෙ ගිවිසුමේ තියෙනවනම් දෙන්න. නැත්තම් වැයවුන මුදල අපි ගෙවන්න.

<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේකෙ ගිවිසුමේ තියෙනව අපි කරන්න ඕනෙ කියලා. ඒක නිසා මේක දෙන්න පුළුවන්.

8. 4 නගර සභාවට අයත් බස් නැවතුම් පොළ වෙළඳ සංකීර්ණයේ අංක 27 කඩ කාමරයේ වහලෙහි තහඩු සවි කිරීම වෙනුවෙන් ගාස්තුව වන රු. 17490.00 ක මුදල කඩ කුලියට හිලව් කිරීම සඳහා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් ඇති වූ බැවින් ඉවත් කරන ලද තහඩු නගර සභාව වෙත භාර දීමටත්

මේ සම්බන්ධව වාර්තාවක් සමග ඊලග සභා වාරය සඳහා මෙම ගෙවීම යොමු කිරීම සඳහාත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

සභාපතිතුමා මේකට අපි කලින් ගෙවීම් කරානෙ. මාර්තු මාසෙ වහල හදල. එහෙම තියෙද්දි මේක ආපහු දාන්න එපා.

<u>**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේකට පහුගිය කාලෙ පළාත් සභාවෙන් මුදල් ගෙව්ව. ටී.ඕ. මහත්මය මේ සම්පූර්ණ වහලෙ ගෙවීම ඔයා නිර්දේශ කරානෙ. මේක ඊට කලින් වෙච්ච එකක්ද?

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

මේක සුළි සුලගට වහල ගිහිල්ල රෙපයාර් කරානෙ. ඒකට ප්‍රධාන අමාත්‍යතුමා සල්ලි දුන්නා. ඊට කලින් දිනයක්නෙ මේකට කියන්නෙ. එතකොට ටී.ඕ. මහත්මය මෙතන හිටියනෙ. ඔබතුමා දැන්වත් වුනේ නැද්ද මේ වහල ගිහිල්ල කියලා. සභාපතිතුමනි සාමාන්‍යයෙන් මේ වගේ පොඩි රෙපයාර් එකක් ආවහම අපේ කාලෙ කරේ අපේ සේවකයෙක් දෙන්නෙක් දාල තමයි. මේ වගේ දේවල වෙනකොට අපිට ගැටළුවක්. තනි නිලධාරියෙක් විතරක් බලල මේව නිර්දේශ කරනවා. මේව මිනිස්සුන්ගෙ සල්ලි සභාපතිතුමා. මේක රු. 700 කින් කරන්න තිබුනද දන්නැනේ. මම අහන්නෙ මේව සාධාරණද කියලයි. අයින් කරපු ෂීට් 09 ස්ටෝර්ස් වලට ගෙනාවද අහන්න. අළුත් ෂීට් දැම්ම නම් පරණ ඒව සභාවට දෙන්න ඕනෙ.

8. 5 සෞඛ්‍ය අංශය සඳහා ග්ලවුස් සහ බටකුඩ ලබා ගැනීම වෙනුවෙන් රු. 36500.00 ක මුදලක් නයන රංජන සේල් පොළ වෙත ගෙවීම සඳහා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 6 පටබැදිමුල්ල ආදාහනාගාරයේ විමිණිය අළුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ 10% රඳවුම් මුදල වන රු. 32950.00 ක මුදල සමරසිංහ ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් ඉන්ජියරින් ආයතනය වෙත ගෙවීම සඳහා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.7 2018 මැයි 19 දින පැවැත්වූ රිදම් නයිට් සංගීත ප්‍රසංගයේ අලෙවි නොවූ ටිකට් පත් සඳහා, නගර සභාව වෙත ගෙවනු ලැබූ විනෝද බදු මුදල වන රු. 154000.00 ක මුදල එම්. එච්. හසිත වානක මහතා වෙත ගෙවීම සඳහා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ අය අපිට ගෙවල තියෙනවා 175000/- ක්. ඒකෙන් 154000/- ක් ආපසු ගෙවන්නයි ඉල්ලන්නෙ. මේකෙ ටිකට් පත් 85 යි විකිණිල තියෙන්නෙ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි ඕව පරීක්ෂා කරල බලලද තියෙන්නෙ. මේව නිලධාරීන් වශයෙන් ගිහිල්ල බලල තියෙනව නම් ගැටළුවක් නැහැ. අපි දන්නව මේකෙ නගර සභාවෙ සීල් එකත් කපල ගහපු නිලධාරීන් ඉන්නව.එතකොට අපිට ඉතින් මේව ගැනත් සැක හිතෙනවා. ඒකයි අපි මේ ප්‍රශ්න අහන්නෙ. මේ වගකීම ඔයගොල්ලො ගන්නව නම් කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි අරවගේ වෙලා තිබුනොත් අපිට පහු වෙනකොටත් ආරංචි වෙන්න පුළුවන්. එතකොට ඉතින් ප්‍රශ්න වෙන්න පුළුවන්.

8.8 සමෘද්ධි ලාභියකු වන එම්.ඩබ්. ප්‍රේමරත්න මහතාගේ ආදාහනය වෙනුවෙන් අය කරගත් මුදලින් රු. 2000.00 ක මුදලක් ඔහුගේ භාර්යාව වන එන්.පී.ඒ. ජසින්තා මහත්මිය වෙත ගෙවීම සඳහා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.9 අම්බලන්ගොඩ නගර සභාව සතු සියළුම වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා 2018 අප්‍රියෙල් මාසය වෙනුවෙන් ලබා ගත් ඉන්ධන වෙනුවෙන් රු. 281469.68 ක මුදලක් අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| අනු අංකය | වාහනයේ අංකය | මාසික බිල්පත |
|---|---|---|
| 01 | 252 – 0730 කැබ් රථය | රු. 9900.00 |
| 02 | PF – 7424 කැබ් රථය | රු. 27200.00 |
| 03 | QL – 6618 ත්‍රීරෝද රථය | රු. 5544.00 |
| 04 | RA – 3709 ට්‍රැක්ටර් රථය | රු. 10000.00 |
| 05 | RA – 8796 ට්‍රැක්ටර් රථය | රු. 15800.00 |
| 06 | SL – 3731 අත්ට්‍රැක්ටරය | රු. 3500.00 |
| 07 | SL - 3942 අත්ට්‍රැක්ටරය | රු. 1400.00 |

| | | |
|---|---|---|
| 08 | SL – 5694 අත්ට්‍රැක්ටරය | රු. 900.00 |
| 09 | GL – 9369 ගලි රථය | රු. 13900.00 |
| 10 | RF – 0022 ට්‍රැක්ටර් රථය | රු. 10300.00 |
| 11 | RF – 0031 ට්‍රැක්ටර් රථය | රු. 11000.00 |
| 12 | RF – 0970 ට්‍රැක්ටර් රථය | රු. 7700.00 |
| 13 | RF – 0986 ට්‍රැක්ටර් රථය | රු. 6800.00 |
| 14 | 49 – 9436 ට්‍රැක්ටර් රථය | රු. 7200.00 |
| 15 | මාර්ග තලනය | රු. 16020.00 |
| 16 | LL – 7642 කෘ කැබ් රථය | රු. 8500.00 |
| 17 | LL – 6406 ඩම්ට්‍රක් රථය | රු. 10000.00 |
| 18 | RA – 2509 ට්‍රැක්ටර් රථය | රු. 9500.00 |
| 19 | ගස් කපන යන්ත්‍රය | රු. 3725.00 |
| 20 | ZA – 5185 බැකෝ ලෝඩරය | රු. 57533.68 |
| 21 | තණ කොල කපන යන්ත්‍රය | රු. 6829.00 |
| 22 | පොල්වත්ත ආදාහනාගාරය (තණකොළ කැපීමට) | රු. 630.00 |
| 23 | පටබැඳිමුල්ල ආදාහනාගාරය (තණකොළ කැපීමට) | රු. 630.00 |
| 24 | සභා ගරාජය තුළ සිදු කරන අළුත්වැඩියා සඳහා | රු. 18000.00 |
| 25 | SA – 2806 හාඩ්මෙක් රථය | රු. 800.00 |
| 26 | ධූමායන කටයුතු සඳහා | රු. 18158.00 |
| | **මුළු එකතුව** | **රු. 281469.68** |

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි RF – 0986 ට්‍රැක්ටර් රථය සහ 49 – 9436 ට්‍රැක්ටර් රථය දුවන්නෙ කෙරමිණිය, පින්නදූව, තල්ගස්ගොඩ ප්‍රදේශයේ. අනික් ට්‍රැක්ටර් අම්බලන්ගොඩ අවට යන ඒව. මම අහන්නෙ මේ දුර දුවන ඒවට වඩා ළඟ දුවන ඒවගේ ගාන වැඩි වෙන්නෙ කොහොමද කියලා. මීට පස්සෙ එහෙම වෙන්න බැහැ. අදාල නිලධාරීන් මේවට වග කියන්න ඕනෙ. මම මේව වෙන වෙනම ඉල්ලුවෙත් මෙකයි. සභාපතිතුමනි මේව ගැන සොයා බලන්න.

8.10 අම්බලන්ගොඩ බස් නැවතුම් පොළ අංගනයේ පළුදු වූ කොටස් අළුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ 10% රැඳවුම් මුදල වන රු. 48719.19 ක මුදල සභාපති, පනියන්දූව ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීම සඳහා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.11 අම්බලන්ගොඩ මහජන පුස්තකාලයේ ඇති PC 34163 ඡායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු. 19465.66 ක මුදලක් ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ගෙවීම

සදහා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සදහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.12 අම්බලන්ගොඩ නගර සභාවේ සහ මහජන පුස්තකාලයේ ඇති PC 33947 හා PC 34163 දරණ ඡායා පිටපත් යන්ත්‍ර දෙක අළුත්වැඩියා කිරීමේ වාර්ෂික ගිවිසුම සදහා රු. 27660.00 ක මුදලක් ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ගෙවීම සදහා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සදහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.13 2018 – 2 කාර්තුව මැයි 01-15 දක්වා VAT මුදල වන රු. 95469.05 ක මුදලක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීම සදහා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සදහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**(09)** ගිණුම්

**9.1** 2018 මාර්තු මාසයට අදාල පොදු ගිණුම- වියදම් වැය විශ්ලේෂණය හා 2018 මාර්තු මස වියදම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**9.2** 2018 අප්‍රේල් මාසයට අදාල පොදු ගිණුම- වියදම් වැය විශ්ලේෂණය හා 2018 අප්‍රේල් මස වියදම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**(10)** ඇස්තමේන්තු

10:1) කෙරමිණිය පොකුණ පාර කාණු පද්ධතිය කොටසක් (මීටර් 450 පමණ) සකස් කිරීම සඳහා තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 310000/- ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි මටත් මේ ගැන වචනයක් කියන් ඕනෙ. මමත් තුක හතරක්ම කිව්ව. තුඩුවමුල්ල පාරෙ යන්න බෑ. ඒක ඇස්තමේන්තු කලාද දන්නෑ. මහ අම්බලන්ගොඩ ළිද ගැන කිව්ව. ඒ ගැනත් ඇස්තමේන්තු කරනින කියල ගියා කරේ නැහැ. ඊට පස්සෙ යොෂින් මහත්මයගේ නිවස ලග පාර කඩල ඒ මිනිස්සුන්ගෙන් සල්ලිත් අරගෙන චිත්‍රා මහත්මියගෙන් රු. 58000/- ක සල්ලිත් අරගෙන. ඒ මිනිස්සු අපිට ඇවිල්ල බනිනවා. ඇයි මේ අපේ ඇස්තමේන්තු දාන්නෙ නැත්තෙ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමිය මෙහේ ඇවිල්ල ටී.ඕ. මහත්තරුත් එක්ක කතා කරල වැඩේ කරගන්න ඕනෙ. අපේ ග්‍රේෂන් මන්ත්‍රීතුමා එහෙම ඇවිල්ල එක්කගෙන යන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි මම කියල ගෙන්නෙව්ව. මම ඔය කමිටු වලට නැහැ. ගිය පාර මම කමිටු වලට ඉඳල බැනුම් අහගත්තා. සැලසුම් කමිටුවෙදි මිව්නිස්සුන්ගෙ ප්ලෑන් පාස් වෙන්නෙ නැතුව අදටත් උසාවි වල නඩු මට. මම ඒ නිසා කිසිම කමිටුවකට එන්නෙ නැහැ. මිනිස්සුන්ට දූන්න අනවබෝධය. මම තමයි පාස් කරේ නැත්තෙ කියලා. ජනාධිපති එන දවසට මට ඇනල මම ප්ලෑන් එක පාස් කරේ නැහැ කියල කිව්වහම අපි කොහොමද සභාපතිතුමා මේ කමිටු වලට එන්නෙ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අඩුම ගානේ ටී.ඕ.ලත් එක්ක සම්බන්ධ වෙලා ඔය වැඩ ටික කරව ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

මම කියල ගෙන්නෙවුව. අනිත්එක 6 කොටස අයිති වෙන්නෙ ජගත් කුමාර මන්ත්‍රීතුමාට. එතන පුස්තකාලෙ ලග ඇස්තමේන්තුව. මට අදාලත් නැහැ. මම කරාට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි මගේ මහ අම්බලන්ගොඩ ප්‍රදේශය. මෙතුමිය සෑහෙන්න කාර්ය බහුලයි. රැකියාවත් එක්ක. මට කාල වේලාව තියෙනවා. එනිසා මම සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා ඇස්තමේන්තු ගන්න කොට එතුමියත් එක්ක මමත් මන්ත්‍රීතුමියක් පක්ෂෙන් නම් කරත් එනිසා ඔබතුමා මගෙත් ගෞරවය රැකෙන විදියට කටයුතු කරන්න කියල ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ටී.ඕ. මහත්වරු යම් ප්‍රෙද්ශයකට යනකොට ස්ථිරවම ඒ ප්‍රෙද්ශයේ කොට්ඨාශ මන්ත්‍රීවරයත් එක්කයි ඊට අමතරව ඒ ගමේ තවත් මන්ත්‍රීවරු ඉන්නවනෙ ඒ අයටත් දැනුම් දීල කෝල් කරල අපි අහවල් තැන යනව කියල යන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>
සභාපතිතුමනි මහජන නියෝජිතයො පක්ෂෙන් නම් කරත් ජනාධිපති නම් කරත් අපේ ප්‍රධාන අමාත්‍යතුමා නම්කරත් අපි නියෝජිතයො.
<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ඒක තමයි මම කිව්වෙ ඔබතුමියලත් එක්කන් යාවි. ඔබතුමිය කියපු වැඩ කොටස් අපි කරල දීල තියෙනවනෙ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්</u>
සභාපතිතුමනි පොල්වත්තෙ පිටිටනිය මනින්න ගිහිල්ල තිබුන ගිය සිකුරාදා. ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවරු 4 දෙනෙක් ඉන්නවා. අපි දන්නෙත් නැහැ පන්සලේදි ලොකු හාමුදුරුවො අහනවා මනින්න එන්නෙ කවදද කියලා. කවුරු ගියාද මම දන්නෑ ටී.ඕ. මහත්වරු.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ඒ යන හැම අවස්ථාවෙදිම ටෙලිෆෝන් කරල යන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්</u>
සභාපතිතුමනි අපෙන් ඇහුවහම එන්නැත්තෙ මොකද කියල අපි අසීරු තත්වෙට පත් වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>
සභාපතිතුමනි පන්සලේ වහලෙ උළු ටික තාම දාල නැහැ. උළු කැට 20 ක් විකතර බිඳිල.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ලේකම් තුමිය මේව තමයි හදිසි කාරණා. උළු කැට 20 අද අරගෙන දෙන්න. ටී.ඕ. මහත්මය ඒක අද කරන්න.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
අපි දැන් මෙතන 21 දෙනා එක්ක කතා කරනවා. හැබැයි වැඩ කරන්න මිනිස්සුත් ඉන්න ඕනෙ. මමත් ඇවිල්ල හැමදාම කෑ ගහනවා. නමුත් සේවනයො 6 දෙනයි 7 දෙනයි ඉන්නෙ. කොහොමද මේක කරන්නෙ. කවුරු මොනව කිව්වත් කොන්ත්‍රාත් පදනමට හරි සේවකයො ටිකක් බඳව ගන්න සභාපතිතුමා කර්මාන්ත අංශෙට.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
මට මේ ලේකම් තුමියත් එක්ක බඳව ගන්න බැහැ. තමුන්නාන්සේලා කියන දේවල් මම මෙතුමියට කරන්න කිව්වට මෙතුමිය කරන්නෙ නැහැ. ආරක්ෂක අංශයට බඳව ගන්න කියල කිව්ව තාම කෙරුනෙ නැහැ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
සභාපතිතුමා මේ සභාවෙ කැමැත්ත ගන්නකො. අපි නිලධාරීන්ට දොස් කියල වැඩක් නැහැ. මෙතන ඉන්නෙ 6 දෙනයි 7 දෙනයි. හැම මන්ත්‍රීවරයම ඉල්ලනවන කොට්ඨාශ වලට. අපි 21 දෙනෙක් ඉන්නවනෙ සභාපතිතුමා අපේ කැමැත්ත අරගෙන කරන්න. කර්මාන්ත අංශයට 10 දෙනෙක් බඳව ගන්න කොන්ත්‍රාත් පදනම යටතෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ලේකම්තුමියට බැනල වැඩක් නැහැ. මොකක්ද තියෙන බාධාව බඳව ගන්න. මම මේ වැඩිය කතා කරන්නෙ නැහැ. ඔබතුමා අපිට කතා කරන්න එපයි කියනවනෙ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම කවදයි කිව්වෙ. දැන් කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපේ කාර්ය මණ්ඩලයට බර පටවන එක අසාධාරණයි. කාර්ය මණ්ඩලයේ වැදගත්ම තනතුරු දෙක හිස්. ලේකම් තනතුරයි ගණකාධිකාරී තනතුරයි දෙකම හිස්. ඒ අය තමයි අනික් අය මෙහෙයවන්න ඕනෙ. ඉතින් ඒව හිස්ව තියාගෙන අපට මේ ගමන යන්න අමාරුයි. ඒ නිසා ඉල්ලීමක් කරල මේ හිස් තනතුරු සම්පූර්ණ කර ගන්න කියල මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මමත් නිතරම සභාවට එනව. අපි වැඩක් කිව්වම දාන්න සේවකයො නැහැ. අපි කිව්වම ඒ අය අසරණ වෙනවා. ඒ කතාව ඇත්ත.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා මම යෝජනා කරනවා කොන්ත්‍රාත් පදනම යටතේ සේවකයො 10 ක් කර්මාන්ත අංශයට බඳව ගන්න කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ඒවගේම සභාපතිතුමා මේ ඉන්න අයත් වැඩට එනවද කියල බලන්න ඕනෙ. වැඩිපුර නිවාඩු ගන්නවද එහෙම කියලා. නීතිමය පැත්තෙන් මොකක්හරි කරන්න පුළුවන්නම් හරි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ස්ථිර සේවකයන්ට නිවාඩු තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මට තියෙන ප්‍රශ්නය අපි කමිටු වලදි අනුමත කරල දුන්නා ව්‍යාපෘති මඟින් සෙවකයන් බඳව ගන්න කියලා. එහෙම බඳවා ගැනීමේ බාධාවක් තියෙනවද කියලා ලේකම් තුමිය පැහැදිලි කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ ලේකම් තුමිය කියපු ලිපිය සම්බන්ධයෙන් කියන්න ඕනෙ අද ආවෙ ෆැක්ස් එකකින්. මම නම් කවදාවත් පළාත් පාලන කොමසාරිස්ගෙන් ඇහුවෙ නැහැ මේ අය බඳවගන්න පුළුවන්ද කියලා. ව්‍යාපෘති යටතේ දෙන්නෙක් ඉන්නව මෙතන. දෙන්නෙක් ඉන්දැද්දි තව 12 දෙනෙක් බඳව ගන්න කියල සභාවෙන් කිව්වහම මේ ලියුමක් යවන්න කිසිම අවශ්‍යතාවයක් නැහැ. එහෙම නම් ඉස්සෙල්ලා අර දෙන්නත් අයින් කරන්න ඕනෙ. ඔබ තුමියට දෙන්නෙක් තියා ගන්න එක පදනමකුයි අළුතින් බඳව ගන්න තව පදනමකුයි තියෙන්නෙ. දැන් ඔබතුමන්ලා කියන වැඩ මට කරන්න සහාය තියෙන්න ඕනෙ කාර්ය මණ්ඩලයෙනුත්. ඉතින් ඔබතුමිය කැමැත්තෙන් වැඩ කරන්න පුළුවන් තැනකට යන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා කතා කරමින්</u>**
නිලධාරීන් අපහසුතාවයට පත් වෙන විදියට කතා කරන්න හොද නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ඉතින් මම මොකද කරන්නෙ මේ අය වැඩ නොකරහම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**
සභාපතිතුමා ඉහල නිලධාරීන් නැතුව මේ විදියට වැඩ කරගෙන යාම සම්බන්ධව අප ස්තුතිවන්ත වෙන්න ඕනෙ. යම් යම් අඩුපාඩු වේවි. අපි ඒක විද දරාගන්න ඕනෙ. හොරකම් වංචාව නොවෙනවනම් අපට ඕනෙ එච්චරයි. අපිට වෙන අඩුපාඩු මන්ත්‍රීවරු විදියට අපි තේරුම් ගන්න ඕනෙ. එනිසා අපි එදා සභාවෙ තීන්දුව ගත්තු විදියට මම හිතන්නෙ බදවා ගන්න ගැටළුවක් වෙන එකක් නැහැ. වක්‍රෙල්ඛනයෙ ප්‍රශ්නෙ තියෙනවනම් අපි ඊලග ටෙන්ඩර් එකට යමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්</u>**
සභාපතිතුමා සුළු සේවකයන් බදවා ගැනීමේ ව්‍යාපෘතිය කොහොමද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ලේකම් මිස් අපේ කර්මාන්ත අංශෙ 25 දෙනෙක් හිටියා. සෞඛ්‍ය අංශයේ 35 දෙනෙක් හිටියා. වෙනදා තිබුන තත්වෙනම් 60 දෙනෙක් සේවකයො අනුමතයි. එක දවසකට 15 දෙනෙක් නිවාඩු නම් එදාට අපට බලය තිබ්බ 15 දෙනෙක් බදව ගන්න. ඒ විදියට තමයි අපි වැඩ කරේ. නැත්නම් මිනිස්සු කියන වැඩ අපිට කරන්න බැහැ. දැන් එහෙම බාධාවක් තියෙනවද?

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
සභාපතිතුමා මෙතන උදේට වැඩට දානකොට 10 ක් ඇවිල්ල නැත්නම් ඒ වෙනුවට ඇවිල්ල ඉන්නව කට්ටිය ඒ අයගෙන් 10 දෙනෙක් දානව. එහෙමයි කරේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්</u>**
ලේකම්තුමිය අපිට අනුමත සේවක සංඛ්‍යාව අනුව අඩුවෙන ප්‍රමාණයට සේවකයන් බදවගන්න බැරිද? අනුමත තනතුරු වලට ගන්න පුළුවන් නම් කම්කරුවන් බදවා ගන්නෙ නැත්තෙ ඇයි?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**
කම්කරු තනතුරු වල ඉන්න අය වෙනත් දේවල් කරන එකත් ප්‍රශ්නයක්. කම්කරු තනතුරක ඉන්න කෙනා ලිපිකරු තනතුරේ වැඩ කරන කොට එතකොට කම්කරු තනතුරේ වැඩ කරන්නෙ කවුද? එතන පුරප්පාඩුව වෙනවනෙ. ලිපිකරු තනතුරට අපිට පළාත් සභාවෙන් ගෙන්න ගන්න පුළුවන්නෙ. එනිසා කම්කරු තනතුරට බදව ගත්ත කෙනා කරුණාකරල ලිපිකරු තනතුරට යන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ඒ දේවල් දැන් බලල වෙනස් කරගෙන යනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා කතා කරමින්</u>**
නිත්‍ය තනතුරේ නැතුව වෙනත් තනතුරු වල යෙදෙව්වහම ඔය ප්‍රශ්නෙ එනවා.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:2) කෙරමිණිය පතිරාජ පාර අංක 26 නිවස අසල කාණු පද්ධතිය (මීටර් 70 පමණ) සකස් කිරීම සඳහා තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 630000/- ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්**

සභාපතිතුමනි පළවෙනි එකේ මීටර් 450 ට රු. 310000/- යි. මේකෙ මීටර් 70 ට රු. 630000/- ක් දාල තියෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පළවෙනි එකේ මීටර් 45 ක් වෙන්න ඕනෙ.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී කෙරමිණියගේ ශ්‍රේෂන් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:3) නගර සභා ක්‍රීඩාංගණයේ ඇති ක්‍රීඩා මණ්ඩපය වයරින් කිරීම සඳහා තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 171001/- ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

මේක කරන්නෙ අපේ අයද? නැත්නම් පුස්තකාලෙ වැසිකිළිය හැදුව වගේ වේවි.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:4) පටබැදිමුල්ල ආදාහනාගාරය අළුත්වැඩියා කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ සංවර්ධන සහ ව්‍යාපෘති අංශයේ අධ්‍යක්ෂතුමා විසින් සකස් කරන ලද රු. 35204.08 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔබතුමාලට දැනගන්න කියන්න ඕනෙ පටබැඳිමුල්ල ආදාහනාගාරයේ වැල් එකක් කැඩිල ඒක පුපුරනව කියල මට කිව්ව. එදා වැහුව නම් දැන් මාස දෙකක් විතර වහලා. මම කිව්ව ඔයිට වඩා හොඳ ඉංජිනේරුවෙක් ඉන්නවා අපේ ක්‍රිෂාන්ත මහත්මයා. එයත් එක්ක ගිහිල්ලා බලන්න කියලා. එතුමා රු. 3000/- කින් විතර මේක හැදුවා. අපේ කම්කරුවෙක්. අපි ඒ මහත්මයට ස්තුතිවන්ත වෙන්න ඕනෙ.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:5) පටබැඳිමුල්ල ආදාහනාගාරය අළුත්වැඩියා කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ සංවර්ධන සහ ව්‍යාපෘති අංශයේ අධ්‍යක්ෂතුමා විසින් සකස් කරන ලද රු. 2060612.24 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10.6 දේවානන්ද විද්‍යාලය අසල කාණුව ඉදිකිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 600000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10.7 විලේගොඩ ධම්මයුක්තිකාරාම මාවත අළුත්වැඩියාව කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 310000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10.8 විහාරගොඩ මාවත සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 1250000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේක අශෝක ධනවංශ මහතා මුදල් එවනවයි කියල ඇස්තමේන්තු කරන්න කිව්වෙ. අපි මේක එතුමාට යොමු කරමු.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10.9 කරිත්තකන්ද සක්වා ප්‍රින්ටර්ස් පාර කොන්ක්‍රීට් කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 600000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10.10 අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගණයේ ක්‍රීඩා මණ්ඩපය ඉදිරිපිට බිම සකස් කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 1700000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම ක්‍රීඩාංගණයට ඇතුල්වෙන්න අමාරුයි එතන මඩ වෙලා. ඒ ටික හදන්නෙ නැතුව ඇතුල්වෙන්න අමරුයි.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10.11 අංක 83 පීරිස් වෙද මාවත අවසන් කොටස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 200000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

**මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10.12 හිරේවත්ත විජේ මහතාගේ නිවස අසල කොන්ක්‍රීට් කාණුව ඉදිකිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 150000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේක ග්‍රාමීය යටිතල පහසුකම් වැඩිකිරීම යටතේ 120000/- ක් ලැබෙන්න තියෙනවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට. ඒ ගානට කරන්න බැහැ කියල මම ආපහු ඇස්තමේන්තු කරා. ඒකෙ බැලන්ස් එක තව රු. 30000/- ක් අපිට දරන්න වෙනවා. ඒක අපි නගර සභාවෙන් ගෙවල මන්ත්‍රීතුමා මේක කරවන්න.

<u>තීරණය</u>

**මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10.13 අම්බලන්ගොඩ නගර සභාව සතු හල්වතුර ඉඩම වටා තාප්පයක් ඉදිකිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 3000000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම ලිපිය සම්බන්ධයෙන් තවත් ලිපියක් ඇවිත් තියෙනවා. අපි හිතුවෙ මේ ඉඩමෙ අපේ යන්ත්‍ර සූත්‍ර සියල්ලම දාන්න තැනක් නැති නිසා වහලක් ගහල එතන දාන්න කියලා. එතකොට සෞඛ්‍ය අංශයේ වාහන ඔක්කොම එතන දාන්න තමයි කටයුතු කරල තියෙන්නෙ. මේ ඉඩම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනුත් ඉල්ලීමක් ඇවිත් තියෙනවා. ඉදිකිරීමක් කරන්න දෙන්න කියලා. එහෙම දුන්නොත් අපිට තැනක් නැති වෙනවා. ඩෙනට් මන්ත්‍රීතුමා ඒක පැහැදිලි කරල කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

මේක ඔබතුමා එදා මම හිතන්නෙ හරියට පැහැදිලි කරගත්තෙ නැද්ද දන්නැහැ. එම ඉඩම අම්බලන්ගොඩ සංවර්ධන කමිටුවෙන් ඉල්ලුවෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටා තිබෙන ඉඩම ගොඩනැගිලි සියල්ලම අම්බලන්ගොඩ නගර සභාවට පවරන තීන්දුවත් එක්ක. අපි මුලින් උත්සාහ කරේ වාරිමාර්ගෙ ඉඩම ගන්න. ඒක හරිගියේ නැහැ. මම ඒකට ආයෙත් ඇමතිතුමාව හම්බවෙන්න යනවා. අපි එදා යෝජනා කරේ අම්බලන්ගොඩ ගාළු පාර අයිනෙ තියෙන ඉඩම සහ ගොඩනැගිලි අම්බලන්ගොඩ නගර සබාවට පවරන්න ඒ වෙනුවට අපට මුදල් හම්බවෙලා තියෙනවා ලොකු ගොඩනැගිල්ලකට. ඒ මුදල යන්න කලින් රජයේ කාර්යාල එකම තැනකට ගේන්න මහල් 6 කින් විතර යුත් ගොඩනැගිල්ලක් ඉදි කරන්න තමයි බලාපොරොත්තුව තිබුනෙ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීවරුන්ගෙ අදහස මොකක්ද මේ සම්බන්ධව?

මන්ත්‍රීතුමා මේක යෝජනාවක් වශයනේ ඉදිරිපත් කරන්න. ලබන සභාවෙදි කතා කරමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

**සභාපතිතුමා අපි නගර සභාවක් විදියට මන්ත්‍රීවරු සියළු දෙනාම මේ තීන්දුවට එකග වෙනව නම් එතන භූමි භාගය අසීමිත වටිනාකමක් තියෙනවා. එනිසා මේ ලක්ෂ තිහ වියදම් කරන්න එපා එහෙමනම්. මෙතුමා කිව්ව දාහතයි මේ තිහයි දාල අපි පිට්ටනියෙ තණකොල අල්ලමු.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමාගෙ යෝජනාව වැදගත් යෝජනාවක් ලෙස මම හිතනවා. මොකද නගර සභාවෙන් දෙයක් ඉල්ලන්නෙ නගර සභාවට දෙයක් දීල. මොකද අපි ටී.එච්.ඩබ්. නිවාස ව්‍යාපෘතිය හැදුවෙ ගෙවල් 84 යි. එතකොට සභාවෙ හිටපු සභාපතිතුමා මේ යෝජනාව කරහම මම එදා කිව්ව එතකොට මම විපක්ෂ නායක මිනිස්සු 50 කට ගෙවල් 50 ක් ද 6000 කට 7000 කට කුණු ද කියන ප්‍රශ්නෙට තමයි කියල මේ අද අත උස්සන්නෙ. හැබැයි ගෙවල් නැති වුනේ අපේ ගමෙ මිනිස්සුන්ට නිසා මම මේකට එකග වෙනව කියල. නමුත් ඊට පස්සෙ ජී.එම්.එස්. මහත්තයටත් අම්බලන්ගොඩ නගරෙ කුණු ඇදගන්න බැරි වුනා මාස 3 කට හරතරකට වැඩිය. මානාන පිට්ටනියෙ කුණු දැමීම තහනම් නියෝගයකින් තහනම් කරා. අපි අක්කර 4 1/2 ක ඉඩමක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දුන්නට එවැනි සමාන ඉඩමක් අදටත් අපිට දුන්නෙ නැහැ රජයෙන්වත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්වත්. ඊට වැඩිය යහපත් යෝජනාවක් මේක. යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරන්න ලබන සභාවට. අපි කතා කරමු.

**<u>තීරණය</u>**

**මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10.14 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ කැටැන්තොට පෙර පාසලේ සෙල්ලම් මිදුල සකස් කිරීම සදහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 1000000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී. පේෂලා කුමාරි මහත්මිය කතා කරමින්</u>**

බීච් පාර්ක් එකෙත් පොඩි අයට සෙල්ලම් කරන්න උපකරණ ටිකක් පුළුවන්නම් හදල දෙන්න. මාතර නම් තියෙනවා. දෙක තුනක් හරි පොඩි අයට හදල දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බීච් පාර්ක් එකේ අපි හයි කරල තිබුනෙ. මාස 3 කට වැඩිය තිබුනෙ නැහැ. කඩල ගියා. ප්ලාස්ටික් වලින් තමයි හදන්න වෙන්නෙ.

<u>තීරණය</u>

**මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10.15 විජයාරාම පටුමග ඩයලොග් කුළුණ පාමුල වටරවුම් පාරේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 300000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

**මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10.16 මහ අම්බලන්ගොඩ පුස්තකාලය අසල කාණුව නවීකරණය කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 120000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>

සභාපතිතුමනි මට පොඩ්ඩක් කතා කරන්න අවසර දෙන්න. මහ අම්බලන්ගොඩ කාණුව සෑදීම සම්බන්ධ ලිපිගොනුව මම දැන් බැලුවෙ. කරපු බොරුව මම දැක්කා දැන් ඇස් දෙකටම. 2017 පළාත් නිශ්චිත වලින් මුදල් ඇවිල්ලා තියෙනවා. මේ කාණුව මගේ ගෙදර ළඟින් තමයි නැවැත්තුවේ. එතනින් එහාට කාණු තියෙනවා. මේකෙ ලියල තියෙනවා ඉහත කාණුව ඉදිකිරීම සම්බන්ධව ප්‍රදේශවාසියෙකු විසින් විරෝධතාවය මතු කිරීම නිසා කල නොහැකි තත්වයක් උද්ගත වී ඇත. මෙම කර්මාන්තයේ බිල්පත 2017-12-31 දිනට පෙර බිල්පත ඉදිරිපත් කල යුතුයි කියල අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරල තියෙනවා. මේ කලින් හිටපු ලේකම්තුමියගෙ කාලෙ සභාපතිතුමා මේව මහ කැත වැඩ. මම මේකට මානව හිමිකම් යනවා. ප්‍රදේශවාසියෙකුගේ දෙයක් අහන්න ඕනෙද සභාපතිතුමා මේක මගේ ගේ ඉස්සරහ කාණුව. මෙතන අපි මහජනතාව වෙනුවෙන් සේවය කරන්න ඇවිල්ල ඉන්නව. අපේ අයිතිවාසිකම් රකින්නෙ නැත්තම් අනික් ජනතාව ගැන කුමන කතාව සභාපතිතුමා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඔය කාණුව හදද්දි ඔබතුමියගෙන් විමසීමක් කරේ නැද්ද?

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>

නැහැ සභාපතිතුමනි. මේක මේ පනියන්දූව ග්‍රාම සංවර්ධන සමිතිය ගිවිසුම් අතිසන් කරලා තියෙනවා. දෙපැත්තෙ යන කාණු පද්ධතියට කවුද විරුද්ධ වෙන්නෙ. මේක මහ පුදුම ද්වේශ සහගත ක්‍රියාවක්නෙ. විරුද්ධ වෙන්න ඕනෙ මම. මගේ ගෙයි ඉස්සරහයි කැඩෙන්නෙ. මෙහෙම බොරු ලියන්න හොද නැහැ. මේකෙ සහතික පිටපතක් මා වෙත නිකුත් කරන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා සභාපතිතුමා. මේව මේ රාජ්‍ය පරිපාලන සේවා නිලධාරීන් කරන වැඩද?

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ටී.ඕ. මහත්තය මේක ගිවිසුම්ගත වෙලා තිබියදී මුදලුත් වෙන් වෙලා තිබියදී වැඩ කරන්නෙ නැතුව ඉදල තියෙන්නෙ ඇයි.

<u>තීරණය</u>

**මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(11)** වෙනත් කරුණු

11:1 ' ක්‍රීඩා පිටිය ලබා ගැනීම ' මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරීතුමිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ග්‍රාම සංවර්ධන සතියට සමගාමීව පැවැත්වෙන සය සාමාජික ක්‍රිකට් තරගාවලිය 2018-05-02 දින දවස පුරා පැවැත්වෙන බවත් ඒ සඳහා මානාන ක්‍රීඩාපිටිය ගාස්තු අය කිරීමකින් තොරව ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

සය සාමාජික ක්‍රිකට් තරගාවලිය සඳහා 2018-05-02 දින මානාන ක්‍රීඩාපිටිය ගාස්තු අය කිරීමකින් තොරව ලබා දීමට **සභාව තීරණය කරන ලදී.**

**11:2** “ Changing Room” ගොඩනැගිල්ලේ පළමු මහල ජල ක්‍රීඩා සමාජයේ මූල්‍ය වියදමින් ඉදිකිරීම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ ඩොල්ෆින් ජල ක්‍රීඩා සමාජයේ යාවජීව සාමාජිකයන් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාව මගින් “ Changing Room” ගොඩනැගිල්ල ඉදිකර දීම සම්බන්ධව ස්තුතිවන්ත වන බවත් මෙහි පළමු මහල ඩොල්ෆින් ජල ක්‍රීඩා සමාජයේ මූල්‍ය වියදමින් ඉදි කර හැකි බවත් ඒ සඳහා නගර සභාවේ අධීක්ෂණය හා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>
සෝභිත මන්ත්‍රීතුමා, ඩොල්ෆින් ජල ක්‍රීඩා සමාජයේ ගොඩනැගිල්ලක් හදනව. එදා මම ඔබතුමාට කරපු යෝජනාව කරන්න හැකියාවක් තියෙනවද?

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්**</u>
**සභාපතිතුමා මම ඇමතිතුමත් එක්ක කතා කරල ඔබතුමාට කියන්නම්.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>
ඩෙනට් මන්ත්‍රීතුමා , සෝභිත මන්ත්‍රීතුමා කිව්ව එතුමාට ලක්ෂ 50 ක් වජිර අබේවර්ධන ඇමතිතුමා දෙනවයි කියලා. ගොඩනැගිල්ලක් ගහන්න තැනක් ඉල්ලුවා හිරේවත්ත ප්‍රදේශයෙන්. ළිදක් තියෙන තැනක් මෙතුමා ඉල්ලුවේ. එහෙම වුනොත් කාර්ය වෙනස් වෙලා පරිත්‍යාගය කරපු කෙනාට නැවත ඒක ඉල්ලන්න පුළුවන්. එනිසා මම මෙතුමාට යෝජනා කරා අවශ්‍ය දේ මොකක්ද කියල. එතුමාට අවශ්‍යයි කිව්ව ග්‍රාම නිලධාරී මහත්තයට, සමෘද්ධි නියාමකට සේවා පියසක් හදන්න. අපෙත් අදහසක් තියෙනවා ජල තටාකයේ මේ පැත්තෙන් නැරඹුම් වේදිකාවක් හදල උඩ යම් රෙස්ටුරන්ට් එකක් වගේ හදල ඒක බදු දීල ආදායම් වැඩි කර ගැනීම. ඒවගේම රජයේ සේවකයන්ට, ජල ක්‍රීඩා සමාජයේ අයට සේවා සපයන ස්ථානත් හදන්න පුළුවන්. මෙතුමාට මෙවනි මුදලක් ලැබෙනවනම් ඒ ඉඩම අපට නිදහස් කරන්න පුළුවන් ඒ කාර්ය සඳහා. ඔබතුමා ඒ කටයුතු කරන්න කියල ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>
**සභාපතිතුමා සේවා පියස සඳහා 2017 අවුරුද්දෙ අන්තිම කාලෙ මුදල් දුන්නෙ. ඒකට දෙන්නෙ මිලියන 2 යි.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**</u>
**සභාපතිතුමා රුහුණු සංචාරක කාර්යාංශය මගින් මේකෙ ලොකු සංවර්ධන වැඩ පිළිවෙලක් යනවා. ප්‍රධාන අමාත්‍යතුමා අවශ්‍ය මුදල් ලබා දීල ඒ සහයෝගය දෙනවා. ඇත්තටම එතන ලස්සන ප්‍රදේශයක්. මාදම්පා ගඟ ආරම්භ වන ස්ථානය. එතන ලස්සනට තියෙන්න ඕන නිසා තමයි රුහුණු සංචාරක කාර්යාංශයෙන් හිටපු සභාපතිතුමා මේ කටයුතු කරේ. තියෙන ගොඩනැගිල්ලෙම උඩට හදන්න කියන්න. ඒකෙ ප්‍රශ්නයක් නැහැ. අපේ කාර්යාංශයෙන් හදපු ගොඩනැගිල්ලෙ වැඩ නිම වෙමින් පවතිනවා. ළඟදිම ප්‍රධාන අමාත්‍යතුමා මූලික වෙලා ඒක ආරම්භ කරනවා. මේ සභාවෙන් යම් දෙයක් කරන්න කියල කියනව නම් ප්‍රධාන අමාත්‍යතුමාගෙන්**

**සහයෝගය ලබාගෙන ඒ කටයුතු කරමුයි කියමින් ඒ සංවර්ධන කටයුත්තට ඔබතුමාලාගේ සහයෝගය ලබා දෙන්නයි ඉල්ලමින් මම නිහඬ වෙනවා.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ඒ ඉදිකිරීම කරල තියෙන්නෙ වැරදි තැනක. රේල්පාර ඩබල් ලයින් එකක් වෙන්න ලගදිම නියමිතයි. එතකොට ඔය හදපු ගොඩනැගිල්ල කැඩෙනවා. අපි හදපු ගොඩනැගිල්ල හදල තියෙන්නෙ සීමාව පන්නල.

***<u>තීරණය</u>***

" Changing Room" ගොඩනැගිල්ලේ පළමු මහල ජල ක්‍රීඩා සමාජයේ මුල්‍යා වියදමින් ඉදිකිරීම සඳහා අවසර ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම සඳහා පසුව තීරණයක් ගැනීමට සභාව විසින් තීරණය කරන ලදී.

**11:3** ' නොමිලේ ප්‍රචාරන දැන්වීම් පුවරුවක් පළ කර ගැනීම සඳහා ' මැයෙන් අම්බලන්ගොඩ යූනියන් බැංකුව විසින් එවා තිබූ ලිපිය සභාගත සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ යූනියන් බැංකු ශාඛාව මගින් පළමු වරට පවත්වනු ලබන ලේ දන්දීමේ වැඩසටහනට අදාල දැන්වීම් පුවරු දෙකක් මුදල් අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>
මෝදර දේවාලෙ එක කඩල මේවට ඉඩ දෙනවට අපි විරුද්ධයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මේක ඒකට අදාල නැහැ.

***<u>තීරණය</u>***

ලේ දන්දීමේ වැඩසටහනට අදාල දැන්වීම් පුවරු දෙකක් මුදල් අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දීම වෙනුවෙන් ඡන්දය විමසනු ලදුව පක්ෂව ඡන්ද 11 ක්ද විපක්ෂව ඡන්ද 10 ක් ද ලැබුන අතර වැඩි ඡන්ද 1 කින් එය සම්මත විය.

**(12)** න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12.1 ‘ අම්බලන්ගොඩ නගර සංවර්ධනය සදහා හල්වතුර ව්‍යාපෘතිය යටතේ රජයට අත්පත් කරගත් ඉඩම් ’** මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

**අම්බලන්ගොඩ නගර සංවර්ධනය සදහා හල්වතුර ව්‍යාපෘතිය යටතේ 1989 දී රජයට අත්පත් කරගත් අක්කර 230 ක් පමණ වන භූමි ප්‍රමාණයෙන් අක්කර 30 ක පමණ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සංස්ථාවට පවරා දීමෙන් පසු වන්දි පොළී ගෙවා අවසන් කර ඇති බවත් ඉතිරි අක්කර 200 ක භූමි ප්‍රමාණය සදහා වන්දි පොළී ගෙවා නොමැති අතර සංවර්ධන කටයුතු සිදු කිරීමට ඇති බවත් එමෙන්ම හිමිකම සනාථ වූ ඉඩම් සදහාද වන්දි පොළී ගෙවීමේ හැකියාව නගර සභාවට නොමැති බව දන්වා ඇති බවත් ඒ අනුව මෙම ඉඩම්වල භුක්තිය නගර සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාර දීමෙන් අනතුරුව එම වන්දි හා පොළී මුදල් ගෙවීමට එම අධිකාරිය විසින් එකගත්වය පළ කර ඇති බවත් මේ සම්බන්ධව කිහිප අවස්ථාවකදීම ඉල්ලීම් සිදු කර ඇති මුත් නගර සභාව විසින් මෙම ඉඩම්වල අයිතිය නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරීමක් සිදු කර නොමැති බවත් එමෙන්ම නගර සභාව විසින් කැළි කසල අපහරණය සදහා යොදා ගනු ලබන අක්කර 18 ක පමණ භූමි ප්‍රමාණය ඒ සදහාම වෙන් කර දී ඉතිරි ඉඩම් ප්‍රමාණයේ නිරවුල් භුක්තිය නාගරික සංවර්ධන අධිකාරිය වෙත වෙත පවරා දීමට කටයුතු කරන ලෙසත් දන්වා තිබුණි.**

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>
සභාපතිතුමා පැහැදිලි විස්තරයක් අරගෙන කරන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
සභාපතිතුමනි ඉස්සරහට නගරයේ කුණු දාන්න තැනකුත් ඕනනේ. අපිට කුණු දාන්න තැනක් නැහැ. කුණු දාන්න තිබුන තැන තමයි ටී.එච්.ඩබ්. නිවාස හැදුවෙ. ඒ නිසා අපිට කොටසක් හෝ තියාගෙන ඕනෙ මේක නිදහස් කරන්න. ඒ නිසා මේක ගැන වෙනම සාකච්ඡා කරල කරන්න ඕනෙ. එකපාරටම දෙන්න එපා. අපිටත් තියෙන්නෙ ඔච්චරයිනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
නාගරික සංවර්ධනය අධිකාරිය මේක අරගෙන කරන්නෙත් කාටමරි ව්‍යාපෘතියකට දෙන එක. කලින් මේක අරගෙන ගොල්ෆ් ක්‍රීඩාංගණයක් හදන්න හැදුවා. මොනව උනත් වගකීමක් තිබෙනවා ඉඩම් ලාභීන්ගේ වන්දි ගෙවන්න. අපිට ගෙවන්න බැරි නම් දෙන්න ඕනෙ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>
සභාපතිතුමනි ඔබතුමා කියන විදියට නාගරික සංවර්ධන අධිකාරියෙන් මේක කාටහරි දීල දැම්මොත්. අපි මීට පෙර සභාවලදි නාගරික සංවර්ධන අධිකාරිය විවිධ සැලැස්මවල් ඉදිරිපත් කරල තියෙනවා. මේක අරගෙන ආයෝජකයෙක්ට දුන්නොත්. මම හිතන්නෙ වන්දි මුදල කෝටි 2 ක් විතර ඇති. ඒ විසුතර ඉස්සෙල්ලා ගෙන්න ගන්න සභාපතිතුමනි.

<u>තීරණය</u>

**මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව මීළග සභා වාරයේ න්‍යාය පත්‍රයට ඇතුලත් කර තීරණයක් ගැනීම සුදුසු බව සභාව විසින් තීරණය කරන ලදී.**

**12.2 ' අබලි වාහන අපහරණය '** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

නගර සභාවට අයත් SP GC -8213 දරණ ත්‍රීරෝද රථය, SP SF -1521 අත් ට්‍රැක්ටරය, 37 ශ්‍රී 1877 ට්‍රැක්ටර් මැෂිම යන වසර ගණනාවක් පුරා දිරාපත් වෙමින් සහා භූමිය තුල දිරාපත් වෙමින් පවතින වාහන ටෙන්ඩර් කිරීම සදහා හෝ යකඩ බරට විකිණීම සදහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
සභාපතිතුමනි යකඩ බරට දුන්නොත් පොඩි ගණන් වලට යන්නෙ. යකඩ බරට දෙන්න එපා. මොකද පොත් තියෙන වාහන. ඒ නිසා ලියා පදිංචි සහතිකයත් එක්ක වෙන්දේසි කරන්න තීරණය කරන්න.

<u>තීරණය</u>

නගර සභාවට අයත් SP GC -8213 දරණ ත්‍රීරෝද රථය, SP SF -1521 අත් ට්‍රැක්ටරය, 37 ශ්‍රී 1877 ට්‍රැක්ටර් මැෂිම යන වාහන ටෙන්ඩර් කිරීම සිදු කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදී.

**12.3 ' ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු නගර සභා මන්ත්‍රීවරුන්ගේ දුරකථන දීමනාව '** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාවේ ගරු සභාපතිතුමාගේ නිවසෙහි දුරකථනය සදහා මාසික ගාස්තුව සීමාවක් නොමැති බවත් , ජංගම දුරකථනය සදහා මාසිකව රු.2000/- ක් බවත් ගරු උප සභාපතිතුමාගේ නිවසෙහි දුරකථනය සදහා මාසික ගාස්තුව රු. 2500/- ක් බවත් ජංගම දුරකථනය සදහා මාසිකව රු. 1500/- ක් බවත්, ගරු නගර සභා මන්ත්‍රීවරුන්ගේ මාසික දුරකථන දීමනාව වශයෙන් නිවස හෝ ජංගම දුරකථනය සදහා රු. 1500/- ක මුදලකුත් ගෙවීම් කිරීම සදහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
මන්ත්‍රීවරුන්ගේ නිවාස සදහා ස්ථාවර දුරකථනයක් සවි කිරීමේ අවස්ථාව තියෙනවා. ඉල්ලීම සිදු කරන්න දැනට සභාවෙන් අරගෙන නැති අය.

තීරණය

ගරු සභාපතිතුමාගේ නිවසෙහි දුරකථනය සඳහා මාසික ගාස්තුව සීමාවක් නොමැති අතර , ජංගම දුරකථනය සඳහා මාසිකව රු.2000/- ක් ද ගරු උප සභාපතිතුමාගේ නිවසෙහි දුරකථනය සඳහා මාසික ගාස්තුව රු. 2500/- ක් ද ජංගම දුරකථනය සඳහා මාසිකව රු. 1500/- ක් ද, ගරු නගර සභා මන්ත්‍රීවරුන්ගේ මාසික දුරකථන දීමනාව වශයෙන් නිවස හෝ ජංගම දුරකථනය සඳහා රු. 1500/- ක මුදලක් ද ගෙවීම් කිරීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

12.4 **' කාය වර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම '** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

නගර සභාව සතු කාය වර්ධන මධ්‍යස්ථානය වෙනුවෙන් 2015 වසරේදී වැඩිහිටි සාමාජිකයෙකුගෙන් මසකට රු. 600/- ක් ද පාසැල් සාමාජිකයෙකුගෙන් රු. 250/- ක් ද අය කිරීම් කර ඇති බවත් ඉදිරියේදී අය කල යුතු මිල ගණන් සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලීම් කර තිබුණි.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**

සභාපතිතුමනි උපදේශකවරයෙකු ඉන්නවද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැනට අපි මෙතන හිටපු මහේෂ් පත්කර එතෙන්ට.

තීරණය

අම්බලන්ගොඩ නගර සභාවට අයත් කාය වර්ධන මධ්‍යස්ථානය සඳහා වැඩිහිටි සාමාජිකයෙකුගෙන් මසකට රු. 600/- ක මුදලක් සහ පාසැල් සාමාජිකයෙකුගෙන් මසකට රු. 250/- ක මුදලක් අයකිරීම සුදුසු බවට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී

12.5 **' ළමා ඩෙස්ක් පුටු ලබා ගැනීම '** මැයෙන් කැටැන්තොට ශ්‍රී සුමනමාතාරාමයේ විහාරාධිපති හිමියන් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

කැටැන්තොට පෙර පාසලෙන් ඉවත් කරන ලද ළමා පුටු හා ඩෙස්ක් දහම් පාසලේ කුඩා දූ පුතුන් වෙනුවෙන් ලබා දෙන මෙන් ඉල්ලීම් කර තිබුණි.

තීරණය

**ඕකන්ද හා කැටැන්තොට පෙර පාසැල් ප්‍රමිතිකරණය යටතේ භාවිතයෙන් ඉවත් කරන ලද යකඩ ඩෙස්ක් සහ පුටු කැටැන්තොට සුමනමාතාරාමයට හා ඕකන්ද විහාරස්ථානයට ලබා දීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12.6 ‘ තුඩුවමුල්ල එක්සත් බෞද්ධ සුභ සාධක සමිතිය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධවයි ’** මැයෙන් තුඩුවමුල්ල, එක්සත් බෞද්ධ සමිතිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අප සමිතිය ආරම්භ කර වසර 12 ක් පමණ ගත වන මුත් සමිතිය සතු භාණ්ඩ ගබඩා කර ගැනීමට ස්ථානයක් නොමැති බවත්, සමිතියේ ඉල්ලීම පරිදි තුඩුවමුල්ලේ පදිංචි කමල් පෙරේරා මහතා විසින් ඉඩම් කොටසක් සමිතිය වෙත නීත්‍යානුකූලව ලබා දුන් බවත් එබැවින් ප්‍රෙදේශවාසීන්ට කරන ප්‍රජා සත්කාරයක් සේ සලකා මෙම ඉඩම් කොටසේ ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලීම් කර තිබුණි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මෙතන පොඩි ගැටළුවක් තියෙනවා. පර්චස් 2 ක ඉඩම් කැබැල්ලක් තමයි දීල තියෙන්නෙ. කලින් වැඩ බලපු ලේකම්තුමිය මේ පර්චස් දෙක අනුමත කරල තියෙනවා. ඒ කියන්නෙ නීතියට පටහැනියි. සැලසුම් කමිටුවට මේකට නීත්‍යානුකූල අවසරය දෙන්න බැහැ. ඒ නිසා තමයි සභාවෙ අවසරය ඉල්ලන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා කතා කරමින්</u>**
සභාපතිතුමනි වැසිකිළි පහසුකම් එහෙම හැදුවොත් තමයි ප්‍රශ්නෙ. ගබඩාවක් නම් ප්‍රශ්නයක් නැහැ.

<u>තීරණය</u>

**පොදු කටයුත්තක් බැවින්, තුඩුවමුල්ල එක්සත් බෞද්ධ සුභ සාධක සමිතිය සතු උපකරණ සහ භාණ්ඩ ගබඩා කර තැබීම වෙනුවෙන් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒ සඳහා ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12.7 ‘ ඕස්ට්‍රේලියානු සංචාරය සඳහා අනුග්‍රහයක් ලබා ගැනීම සම්බන්ධවයි ’** මැයෙන් මහා වීදියේ, අංක 299 හි නිල්මිණි කේ. ලියනපතිරණ මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

මාගේ දියණිය වූ පුංචිහේවාගේ රවිනි සශ්‍රිකා ශිෂ්‍යාව ශ්‍රී ලංකා පාසැල් දැල්පන්දු කණ්ඩායම නියෝජනය කරමින් ඕස්ට්‍රේලියානු සංචාරයක යෙදීමට නියමිත බවත් එම සංචාරය සාර්ථක කර ගැනීම සඳහා අනුග්‍රහයක් ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලීම් කර තිබුණි.

<u>තීරණය</u>

**මෙම ලිපිය ගරු මන්ත්‍රීවරුන්ගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12.8** **‘ කෙරමිණිය පුස්තකාලය අසල ඉඩම පරිත්‍යාග කිරීම ’** මැයෙන් නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්, ලූෂාන් වඩුතන්ත්‍රි මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ, කළුවඩුමුල්ල, ශ්‍රී විජයාරාම පාර, අංක 19/7 හි පදිංචි එස්.එම්.එම්. ආර්. විරේසේකර මහත්මිය විසින් ඇගේ ඉඩමෙන් කොටසක් පරිත්‍යාග කිරීමට අවශ්‍ය බව දන්වා ඇති බවත් අංක 32 දරණ ඔප්පුවේ පිටපත සහ අදාල පත්ඉරු අමුණා ඇති බවත් අදාල ඔප්පුව නොතාරිස් ගාස්තු වලින් තොරව මා විසින් අනුමත කර දෙන අතර මුද්දර ගාස්තු ලෙස රු. 4500/- ක් සහ පත්ඉරු ලබා ගැනීම සඳහා රු. 100/- අතුළු රු. 4600/- ක මුදලක් ද අදාල පරිත්‍යාගය ලබා ගැනීමට සභාවේ කැමැත්තද ලබා දෙන ලෙස ඉල්ලීම් කර තිබුණි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි කෙරමිණිය පින්නදූවට ක්‍රීඩා පිටියක් පිළිබඳ අදහස දීර්ඝ කාලයක් තිස්සෙ තිබුනා. ඒ සඳහා අපේ ගමේ උපන් රෝහිනී මල්ලිකා මහත්මිය පර්චස් 34 ක් දෙන්නෙ. නොතාරිස් ගාස්තු එතුමා නොමිලේ කරන්නෙ උපන් බිමේ වැසියෙක් නිසා. ඒවගේම ඊට යාබදව අක්කර 1/ 2 ක පමණ කොටසක් ලබා ගැනීමේ ඉඩක් තියෙනවා. මීට පෙර ප්‍රධාන අමාත්‍යතුමා අපේ ගම ගැන ඇල්මෙන් රු. 800000/- ක් එවල තිබුනා. දැන් ඒක පොළී වෙලත් ඇති. ඒ මුදල යොදාගෙන බැරිද රජයේ තක්සේරුවට යාබද ඉඩමෙන් මේකට සම්බන්ධ කර ගන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

සල්ලි තියෙනවද කියල බලන්න ඕනෙ. කාර්ය නොකෙරුණොත් අවුරුද්දෙ අන්තිම සල්ලි යවන්න ඕනෙ. අපි බලමු ඒක කරන්න.

<u>**තීරණය**</u>

අම්බලන්ගොඩ, කළුවඩුමුල්ල, ශ්‍රී විජයාරාම පාර, අංක 19/7 හි පදිංචි එස්.එම්.එම්. ආර්. විරේසේකර මහත්මිය විසින් නගර සභාව වෙත පරිත්‍යාග කරනු ලබන **කෙරමිණිය පුස්තකාලය අසල ඉඩම සඳහා** මුද්දර ගාස්තු ලෙස රු. 4500/- ක් සහ පත්ඉරු ලබා ගැනීම සඳහා රු. 100/- අතුළු රු. 4600/- ක මුදලක් ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**12.9** **‘**අම්බලන්ගොඩ, .තැලිගලකන්ද ඉඩම සඳහා තක්සේරු වාර්තාව ලබා ගැනීම **’** මැයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව, දකුණු පළාත මගින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ, තැලිගලකන්ද ඉඩමෙහි කැබලි අංක 01,02,03 හා 04 කොටස් පදිංචිකරුවන්ට පැවරීම සඳහා 2018 වර්ෂයට අදාල තක්සේරු වාර්තාව ලබා දෙන බවත් කැබලි අංක 01 සඳහා රු.675000/- ක් ද , කැබලි අංක 02 සඳහා රු. 300000/- ක් ද, කැබලි අංක 03 සඳහා රු. 320000/- ක් ද කැබලි අංක 04 සඳහා රු. 535000/- ක් ද වන බවත් මෙම තක්සේරුව ඉහත කාර්ය සඳහා හැර වෙනත් අරමුණක් සඳහා යොදා නොගන්නා ලෙසත් දන්වා තිබුණි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ අර ප්‍රශ්න සහගත වෙච්ච ඉඩම සම්බන්ධව.මෙතනදි තීන්දු දෙකක් තියෙනවා. එකක් තමයි පෙත්සම් කාරක සභාවෙ ගත්ත තීන්දුව සම්බන්ධව නැවත කරුණු දක්වන් සභාවට අවසර දෙන්න කියන එක. අනිත් එක තමයි පෙත්සම්කාරක සභාවෙ ගත්ත තීන්දුව සම්බන්ධව ක්‍රියා කිරීම. සභාව කියන්නෙ මොකක්ද මට කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පන්යන්දුවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි දැන් ඕක නගර සභාව සතු ඉඩමෙ කුමන හේතුවක් මත හරි ඒ මිනිස්සු ගෙවල් හදන්නෙ. අපිට පදිංචි වෙලා ඉන්න මිනිස්සුන්ට ගෙවල් කඩාගෙන යන්න කියන්න බැහැනෙ. අපි දැන දැනත් ඒ මිනිස්සුන්ට ගෙවල් හදන්න ඉඩ දීල කරන ලොකු බලවත් අසාධාරණයක්. කෝටි ගණන් නොතිබුන අසරණ මිනිස්සු වෙන්න ඇති. එවකට හිටපු ප්‍රාදේශීය ලේකම් තුමා දීපු කොටසකුත් තියෙනවා ඕකෙ. ඒ නිසා සියළු කටයුතු බලල පෙත්සම් කාරක සභාවෙත් මේක තියෙනවනම් 2018 වර්ෂය අනුව ඇස්තමේන්තු හදලත් තියෙනවනම් අපට නගර සභාවට මේක පූර්වාදර්ශයක් නොවිය යුතුයි. නමුත් හදල තියෙන නිසා කඩන්නැතුව ඒ මුදල ලක්ෂ 20 ක් විතර අපිට ලැබෙනව මෙතන තව තර්කයක් මතුවුනා මේක නගර සභා සීමාවෙන් පිටට යනව කියලා ඒනිසා ඔය ප්‍රශ්න ගැටළු ඔක්කොම මැද මේකෙදි ඒ අයට මුදල් ගෙවන්න නියමිත වකවානුවක් දීල ලොකු කාලයක් දෙන්නනෙ නැතුව ඒ අයිතිය දීල ඒ අයට පවරන එක හොඳයි කියන එකයි මගේ මතය.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

සභාපතිතුමනි මේක පූර්වාදර්ශයක් නොවිය යුතුයි. ඒ හැර දැනට බලහත්කාරයෙන් ඉන් කිසි කෙනෙකුට දීමේ ප්‍රතිපත්තිය අනුගමනය නොකිරීමේ පදනමින් තමයි අපි කැමති වුනොත් කැමති වෙන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

සභාපතිතුමනි අනිත් එක පෙත්සම්කාරක සභා තීරණය කරපු එක්කෙනා ගැන සලකා බලන්න. එයාට විතරක් බලන්න. නීත්‍යානුකූල වෙන විදියට ඔබතුමා බලල කරන්න. එක්කෙනයි ඕකෙ ඉල්ලල තියෙන්නෙ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහෙමයි. තීන්දුවක් ගන්නව නම් ඒක ගන්න ඕනෙ 4 දෙනාටම සාපේක්ෂව. මත දෙකක් තියෙනවා. 4 දෙනාටම දෙනවද. ඉල්ලපු එක්කෙනාට දෙනවද කියන එක.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පන්යන්දූවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි මෙහෙමයි. මේක එක්කෙනෙක් ඉල්ලීම කරල තියෙනවා. එයා තමයි මේකට මහන්සි වෙලා තියෙන්නෙ. නමුත් මේ කට්ටි 4 ම ගෙවල් හදාගෙන පදිංචි වෙලා ඉවරයිනෙ කුමන හෝ හේතු උඩ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ කරන එක්කෙනා තමයි මේකට හුගක් මහන්සි වෙලා තියෙන්නෙ. අපි සභාවක් විදියට 4 දෙනෙක් ගෙවල් හදාගෙන ඉන්න කොට එක්කෙනෙකුට දෙනවට වඩා මේක පූර්වාදර්ශයක් නොවී හතර දෙනාට දෙන එක තමයි අපිට එන මුදල කාල සීමාවක් තුල ගෙවීමෙන් පසු ඒ අයට ඔප්පු පැවරුවනම් හොදයි කියන එකයි මම අදහස් කළේ.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

ලේකම් තුමිය මේක නිත්‍යානුකූල ගැටළුවක් නැද්ද?

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**

ඔය වගේ ගැටළුවක් මේ හල්වතුරෙත් තියෙනවා සභාපතිතුමා. අනුන්ගෙ නමට තියෙන ඉඩමෙ ගෙයක්හදල පදිංචි වෙලා. ලයිට් වතුරත් අරගෙන තියෙන්නෙ. එතුමියටත් ඔය විදියටම දෙන්න වෙයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මතක තියාගන්න මේ තීන්දුව අරගෙන තියෙන්නෙ නගර සභාව නෙමෙයි. පෙත්සම් කාරක සභාව. පෙත්සම්කාරක සභිවට ගරු කිරීම මත ගත්තාවූ තීන්දුවක් මිසක ඊට එහා දෙයක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

සභාපතිතුමනි ඔය ලක්ෂ 20 අරගෙන මොකක්ද කරන්නෙ. ගිණුමක දාල තියෙනවද? අරමුණ ඉටුකර ගන්න පුළුවන්ද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේක අපි විරුද්ධ නම් අයින් කරල දානව. පක්ෂ නම් අපි දීල දාමු. දෙකෙන් එකයි.

තීරණය

**තැලිගල කන්ද ඉඩමට අදාලව කැබලි අංක 04 සදහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති තක්සේරු වටිනාකම වන කැබලි අංක 01 සදහා රු. 675000 ක් ද , කැබලි අංක 2 සදහා රු. 300000/- ක් ද, කැබලි අංක 03 සදහා රු. 320000/- ක් ද, කැබලි අංක 04 සදහා රු. 535000/- ක් ද යන තක්සේරු වටිනාකම් 2018/12/31 දිනට පෙර අය කිරීමෙන් පසු ඉඩම් කැබලිවල දැනට පදිංචිව සිටින පවුල් සදහා එම ඉඩම් පවරා දීමටත් ඉඩම් කැබලි 4 සදහා අයකරනු ලබන මුදලින් නගර සභා බල ප්‍රදේශය තුල සුදුසු ඉඩමක් නගර සභාව වෙත ලබා ගැනීමටත් සුදුසු බව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

➢ වෙනත් කරුණු

**01.** <u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මම යෝජනා කරනවා අපි කාරක සභා අවස්ථාවෙදි සාකච්ඡා කල තානායම මාස 8 ක් ඇතුලත වැඩ ආරම්භ කිරීම සිදු කළ යුතුයි කියන යෝජනාව මම කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

ඒ යෝජනාව මම ස්ථිර කරනවා. සංශෝධනයක් සහිතව. මාස 8 ක් තුල ඉදිකිරීම් ආරම්භ කරන්නත් 2020 ජුනි මස වන විට පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන්නත්. එතනින් පස්සෙ කිසිම හේතුවක් නිසා කාලය දික්කිරීම් මුකුත් දෙන්නෙ නෑ.

<u>තීරණය</u>

තානායම් භූමියේ ඉදිකරනු ලබන නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මාස 8 ක් තුල ආරම්භ කල යුතු බවත් 2020 ජුනි මස වන විට පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු අවසන් කල යුතු බවටත් ඉන් පසුව කිසිදු හේතුවක් මත කාලය දීර්ඝ කිරීමක් සිදු නොකල යුතු බවටත් ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**02.** <u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මේ අම්බලන්ගොඩ සමිති ගැන කියන කොට මේ සමිතියක් කරපු හපන්කමක් ගැන කියන්න තියෙනවා. අම්බලන්ගොඩ බස් නැවතුම් පොලේ තියෙනව අපි නගර සභාවෙන් හදපු කඩයක්. මෙක මල් සමිතියට දුන්නා නිකන්. මල් කඩේ සමිතියේ පුද්ගලයෙක් මෙක අයිති කර ගත්තා. සභාව නැති කාලෙ නිළධාරීන්ට කියලා. මම මෙක දැනගත්තෙ ඊයෙ පෙරේදා මෙක ලක්ෂ 50 කට කළුතර පුද්ගලයෙකුට විකුණලා. එනිසා මම යෝජනාවක් ගේනවා සභාපතිතුමා මෙක නැවත පවර ගන්න. මල් වවන්නන්ගෙ සමිතියට නිකන් දිපු එක. ඕකෙ ඉදුනිලුත් හිටියා. ඊට පස්සෙ ඒකෙ සභාපති මේකෙ මාළු කඩයක් දාගෙන හිටියා. විශේෂ කොමසාරිස් පාලනය කාලෙ මෙක එයාගෙ නමට හරව ගත්තා. හරවගෙන මෙක දැන් විකුණල තියෙනවා ලක්ෂ 50 යි. අද රේස් බුකියක් දාල තියෙන්නෙ. අයිතිකාරයට ලක්ෂ 40 යි. බ්‍රෝකර් එක කරපු කෙනාට ලක්ෂ 10 යි. මේව නගර සභාවෙ දේපල. මෙක නැවත නගර සභාවට පවර ගන්න කටයුතු කරන්න.

ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්

ඒ යෝජනාව මම ස්ථිර කරනවා. අපි පහුගිය සභාවෙ ඉන්න කොට ඔය කඩේ ගැන ප්‍රශ්නෙ ආව. අපි දුන්නෙ නැහැ. පසුව විශේෂ කොමසාරිස්තුමා දීල. අපිට මේකට මුකුත් කරන්න බැරිද සභාපතිතුමා. අනිවාර්යෙන් මොකක් හරි කරන්න.

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

සභාපතිතුමනි බස් නැවතුම් පොලේ කඩ විකුණනව නම් අපි පැවරුම් කුලී ගන්නවා. මාසෙ කුලී මොනවත් නෑ මේකට.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මල් කඩයට දීපු එක රේස් බුකියක් දාන්න බැහැ. ඒ මත පවර ගන්න පුළුවන්.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පතියන්දුවගේ මහතා කතා කරමින්

අපි මන්ත්‍රීවරු සියළු දෙනාගෙ එකගත්වයෙන් ඔබතුමා ඒක පවරා ගැනීමට කටයුතු කරන්න.

ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්

කොහොමත් සභාපතිතුමනි මේක ගිවිසුමෙන් පිට. මේ ඉඩම අයිති බස් ස්ටෑන්ඩ් එකට. හැබැයි මේකෙ ප්‍රතිපාදන වෙන් කරේ කලින් හිටපු පළාත් සභා මන්ත්‍රී උපාලි සිරිසුමන මහත්තයා. ඒ මුදල් වලින් තමයි මේක ගොඩනැගුවෙ. ඒ කාලෙ ඉදපු සභාපතිතුමාගෙ උපදෙස් මත පොලිස් මුරපොල මල් වවන්නන්ගෙ සංගමයටයි දුන්නෙ. ගිවිසුමේ ඇති. විකුණන්න කිසිම අයිතියක් නැහැ. මම දන්නැහැ විකිණීමක් ද මාරු කිරීමක් ද කරේ කියලා. ඔප්පුවකින් විකුණන්න බැහැ. මේක මොකක්ද වෙලා තියෙන්නෙ කියල බලන්න.

තීරණය

බස් නැවතුම් පොළ භූමියේ ඇති  නගර සභාව විසින් මල් වවන්නන්ගේ සංගමයට ගිවිසුමක් මගින් ලබා දී ඇති කඩ කාමරය නැවත පවරා ගැනීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

03. ගරු නගර සභා මන්ත්‍රී ඊ. අයිරාංගනී ද සිල්වා මහත්මිය කතා කරමින්

සභාපතිතුමනි මම යෝජනාවක් දුන්න **20178-05-18.** ඒක අත්‍යාවශ්‍ය දෙයක්. මට ලිපියක් එවල තියෙනව ඒක **2019** වාර්ෂික අය වැය ලේඛනයට ඇතුලත් කරනව කියලා. මේ එක පාරක් තියෙනවා

**ගම් වාසීන් ඉතාමත්ම කරදර කරනවා. මීටර් 100 ක් වගේ පොඩි පාරක් ඒක වලවල් පැදිලා. හැමදාම කියනවා මේ පාර ගැන. කොඩිකාර පෙදෙස මීටර් 100 ක් විතර. පඤ්ඤාලෝක මාවත අයවැයෙන් කරත් කමක් නැහැ.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ඒ පාර කරල දෙන්නම්.

**04** <u>ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්</u>

**සභාපතිතුමනි ස්ටෑන්ඩ් එක ඉස්සරහ වැටක් ගැලෙව්වනෙ. ත්‍රීවීල් දාන තැන. එතන දැන් කුණු දාන තැනක් වෙලා. ඒවගේම කුලරත්න විදුහල ගාව පාරෙ බස් ගහනවා. මෙතන දෙමව්පියො කතා වෙනවා ළමයින්ට කරදරයක් වේවි කියලා. පහුගිය දවසක දකුණු පළාත් අධ්‍යාපන ඇමතිතුමා ආපු වෙලාවෙ අහල තියෙනවා මෙතන ඉස්කෝලයක් ද , බස් නැවතුම් පොලක් ද කියලා. පහුගිය දවසක ඔතන බස් එකක් පෙරලිලා ඇවිල් තවත් බස් දෙකක් පෙරලගෙන ඇවිත් තියෙනවා. පස්සෙ පොලිසියෙන් ඇවිල්ල බස් අස්කරා. නමුත් ආයෙත් බස් ගහනවා. මේ නිසා දෙමව්පියො සැහෙන අසීරුතාවයකට මැදිවෙලා ඉන්නෙ. ඒවගේම ආර්.ඊ. ද සිල්වා මාවතේ පැච් කරපුවගේ දැන් තාර ගැලවීගෙන යනවා. ඒව නැවත සකස් කරන්න කියලා ඉල්ලා සිටිනවා.**

**05** <u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>

**සභාපතිතුමනි අපි මීට පෙර අත්හදා බැලීම් කරා. සෝභිත මන්ත්‍රීතුමාගෙ ප්‍රදේශෙ පාරවල් කීපයක් මුහුදු වැලි යොදා කොන්ක්‍රීට් කර තිබෙනවා. එම මාර්ග වල පළුදු එකක්වත් නැහැ. ඉතාම සාර්ථකයි මුහුදු වැලි යෙදීම. එනිසා පින්නදූව තොටුපොල මාර අඩි 7 ක මාර්ගයේ පවුල් 12 ක් ඉන්නවා. ඒ අය යන්නෙ කාණුවක බැහැලා. අපි ඒ අය සමග ශ්‍රමදාන මට්ටමින් මුහුදු වැලි යොදා ගෙන සිමෙන්තු කොට්ට 20 ක් , ගල් කියුබ් 2 , 3 ක් දුන්නොත් අපිට පුළුවන් කරගන්න. ඒ සදහා ඔබතුමාගෙ අවසරය පතනවා.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
**මේ පාර අඩි 10 ට අඩු නිසා නගර සභාවෙන් බඩු සපයල ශ්‍රමදානෙන් කරන්න ඇස්තමේන්තුවක් දෙන්න.**

**06.** <u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

**සභාපතිතුමනි ලිපියක් ඇවිත් තිබෙනවා නිවසට එන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සකස් කර දෙන්න කියලා. මීට අවුරුදු 5 කට පමණ පෙරත් ඉල්ලීමක් කර බවත් දන්වල තිබෙනවා. මෙම පාර විහාරගොඩ මාවතේ ආදාහනාගාරයට උඩ අර සුද්ද කරපු කැල්ලට එහා පැත්තෙ. ඒක නවීකරණය කරල දෙන්න කියල ඉල්ලීම් කරනවා. ඒක ඉටු කර දෙන්න සභාපතිතුමා. ඒවගේම අපි ස්තුතිවන්ත වෙනවා පහුගිය**

මාසය තුල මුදල් නොමැතිව නගර සභාව ඉන්න වෙලේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලක්ෂ 80 ක මුද්දර ගාස්තු, දඩ මුදල් එවල තියෙනවා. ඒ සම්බන්ධයෙන් එතුමාට ස්තුති කරනවා මේ අවස්ථාවෙදි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ඒව අපේ සල්ලි.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>
සභාපතිතුමනි මේව දෙන ක්‍රමයක් තියෙනවනෙ. අභියෝග කරල ඕව ගන්න බැහැ. සාකච්ඡා කරල ඕව ගන්න ඕනෙ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
වෙනද මහින්ද යාපා ඇමතිතුමා ඇමති කාලෙ සාමානයෙන් මාස 3 කට සැරයක් තියෙන සල්ලි ඔක්කොම අපිට එවනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>
සභාපතිතුමනි මෙහෙමනි මේව කතා කරල ඕනෙ ගන්න. 1994 ප්‍රඥප්තියක් තියෙනවළු 5 වගන්තිය යටතේ මුද්දර ගාස්තු ඒ මුදල් ගෙවීම සම්බන්ධව. ඒකෙ තියෙන්නෙ අවු 2 ක් යන්න පෙර මේව ගන්න ඕනෙ. එහෙම නැත්තම් භාණ්ඩාගාරයට යනවළු මුදල්. ලක්ෂ කීයක් තියෙනවද එන්න සභාපතිතුමා?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ලක්ෂ 300 ගානක්.

07 <u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>
ප්‍රඥප්තියේ තියෙන්නෙ කැමති නම් කල හැක කියලා. ඒ නිසා මම කියන්නෙ අපි ඒව සාකච්ඡා කරල අරගන්න ඕනෙ. අනිත් එක පොල්වත්ත සුසාන භූමියේ ගහක් වැටිල කැඩිල තියෙනවා ප්‍රජා ශාලාව . ඒක ප්‍රයෝජනයට ගන්න බැරි නිසා ඉවත් කරන්න කියල කිව්වා. ඉදිරියේදී සංවර්ධනය කරන්න ඕනෙ නම් මේක ඉවත් කරන්න ඕනෙ. අපි ඉදිරිපත් කරල තායෙන ලිපිය අනුව ඒකෙ ඉදිරි කටයුතු කරන්න කියල තමයි ඉල්ලන්නෙ. සුසාන භූමියට ඇතුල්වෙන කොටම පේන්නෙ මේ ගරාවැටුනු ගොඩනැගිල්ල.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ගොඩනැගිල්ලක් කඩා ඉවත් කරන්න අපි කිව්වට බැහැ මන්ත්‍රීතුමා. තාක්ෂණසේවා නිලධාරී වාර්තාව ඕනෙ.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

මහ ඇමතිතුමත් කිව්ව ඒක නිර්දේශයක් දාල එවන්නත කරල දෙන්නම් කියලා. නමුත් බොහොම කණගාටුයි කියන්න අළුතින් ආපු තාක්ෂණ සේවා නිලධාරී මහත්මය කිසිම සැලකිල්ලක් නැහැ. අවධානමක් නොගෙන වැඩක් කරන්න බැහැ. අපි සහයෝගය දෙනවනේ වැඩේ කරානම්.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
මන්ත්‍රීතුමා ඒ නිලධාරියා අළුත්ම පත්වීමක්.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>
මම මහ ඇමතිතුමාටත් කිව්ව අළුත්ම අය එවන්න එපයි කියලා. මෙතන එනකොට අළුත් එක්කෙනෙක් ඉන්නවා. අනිත් අය පුහුණු වලට ගිහිල්ල. වැඩක් කර ගන්න විදියක් නැහැ. මිනිස්සු දෝෂාරෝපනය කරනවා අපිට. අනිත් එක ඕක සංවර්ධනය කරන්න මුදල් ප්‍රතිපාදන දෙන්නම් කියල තියෙනවා. ඉතින් අපි ඒ ලැබෙන මුදලින් ප්‍රයෝජනය ගන්න ඕනෙ. ආදාහනාගාරයට එන බස් එකක් හරව ගන්න විදියක් නැහැ. පාර්ක් කරන්න තැනක් නෑ. මෙතෙන්ට වැදගත් පුද්ගලයො එනවා. එක එක ප්‍රදේශවලින් පුද්ගලයො එනවා. මෙතන බලනකොට නගර සභාවෙ ප්‍රතිරූපය පේනව. අනිත් එක තමයි ආදාහනාගාරෙ එක ලයිට් එකක්වත් රෑට පත්තු වෙන්නෙ නැහැ. එතන තුන් හතර පැත්තකට යන්න පුළුවන් තැනක්.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
මුරකරුවෙක් නැතුව ඇති දාන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>
හැන්දෑවට ඒ පැත්තෙ ලයිට් දාන්න යන කෙනාට හරි ලයිට් ටික දාල යන්න කියන්න. මම ඉල්ලා සිටිනවා ඉක්මනින් මෙය කඩා ඉවත් කිරීම සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කරන්න කියලා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ටී.ඕ. මහත්තය මේකෙ නිර්දේශය නීත්‍යානුකූලව ලබා දෙන්න.

**08** <u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්</u>
සභාපති මහත්තයා මමයි නන්දන රාජපක්ෂ මන්ත්‍රීතුමයි ගිහිල් බැලුව ඔතන. මහ ඇමතිතුමා මට කිව්ව එතන සුද්ධ කරල වාර්තාවක් සභාපතිතුමාට කියල ෆැක්ස් කරන්න කියලා. රාහුල මහත්තයයි මමයි සභාපති මහත්තයට ඇවිල්ල කිව්වහම කැබ් එකේ ඇරිය ඒ නිලධාරී මහත්මයත් එක්ක. ඒ නිලධාරී මහත්තය මේක මැනගෙන් ඇවිල්ල සභාපති මහත්තය අපේ ඉස්සරහම කිව්ව මේක මට දෙන්න මම ෆැක්ස් කරන්නම් කියල මහ ඇමතිතුමාට. සත පහකට ගණන් ගත්තෙ නෑ. සභාපති මහත්තයා කියපු දේ.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මෙහෙමයි වුනේ. ඒ මහත්තය අළුත් කෙනෙක්. ඒ මහත්තය ගිහිල්ල මෙතන හිටිය එදා තක්සේරුවේ මහත්තරු. ඒ අයගෙන් ගිහින් ඇහුවා මෙහෙම දෙයක් වෙලා තියෙනවා. මම මොකද කරන්නෙ කියලා. ඒ අය දීපු පිළිතුර අනුව මේ නිලධාරියා බය වුනා.

ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්

සභාපති මහත්තය කියන දේ වත් ඒ නිලධාරියා ඇහුවෙ නැහැ. අළුත් නිලධාරීන්ට මේකෙ කරන්න බැරිනම් යන එකයි තියෙන්නෙ. වැඩක් කරන්න පුරුදු වෙන්න ඕනනෙ. බය නම් රාජ්‍ය සේවයට නැවිත් ඉන්න ඕනෙ.

ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්

අපි වගකීම ගත්තනේ මොනව හරි වුනොත්. සේවා අවශ්‍යතාවය මත නිසා කරන්න තිබුනා.

09 ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්

සම්බන්ධිකරණ රැස්වීමේදි මහ ඇමතිතුමා කිව්ව පොල්වත්ත පුරේ තව ඉඩම් කැලි 3 ක් තියෙනවනෙ. ඒ තුනත් එක්ක එවන්නයි කියල අනුමැතිය අරගෙන දෙන්න. ඒ ලියුම ඇරියද කියලා දැනගන්න කැමතියි.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

පොල්වත්තපුර සහ ටී.එච්.ඩබ්. නිවාස ව්‍යාපෘතිය ඔප්පු ලබා දෙන්න නියමිතයි. මම අදාල නිලධාරීන්ට අවශ්‍ය වැඩ කටයුතු කරන්න ඊයෙ උපදෙස් දුන්නා.

10 ගරු නගර සභා මන්ත්‍රී ඊ. අයිරාංගනී ද සිල්වා මහත්මිය කතා කරමින්

සභාපතිතුමනි මමත් මෙතන අවමංගල්‍ය අවස්ථාවකට සහභාගි වුන වෙලාවෙ එතන හිටිය අය කිව්ව මේකෙ හැටි බලන්න හරි අවලස්සනයි කියලා. මමත් පසුගිය සභාවෙදි යෝජනාවත් කරා මෙතන වාහන පාර්ක් කරන ස්ථානයක් හදන්න කියලා. ඒ නිසා මේක ඉක්මනින්ම කරන්න ඕන දෙයක් සභාපතිතුමා.

11 ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්

සභාපතිතුමනි අද ලෝක පරිසර දිනය නිසා මට අදහසක් තියෙනවා ඉදිරිපත් කරන්න. අපේ නගරය තුල කාර්මික ව්‍යාපාර, සර්විස් ස්ටේෂන් ගොඩක් තියෙනවා. ඒවාට අදාලයි පරිසර බලපත්‍ර. මම වැඩ පල කරන කොටත් එය අරගෙන තමයි කරේ. නමුත් මම දන්නව බොහෝ දෙනෙක් මේක ගන්නෙ නැතිව ඉන්නවා. විශේෂයෙන්ම ස්ර්විස් ස්ටේෂන් වල වතුර පාර යන්නෙ ප්‍රධාන ජල මාර්ග වලට. වෙනදා අපි තල්ගස්ගොඩ පොඩි පාලමේ නානව. දැන් එහෙම නාන්න බැහැ. ඒවගෙ තෙල් පිරිල. ඒනිසා මම

යෝජනා කරනවා ප්‍රදේශයේ තියෙන ව්‍යාපාර සර්විස් ස්ටේෂන් කොපමණ තියෙනවද? කීයක් බලපත්‍ර අරගෙනද , අරගෙන නැත්තෙ කවුද කියලා වාර්තාවක් ඊලග සභාවට ඉදිරිපත් කරන්න කියලා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ඒ වාර්තාව ඊලග සභාවට ඉදිරිපත් කරන්න.

12 <u>ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී. රුවිනි පේෂලා මහත්මිය කතා කරමින්</u>
සභාපතිතුමනි පටබැදිමුල්ලෙ පොදු ළිද බැහැල තියෙන්නෙ. ඒක බලන්න ඕනෙ. අනිත් එක මාර්කට් එක ලග ඉදල එන පාර හදන්න වෙලා තියෙන්නෙ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ඒ පාර හදල තියෙන්නෙ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී. රුවිනි පේෂලා මහත්මිය කතා කරමින්</u>
සභාපතිතුමනි ආදාහනාගාරෙ ගේට්ටුව සකස් කරන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ටී.ඕ. මහත්තය ආදාහනාගාරෙ ගේට්ටුවයි තාප්පෙ හුණු ගාන්නයි අපේ කට්ටිය දාල ගාන්න ඇස්තමේන්තුවක් දෙන්න.

13 <u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>
සභාපතිතුමනි අම්බලන්ගොඩ ටියුෂන් පන්ති ගොඩක් තියෙනවා. ඒගොල්ලො ගොඩාක් ආදායම් උපයනවා. අපි මේ පොඩි කඩේටත් කඩ බද්ද ගන්නවා. අපි මෙකට ක්‍රමවේදයක් කරන්න ඕනෙ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ටී.ඕ. මහත්තය මේ අයගෙන් මොනවහරි අය කර ගන්න ක්‍රමයක් තියෙනවද?

14 <u>ගරු නගර සභා මන්ත්‍රී එම්. අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>
සභාපතිතුමනි සෞඛ්‍ය අංශයේ සේවිකාවන් අදහසක් ඉදිරිපත් කරා ඒගොල්ලන්ගෙ උදලු තල මොට වෙලා. ඒව ලබා දෙන්න කියලා. ලොකු ගස් කපන්න පිහි ලබා දෙන්න කියල ඉල්ලා සිටිනවා.

15 <u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

සභාපතිතුමනි මේ සේවකයන් ස්ථාන මාරු කිරීම් කරන කොට හොයල බලල කරන්න. දේශපාලනය පදනම් කරගෙන කරන්න එපා.

16 <u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. අයිරාංගනී ද සිල්වා මහත්මිය කතා කරමින්</u>

සභාපතිතුමනි මම එදත් කිව්ව ඕකන්දෙ පස් කන්දක් දාල තියෙනවා කියලා. අද වෙනකොට අනිත් පැත්තෙත් පස් කන්දක් දාල. දැන් යන්න පාරක් නැහැ. මේක මහ ප්‍රශ්නයක් වෙනවා. විශේෂයෙන් ඕකන්දෙ ලොකු පාරවල් තියෙන තැනක් නෙමෙයි. මෙහා පැත්තෙනුත් ගස් කපල දාල. මේ සම්බන්ධව නම් ක්‍රියා කරන්න වෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ටී.ඕ. මහත්තය ඔය කියන පස් කඳු ටික අයින් කරල දාන්න.

17 <u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි පොල්වත්තෙ පිට්ටනිය ඉදිරිපිට පොඩි ඉඩම් තීරු දෙකක් තියෙනවා. ගියවර සභා කාලෙදි මේක මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මැනල සැලැස්මක් ගත්තා. එතකොට ඒගොල්ලො ප්ලෑන් එකක් ඇදලා දුන්නා. ඔය ප්ලෑන් එක මම දැන් දෙපාරක් තුන් පාරක් ඉල්ලුවා. මේ වෙනකම් ලැබුනෙ නැහැ. මට දැනගන්න ඕනෙ මේ ෆයිල් එක නගර සභාවෙ තියෙනවද නැතිනම් අස්ථානගත වෙලාද කියලා. එනිසා මට ඒක කරුණා කරල හොයල දෙන්න කියල ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්රදීප් මහතා කතා කරමින්</u>

ලේකම් මිස් මේක හොයල දෙන්න.

18 <u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි නුගේතුඩුව පාරෙ, පාර මැද්දෙ විශාල අඹ ගහක් තියෙනවා. ඒක ඉවත් කරල දුන්නොත් ජනතාවට පහසුවක් වෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒක කපල දාන්නම්.

19 <u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි හිරේවත්තෙ පුස්තකාලෙ ලග ළිද ලග සුනාමි කාලෙ ඉදන් පස් දාල පිරවිලා තියෙන්නෙ ඉඩම. මම ඉල්ලා සිටිනවා එය සුද්ද කර දෙන ලෙස.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
**ටී.ඕ. මහත්තය පුස්තකාලෙ ළිද ලග සුද්ධ කරන්න.**

**20** **ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**
**ගොඩනැගිලි අනුමත කරන කොට පොඩ්ඩක් බලන්න කියන්න. මම දැක්කා පඤ්ඤාලෝක මාවත හැරෙන තැන ගොඩනැගිල්ල අනුමත කරලද දන්නැහැ කරන්නෙ. සරත් මන්ත්‍රීතුමා ඔබතුමාලගේ ගෙදරට හැරෙන තැන වංගුවේ.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
**සොයල බලල ඕන උත්තරයක් දෙන්න.**

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්**
**සභාපතිතුමනි ඕකට අදාල අපේ නන්දන මන්ත්‍රීතුමා දැන් මෙතන නැහැ. එතනින් එහාට මම කතා කරන්න කැමති නැහැ. මගේ නිවස ඉදිරිපිට තමයි එතුමා ඉන්නෙ.**

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**
**නීත්‍යානුකූලව කරල නම් ප්‍රශ්නයක් නැහැ.**

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**
**සභාපතිතුමනිඅපි අර පෝරුක් ඇල සුද්ධ කිරීම සදහා 12 ලක්ෂ ගානක් ගෙවන්න අනුමැතිය දීල තියෙනවා. මේක අයිති වාරිමාර්ගෙට. අපිට ඒක ගෙවන්න පුළුවන්ද?**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
**ලේකම්තුමිය මේව ලියද්දි හරියට ලියන්න. නැත්තම් ප්‍රශ්නයක්.**

**ප.ව' 3.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී**

| | |
|---|---|
| බී. ඒ. ධම්මිකා, | අරුණ ප්‍රදීප් මණිමෙල් වඩු, |
| ලේකම්, | සභාපති, |
| අම්බලන්ගොඩ නගර සභාව. | අම්බලන්ගොඩ නගර සභාව. |

**2018 -06 - 23** වන දින,

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.